ශ්‍රී ලංකාවේ පළවන ඉපැරැණීම සිංහල පුවත්පත




අපේ අනාගත පරපුර වන දරුවන්ගේ වර්තමාන ශෝකාන්තය ජයගන්නට මෙදා ළමා දිනය යොදාගත හැකි නම්...

**දරුවන් බේරාගනිමු**

3 පිටුව



**ක්‍රියාකාරී ඇදහිල්ල තුළින් නව ජීවනයක් අත්දකිමු**

අද ජාතික මට්ටමින් සැමරෙන ධර්මෝපදේශ ඉරුදින නිමිත්තෙන් ප්‍රදීපයෙන් පිදෙන සාර තිළිණය

8 පිටුව




කොළඹ අගරදගුරු හිමිපාණන්ගේ විශේෂ චක්‍ර ලේඛනය

**විශ්වාසයේ වසර චක්‍ර ලේඛනය**

12 පිටුව




2010 වසරේ හොඳම ආගමික පුවත්පත

# ඥානාර්ථ ප්‍රදීපය

ආරම්භය : 1866 ජුනි 07



"ඔබේ වැටීමට හේතුව ඔබේ පාදය නම් එය කපා දමන්න. දෙපා ඇතිව අපායට හෙළනු ලැබීමට වඩා කොර ව ජීවනයට ඇතුළුවීම ඔබට යහපත "

ක්‍රි.ව. 2012 ක් වූ සැප්තැම්බර් 30 ඉරිදා 147 වෙළුම 18 කලබ සතිපතා පත්‍රය - පිටු 24 - මිල රු. 25.00 QD/12/NEWS/2012 පුවත්පතක් ලෙස ලියාපදිංචි කරන ලදි.

## විශ්වාසයේ අලංකාරය අලුතින් සොයා ගන්නා ගමනකට ආරාධනා!

### විශ්වාසයේ වසර නිමිත්තෙන් චක්‍ර ලේඛනයක් නිකුත් කරමින් අගරදගුරු හිමිපාණෝ ප්‍රකාශ කරති.



**විශ්වාසයේ වසර ආරම්භ කිරීමත් සමඟ අගරදගුරු පදවි සංඝයේ පූජක, පැවදි සහ ගිහි සැදැහැවතුන් විශේෂ ගමනක් ආරම්භ කිරීම අවශ්‍ය ය. එය විශ්වාසයේ අලංකාරය අලුතින් සොයාගන්නා ගමනකි. දැඩි ලෞකික වාදය සහ ඇතැම් කිතුනු මූලධර්මවාදී කණ්ඩායම්වල ප්‍රබල ක්‍රියාකාරකම් නිසා ඇතැම් සැදැහැවතුනගේ විශ්වාසයට තර්ජන ඇති වී ඇති සමයක කතෝලික සැදැහැවතුන් අතර විශ්වාසයේ සැබෑ අලුත්වීමක් ඇතිකිරීම පිණිස තමන් සතු සම්පත්, දැනුම, විශේෂඥතාව සහ තම හැකියාව එකට ගොනු කරන්නැයි කොළඹ අගරදගුරු අති උතුම් මැල්කම් කාදිනල් රංජිත් හිමිපාණෝ ප්‍රකාශ කරති.**

විශ්වාසයේ වසර නිමිත්තෙන් ඉදිරිපත් කරනු ලබන ජනවන්දනා චක්‍රලේඛන 06 නිකුත් කරමින් උන්වහන්සේ මේ බැව් අවධාරණය කරති. (සම්පූර්ණ චක්‍ර ලේඛනය සඳහා 12 - 13 පිටු බලන්න)

## සිරිලක දොළොස්වන රදගුරු වසමේ ප්‍රථම එඬේරාණන් පදවි ප්‍රාප්ත ගන්වයි

ගරු නිරෝෂන් ශ්‍රී කාන්ත පියතුමන් විසිනි

මඩකලපුව නව රදගුරු වසමක් බවට පත් කිරීම හා එහි ප්‍රථම රදගුරු අති උතුම් පොන්නයියා ජෝශප් හිමිපාණන්ගේ පදවි ප්‍රාප්තිය, මඩකලපුව සාන්ත මරියා සම ආසන දෙව්මැඳුර, මඩකලපුව රදගුරු වසමේ නිල ආසන දෙව්මැඳුර වශයෙන් ස්ථාපිත කිරීම පසුගිය ඉරුදින ඉතාමත් ගාම්භීරව සිදුකෙරිණි.

15 පිටුවට ▶



මඩකලපුව නව රදගුරු වසම හා එහි ප්‍රථම රදගුරු පදවි ප්‍රාප්ත කිරීමේ නිල උත්සවය ඉකුත් ඉරිදා මඩකලපුව සාන්ත මරියා ආසන දෙව්මැඳුරේදී සිදුකෙරිණි. එම අවස්ථාව සඳහා ශ්‍රී ලංකාවේ අපෝස්තලික තානාපති අති උතුම් ජෝශප් ස්පිටෙරි, මඩකලපුව නව රදගුරු අති උතුම් පොන්නයියා ජෝශප් සහ ත්‍රිකුණාමලය රදගුරු අති උතුම් කිංස්ලි ස්වාමිපිල්ලේ හිමිපාණන් පෙරහරින් කැඳවාගෙන ගිය අයුරු

## දිව්‍ය සත්ප්‍රසාද කරඬුව හස්තිරාජයා පිටින් වැඩම කැරේ

මෙලාන් තිලංග රැදිගො සහ ජී. බී. එච්. ලිවේරා විසිනි

සීදුව මීසමේ වාර්ෂික දිව්‍ය සත්ප්‍රසාද මංගල උළෙල ඉකුත් දා පැවැත්විණි.



ඉතා අලංකාර ඇඳුම් ආයිත්තමින් සැරසූ හස්ති රාජයකුගේ පිටමත හිඳ ඒ මත වඩමවාගත් ජීවමාන දිව්‍ය සත්ප්‍රසාදීය දෙව් සමිඳුන්ගේ කරඬුව රැගෙන දේශීය සංස්කෘතිමය අංගයන්ගෙන් හෙබි දර්ශනීය පෙරහර බංඩාරවත්ත අකම්පාල දෙව් මවුන්ගේ දෙව්මැඳුර දක්වා ගමන් ගති. මීසම් සේවක ගරු ඇන්ටන් ප්‍රේමලාල්, සහයක ගරු ප්‍රසන්න ප්‍රනාන්දු පියතුමන්ගේ මෙහෙය වීම මත මීසම් සංසය විසින් උලෙළ සංවිධානය කරන ලදි.

## විශ්වාසයේ වසර ප්‍රකාශයට පත් කිරීම ඔක්තෝබර් 07 දා

අති උත්තම සොළොස්වන බෙනඩික්ට් ශුද්ධෝත්තම පියතුමන්ගේ ඉල්ලීම අනුව යමින් කොළඹ අගරදගුරු වසමේ විශ්වාසයේ වසර 2012 ඔක්තෝබර් 11 දා අරඹා 2013 නොවැම්බර් 24 දිනට යෙදෙන ක්‍රිස්තු රජාණන්ගේ මංගල්‍ය දින දක්වා පැවැත්වීමට යයි.

කොළඹ අගරදගුරු වසම තුළ විශ්වාසයේ වසර සමාරම්භක මෙහෙය ඔක්. 07 ඉරිදා ප.ව. 6.00 ට කොටහේන සා. ලූසියා ආසන දෙව්මැඳුරේ දී පැවැත්වේ. විශ්වාසයේ වසර ගාම්භීර ලෙස ප්‍රකාශයට පත් කිරීම මෙහිදී සිදුකැරෙන අතර කොළඹ නගරයේ දිසා තුනේ හා කෝට්ටේ දිසාවේ මීසම්වල පූජක, පැවදි, ගිහි සැදැහැවතුන් ඊට සහභාගි වීමට නියමිතය. කොළඹ නගරයේ හා කෝට්ටේ දිසාවන්හි මීසම්වල එදින උදෑසන හෝ එම සතියේ වෙනත් දිනක දිව්‍ය පූජාවකදී විශ්වාසයේ වසර ප්‍රකාශයට පත් කරන ලෙසත්, සෙසු මීසම් වල ප්‍රධාන දේවස්ථානයේ ඔක්තෝබර් 07 දින විශේෂ දේව වන්දනා මෙහෙයක දී විශ්වාසයේ වසර ගාම්භීර ලෙස ප්‍රකාශයට පත් කරන ලෙසත් උපදෙස් දී තිබේ.

## වතු කම්කරුවනට උප්පැන්න සහතික ලබා දීමට දකුණේ කතෝලිකයෝ පෙරමුණ ගනිති

**දකුණු පළාතේ වතු කම්කරුවන් 137 දෙනකුට උප්පැන්න සහතික ලබා දීමට කොඩ්සෙප් ආයතනය මඟින් ඉකුත් දා පියවර ගෙන තිබිණ.**

දශක හතර සිට හය දක්වා කාලයක් මුළුල්ලේ සිය උපත් රජයේ කාර්යාලවල ලියාපදිංචි නොකිරීම හේතුවෙන් උප්පැන්න සහතික අහිමිව වතුකරයේ සේවය කරමින් සිටි වතු කම්කරුවන් සඳහා රජයේ නිලධාරින්ගේ ද ආධාර ඇතිව උප්පැන්න සහතික ලබාදීමේ වැඩපිළිවෙලක් කතෝලික සභාව මඟින් සංවිධානය කර තිබිණ. දෙනියාය සහ ඒ අවට විසූ සිය ගණනක් වූ මේ දමිළ වතු කම්කරුවන්ගේ ගැටලුව දශක ගණනාවක් පුරා පැවැති අතර උප්පැන්න සහතික අහිමි වීම නිසා ඔවුනට සේවක අර්ථසාධක අරමුදල් සහ සේවක භාරකාර අරමුදල් ලබා ගැනීමට නොහැකි තත්ත්වයක් උද්ගත වීමෙන් දැඩි දුෂ්කරතාවලට මුහුණ දී සිටියහ.

කොඩ්සෙප් අධ්‍යක්ෂ ගරු මයිකල් රාජේන්ද්‍රම් පියතුමා සිය කාර්ය මණ්ඩලය මීට යොමුකර වතු කළමනාකාරිත්වය, ප්‍රාදේශීය ලේකම්වරුන් හා නිළධාරින් උප්පැන්න ලියාපදිංචි කරන නිළධාරින් හවුල් කරගෙන ජංගම සේවාවන් තුනක් පවත්වා පන්සියයකට අධික අයදුම්කරුවන් පිරිසකට සම්මුඛ පරීක්ෂණ පවත්වා තිබිණ. දරුවන් පාසල්වලට ඇතුළත් කිරීමේදී ද විවිධ ගැටලුවලට මුහුණ පාන්නට සිදුවී ඇති අතර මුල් වටයේ 137 දෙනකුට සහන ලබා දීමට සමත් වී තිබේ.

### ශුද්ධෝත්තම පිය "නාසරෙතයේ ජේසුස් - 3 ලබන නත්තලේ

අති උත්තම සොළොස්වන බෙනඩික් ශුද්ධෝත්තම පියතුමන්ගේ "නාසරතයේ ජේසුස්" ග්‍රන්ථයේ තෙවන කාණ්ඩය ලබන නත්තලට එළිදකී. ජේසුස් ක්‍රිස්තුන් වහන්සේගේ ළමා කාලය පාදක කරගෙන රචනා කළ මේ කෘතිය ඉතාලියේ ගිහි ප්‍රකාශකයකු වන රිසොලිට ප්‍රකාශනය සඳහා ලබා දී තිබේ. රිසොලි ප්‍රකාශන සමාගම වතිකාන ප්‍රකාශන මන්දිරය හා එක්ව සම ප්‍රකාශනයක් ලෙස එය එළි දැක්වීමට නියමිතය. ශුද්ධෝත්තම පියතුමාගේ "නාසරෙතයේ ජේසුස්" ග්‍රන්ථ මාලාව ප්‍රකාශන ලොවේ නව වාර්තා පිහිටුවමින් වැඩිම අලෙවියක් වාර්තා කර ඇත.

### අගරදගුරු පදවි පූජක හමුව

කොළඹ අගරදගුරු වසමේ පූජක රැස්වීම ඔක්තෝබර් 22 හා 23 යන දිනයන්හි බොරැල්ල ජුසේ වාස් මධ්‍යස්ථානයේ සිවුවන මහලේ පිහිටි දේව ධර්ම නිකේතන ශ්‍රවණාගාරයේ දී පැවැත්වේ. මේ දෙදිනේම රැස්වීම පෙ.ව. 9.30 ට ආරම්භ වීමට නියමිතය.

### කිතුනු සාහිත්‍ය උළෙල ඔක්තෝබර් 05 දා

ජාතික කිතුනු සාහිත්‍ය උලෙළ ඔක්තෝබර් 05 සිකුරාදා ප.ව. 2.30 ට ශ්‍රී ලංකා පදනම් ආයතනයේ දී පැවැත්වේ. බුද්ධශාසන හා ආගමික කටයුතු අමාත්‍යාංශයේ ක්‍රිස්තියානි ආගමික කටයුතු දෙපාර්තමේන්තුව තෙවන වරටත් සංවිධානය කරන මෙවර උලෙළේ දී ගරු සමන් මැක්සිමස් පියතුමා සංගීතවත් කළ ඉපැරැණි ගීතිකා සංගත තැටියක් නිකුත්වන බැව් අමාත්‍යාංශ මාධ්‍ය ඒකකය වෙනුවෙන් ආගමික කටයුතු අමාත්‍යාංශයේ සම්බන්ධීකරණ නිලධාරී බර්ට්‍රම් එස්. ප්‍රනාන්දු මහතා ප්‍රදීපයට පැවසීය.

### නාගොඩ සුරදූතික ස්වර්ණ ජයන්තිය

කළුතර, නාගොඩ සුරදූතික කන්‍යාරාමය අරඹා වසර 50 ක් සපිරීමේ ස්වර්ණ ජයන්තිය නිමිත්තෙන් ඔක්තෝබර් 06 දින පෙ.ව. 10.00 තුති පිදීමේ දේව මෙහෙය රත්නපුර රදගුරු අති උතුම් ක්ලීටස් චන්ද්‍රසිරි (සා.බෙ.නි.) හිමිපාණන්ගේ ප්‍රධානත්වයෙන් කන්‍යාරාම ශාලාවේදී පැවැත්වේ.

**"ඔබ වස්තු ගොඩගසා ඇත්තේ නිම වේගෙන යන යුගයක ය." (ජාකොබ් 5:3)**

පදවියෙන් පදවියට



## සන්තෝෂා පදනමෙන් දුන්ගාල්පිටියට ප්‍රජා ශාලාවක්

ඕලන්ද ශ්‍රී ලංකා දයා සේවය අනුග්‍රහයෙන් මීගමුව - දුන්ගාල්පිටියේ පවත්වාගෙන යන 'සන්තෝෂා' පදනම මගින් පමුණුගම අඩදූවේ අඩු ආදායම් ලාභී පවුල්, පුද්ගලයන් හා ආබාධිත දරුවන්, ධීවර ජනතාවට පරිත්‍යාග කරන ලද අංගසම්පූර්ණ ප්‍රජාශාලාව පසුගියදා 'සන්තෝෂා' පදනමේ නිර්මාතෘ නැසීගිය 'වින් වැන්ඩකර් බික්' අනුස්මරණ ශාලාව නමින් විවෘත විය. විවෘත කිරීමේ මහෝත්සවයට සහභාගි වූ පදනමේ ඕලන්ද අධ්‍යක්ෂ පීටර් මාකමාක හා ජැකලීන් යන දෙදෙනා හා පදනමේ ශ්‍රී ලංකා ලේකම් ගරු ග්ලෝරියා පැවදි සොයුරිය පහන් දල්වන අයුරු මෙහි දැක්වේ. මෙම මහෝත්සවය 'සන්තෝෂා' පදනමේ ශ්‍රී ලංකා කළමණාකාර ඩී. ඩී. ගයාන් සුරංග මහතා ප්‍රමුඛ කාර්ය මණ්ඩලය විසින් සංවිධානය කරන ලදි.

ජෝ. සංගපාලආරච්චි

# මනුස්ස වටිනාකම් තේරුම් ගෙන හොඳ හිත පාන්න

**අන් අයට ආදර්ශයක් වන සැටියට ඔබගේ සේවාව ඉටුකරන්න. විශේෂයෙන් මීසම් සේවක පියතුමන් සමඟ සහයෝගයෙන් වැඩ කරන්න. මනුෂ්‍යයාගේ වටිනාකම් තේරුම්ගන්න. ඔවුන්ගේ ආත්ම ගෞරවය රැකගන්න උදව්වක් ඉල්ලාගෙන ළඟට එද්දී කිසිවිට ඔවුන් පාගා නොදමා හැකිතාක් ඒ අයට හොඳ හිත පාන්න. ඔවුනට සවන් දෙන්න. එය ඔබේ නියම සහෝදරත්වය හා දයා සේවාව යැයි වින්සෙන්තිද පාවුලා ජාතික අධ්‍යක්ෂ ගරු ලියෝ පෙරේරා පියතුමා පිටකොටුව 6 වැනි පාවුලු මධ්‍යස්ථානයේ පැවති අගරදගුරු පදවි මධ්‍යම මණ්ඩලයේ වින්සෙන්තියාන වාර්ෂික රැස්වීමේදී පැවසීය.**



අගරදගුරු පදවි වින්සෙන්තිද පාවුලා අධ්‍යක්ෂ ගරු රොහාන් ද අල්විස් පියතුමා අදහස් දක්වමින් උතුරු දකුණු සම්බන්ධතාවය තුළින් වේදනාව නැතිකර සිනහව දැකීමේ බලාපොරොත්තුවෙන් අපගේ සේවාව ව්‍යාප්ත විය යුතු බවත්, සිනහ නැති මුහුණුවලට සිනහව ඇතිකර ඒ ජීවිත ලස්සන කරමු යැයි ප්‍රකාශ කළේය.

නව නිලධාරි මණ්ඩලයක්ද එදින පත්වූ අතර සභාපතිනි විශාකා වැලිවිට, ලේකම් මුතුකුඩ ආරච්චි, භාණ්ඩාගාරික බැසිල් පෙරේරා ද පත්විය.

ඇග්නස් සියඹලාපිටිය

## දහම් ගුරුවරිය ආධාර පතයි



නාවලපිටිය මීසමේ දහම්ගුරු ප්‍රින්සි ශාමනි සොයුරියගේ වකුගඩු දෙකම අක්‍රිය වී ඇති හෙයින් ඇගේ ජීවිතය රැකගැනීමට නම් හැකිවිගස වකුග ඩුවක් බද්ධ කළයුතු බව වෛද්‍ය මතයයි. ඇයට ගැලපෙන්නේ $B^+$ වර්ගයේ වකුගඩුවකි. ඇයට උදව් කිරීමට කැමති අය වෙතොත් පහත සඳහන් දුරකථන අංකයට අමතන්න. - 0774009911

## කැළණිය සත්ප්‍රසාද මංගල්‍යය

කැළණිය මීසමේ වාර්ෂික දිව්‍ය සත්ප්‍රසාදීය මංගල්‍යය පසුගියදා පෑලියගොඩ සා. මරියා දේවස්ථානයේ දී ජාඇල කලාපීය නාහිමි අතිගරු ශානක කුමාර වැලිවිට පියතුමන්ගේ ප්‍රධානත්වයෙන් පවත්වන ලදි.

මීසම් සේවක ගරු ගිහාන් රිඩ්ලි පෙරේරා පියතුමාගේ මඟපෙන්වීම යටතේ මෙම මංගල්‍යය සංවිධානය කරන ලදි.

ක්ලැරන්ස් ලෙනාඩ්





හලාවත පදවියේ පළමුවන රදගුරු අතිඋතුම් එඩ්මන් පීරිස් හා දෙවන රදගුරු අතිඋතුම් ෆ්‍රෑන්ක් මාකස් හිමිපාණන්ගේ ගුණ සමරු උලෙළක් හලාවත රදගුරු අතිඋතුම් දෙව්ශ්‍රිත වැලන්ස් මෙන්ඩිස් හිමිපාණන්ගේ ප්‍රධානත්වයෙන් හලාවත ආසන දෙව් මැඳුරේදී පැවැත්විණි. එහිදී සග සැපත් හිමිපාණන් දෙපලගේ ශ්‍රී දේහයන් තැන්පත් කර ඇති සොහොන් ගැබ්මත මල් කලඹ තබා උපහාර පිදීය. සගසැපත් අතිඋතුම් ෆ්‍රෑන්ක් මාකස් හිමිපාණන්ගේ "මෙනෙහි කරමු ඉරුදින දේව පණිවුඩය සී" කොටස එළි දැක්වීමද මෙහිදී සිදුකළ අතර ගරු ඩී. එෆ්. මැදගොඩ පියතුමා රදගුරු හිමිපාණන්ට ප්‍රථම පිටපත පිළිගැන්වීය. එම අවස්ථාවට හලාවත හිටපු අනුනායක ගරු පැට්රික් විජේසිංහ, වත්මන් අනුනායක අතිගරු පීටර් චාර්ල්ස් හලාවත මීසම් සේවක ගරු රොන්කල්ලිද සිල්වා ඇතුළු ගරු පියතුමන් හා පැවදි සොයුරියන් රැසක් සහභාගි වූහ.

පර්සි ප්‍රනාන්දු

## බදුල්ල දිව්‍ය සත්ප්‍රසාද මංගල්‍යය

උෟවේ සහෝදරත්වය ගොඩනගන්න මිය යන තුරා ක්‍රිස්තුස්වහන්සේ මෙන් සීමා බන්ධන නැතිව ආදරය කරමු. අපගේ පවුල්වල ආදරයේ අනුරුව වන්නේ දූ දරුවන්ය. නමුත් අපි කෙසේද ආදරය දකින්නේ, උපදින්න පෙරම දරුවන් නැතිකර ගනිමින්, මා ඔබලාට විශේෂයෙන් දෙමාපියන්ට මේ කතා කරන්නේ. මා නිවෙස් බැහැදැකීමට ගිය අවස්ථාවක දරුවන් දෙදෙනා පමණයි නිවසේ. දරුවන්ගෙන් කෝ පුතේ අම්මයි තාත්තයි කියා ඇසුවිට ඔවුන් පැවසුවේ දෙන්නාම ජිම් එකට ගිය බවයි. දෙමාපියන් ජිම් එකේ, දරුවන් අයාලේ යන එක වලක්වන්නේ කෙසේද? ගෙදර දෙවියන් ඔබලා කියා ආදර්ශයට ගන්නේ කෙසේද? 'ගජමුතු මිණිමුතුවලට වඩා වටින්නේ ආදරය ප්‍රේමය පිරි එකමුතුකමයි.' බදුල්ල පදවියේ ජනසංනිවේදන අධ්‍යක්ෂ ගරු නීල් ප්‍රසන්න පියනම බදුල්ල දිව්‍ය සත්ප්‍රසාද මංගල්ලයේදී පැවසීය. බදුල්ල සේනානායක පිටියේ එය පැවැත්විණ.

ශ්‍රීකාන්ති ගුණවර්ධන

# පැවදිවරය සහයක රදගුරු හිමි ඇගයීමට

"දේව වචනය තුළ ජීවත්වීමෙන් අපට ස්වාමින් වහන්සේගේ ප්‍රඥාව උදා වනවා. ප්‍රඥාව ඇතිව ජීවත්වන කිතුනුවන් හැමවිටම සමාජයට වැඩදායක හා ආදර්ශවත් පිරිසක් වීම සුබවාදියි. සමාජයට යහපත උදාකරන්නට කැප වී සිටින පූජක පැවදි පිරිස් සමග එක්ව මේ සුබවාදි ගමන යාමට කිතුනුවන්ද එකමුතුව කටයුතු කළ යුතු" යැයි දොමිනිකාන නිකායික පැවදි සොහොයුරියන් හතර දෙනෙකුගේ ජයන්ති සැමරුම් දේව මෙහෙයේදී අගරදගුරු පදවි සහයක රදගුරු අතිඋතුම් මැක්ස්වල් සිල්වා හිමිපාණෝ ප්‍රකාශ කළහ.

පැවදිවරයේ ස්වර්ණ ජයන්තිය සැමරූ ගරු පොලින් පෙරේරා සහ ගරු දොමිනික් තිරුචිල්වම් සොහොයුරියන් සහ රජත ජයන්තිය සැමරූ ගරු ෆ්ලොරිඩා පෙරේරා සහ ගරු රීටා රාජවන්නි සොහොයුරියන්ගේ සේවාවට තුති පිදීම වෙනුවෙන් මෙම දේව මෙහෙය පන්නිපිටිය ක්‍රිස්තු රජාණන්ගේ දෙව්මැඳුරේදී පැවැත්විණි.

ජයන්තිය සමරන දොමිනිකාන සොහොයුරියන් හතරදෙනා දේව ඥානය හා ප්‍රඥාව සමඟින් මීසම් සේවාව හා අධ්‍යාපනය වෙනුවෙන් ඉටුකරන්නා වූ සේවාව රදගුරු හිමිපාණන්ගේ ඇගයීමට ලක් විය. ගරු පියවරුන්, පැවදි සොයුරියන්, මීසම් වාසින් ඇතුළු විශාල පිරිසක් හවුල් වූ මෙම අවස්ථාවට පිලිපීනයේ දොමිනිකාන නිකායික ප්‍රධාන මව්තුමිය නියෝජනය කරමින් ගරු සිසිලියා සොයුරියද සහභාගි වූවාය.

ක්‍රිස්ටෝපර් රණසිංහ



කල්පිටිය මීසමේ කුඩාව දෙව්මැඳුරට අයත් දිව්‍ය හෘදය සාමාජික සාමාජිකාවෝ නවක පළඳනා ලැබීමෙන් පසු පදවි අධ්‍යක්ෂ ගරු සාර්ටෝ නෝනිස් පියතුමා සහ මීසම් සහයක ගරු සුරංග පියතුමා සමඟ ඡායාරූපයකට පෙනී සිටි අයුරු. එලිසබෙත් ඇන්





බෙලිහුල්ඔය මිසම් සේවක ගරු ටෙන්සිත් හෙන්රි පෙරේරා පියතුමාගේ පූජක දිවියේ රජත ජයන්තිය නිමිත්තෙන් විශේෂ දේව මෙහෙයක් පසුගියදා සාන්ත මරියා දෙව් මැඳුරේදී පවත්වනු ලැබිණි. එම දේව මෙහෙයේදී රත්නපුර රදගුරු අතිඋතුම් ක්ලීටස් චන්ද්‍රසිරි පෙරේරා හිමි අනුශාසනය කරන අයුරු. පූජකවරයේ රජත ජයන්තිය සමරණ ගරු ලයනල් ප්‍රනාන්දු, ගරු ටෙන්සිත් හෙන්රි පෙරේරා සහ මිල්ටන් වික්‍රමසිංහ යන පියතුමන් පසෙක සි ටී. ඡායා - ජේ. ඇන්තනි

## බණ්ඩිරිප්පුව ජපමාල මංගල්‍යයට දුම්රිය සේවා

**බණ්ඩිරිප්පුව ශුද්ධ වූ ජපමාල දේවමාතා දේවස්ථානයේ වාර්ෂික මංගල්‍යය නිමිත්තෙන් බැතිමතුන්ගේ ගමන් පහසුව සඳහා ඔක්තෝබර් 06, 07 සහ 08 යන දිනවල දේවස්ථානය ඉදිරිපිට දුම්රිය නැවත්වීමට කටයුතු යොදා ඇත.**

**දේවස්ථානය ඉදිරිපිට නවත්වන දුම්රියයන් ඔක්තෝබර් 6 සහ 7**

ඉහළ දුම්රියන්

පිටත්වීම

කොළඹකොටුව පෙ.ව. 04.00-05.57, 05.40-07.38, පෙ.ව. 07.40-09.51, 09.30-පෙ.ව. 11.20, ප.ව. 13.10-14.56, 14.30-06.07, 15.40-17.25, 17.15-18.45, 18.05-19.55, 20.20-22.06

පහළ දුම්රියන්

හලාවත පෙ.ව. 03.50-04.39, 04.20-05.09, පුත්තලම පෙ.ව. 04.30-06.42, හලාවත පෙ.ව. 04.50-05.40, 06.15-07.03, 09.10-09.59, පුත්තලම පෙ.ව. 09.55-ප.ව.12.15, හලාවත 12.40-13.29, මාදම්පේ 16.00-16.39, පුත්තලම 16.45-18.52, හලාවත 17.10-18.07,

2012.10.08 ඉහළ දුම්රියන්

කොළඹ කොටුව පෙ.ව. 04.00-05.57, 05.40-07.38, 07.40-09.51

පහළ දුම්රියන්

හලාවත පෙ.ව. 03.50-04.39, 04.20-05.09, 04.50-05.40



පසුගියදා තල්විල මීසමට අයත් තල්විල වැල්ල සාන්ත අන්තෝනි දේවස්ථානයේ සංවර්ධන කටයුතු සඳහා 'කිතුනු මඟට සවියක්' වැඩසටහන යටතේ එක්සත් ජාතික පක්ෂයේ නියෝජ්‍ය නායක සජිත් ප්‍රේමදාස මහතා මීසම් සේවක ගරු නෙවිල් සෙබස්තියන් ප්‍රනාන්දු පියතුමාට රු. 50,000/= ක චෙක් පත ලබාදුන් අවස්ථාව.

ශ්‍රියාංගණී ෆිලිෂියා

## කටුකුරුන්දේ මරිමවු උලෙළ

මොරටුව කටුකුරුන්ද සා. මරියා දේවස්ථානයේ 'වාර්ෂික මංගල්‍යය පසුගියදා පැවැත්විණි.

සන්ධ්‍යා මෙහෙය හලාවත පදවියේ අධ්‍යාපන අධ්‍යක්ෂ මීසම් පුත් ගරු ඩිලාන් ප්‍රනාන්දු පියතුමාගේ ප්‍රධානත්වයෙන් ද, මංගල මෙහෙය ධර්මදූත ළමා සමාජයේ දකුණු කොළඹ කලාප අධ්‍යක්ෂ ගරු ප්‍රෙඩි ශාන්ති කුමාර පියතුමාගේ ප්‍රධානත්වයෙන් ද පැවැත්විණි. මීසම් සේවක ගරු ක්‍රිසන්තස් ප්‍රනාන්දු (නි.ම.නි) පියතුමා ගම කැපකිරීමේ යාචඥාව උච්චාරණය කිරීමෙන් පසු මංගල කටයුතු අවසන් කැරිණ.

අසිත ප්‍රියදර්ශන

## සෙඩෙක් ජනතා විශ්වාසය දිනූ සංවිධානයක්

කතෝලික සභාවේ සමාජ සේවා හස්තය වන සෙඩෙක් කරිටාස් ආයතනය ජනතාවගේ දුක්පීඩා නිවාලන්නට ඔවුනට අත දෙන බවට විශ්වාසයක් ජනතාව තුළ ඇතැයි රත්නපුර සෙත්මිණි අධ්‍යක්ෂ ගරු ටෙක්සි දිසානායක පියතුමා පැවසීය.

රත්නපුර මාධ්‍යවේදීන් දැනුවත් කරමින් පැවැත්වූ පුවත් පත් සාකච්ඡාවකදී ගරු පියතුමා මේ බැව් පළකළේය.

තියබෝල්ඩ් සමරතුංග

ඥානාර්ථ ප්‍රදීපය
ශ්‍රී ලංකාවේ පළවන ඉපැරණිම සිංහල පුවත්පත
කොළඹ කතෝලික මුද්‍රණාලය, කොළඹ 8, දු.ක. 2695984, 4899611 ෆැක්ස් 2692586
ඊමේල්: pradeepaya@yahoo.com, වෙබ් අඩවිය: www.colombocatholicpress.lk
ක්‍රිස්තු වර්ෂ 2012 සැප්තැම්බර් 30 ඉරිදා

# විශ්වාසයේ වසර සවිගන්වන දහම් ප්‍රබෝධයකට ධර්මෝපදේශ දිනය නිමිත්තක් කරගත හැකිනම්........

ජාතික ධර්මෝපදේශ දිනය අද පැවැත්වේ. 'ක්‍රියාකාරි ඇදහිල්ල තුළින් නව ජීවනයක් අත්දකිමු' යන තේමාව ඔස්සේ මෙවර ජාතික ධර්මෝපදේශ දිනය සැමරීමේදී වඩාත් සුවිශේෂි වැදගත් කමක් වී ඇත්තේ ඉදිරියේ ප්‍රකාශයට පත්කරන විශ්වාසයේ වසර එළිපත්තේ හිඳිමින් අප එය සැමරීම නිසාවෙනි.

බහු ආගමික පරිසරයක වෙසෙන මෙරට කතෝලිකයාට ධර්මෝපදේශය අතිශයින් වැදගත් වන්නේ එය හුදෙක් පත පොතට පමණක් සීමා නොවන්නේ නම් පමණකි. පොත පතින් ධර්මෝපදේශය ඉගෙන ගන්නා කිතුනුවා සිය ඇදහිල්ල ශක්තිමත් කර ගනිමින් ක්‍රියාකාරි ඇදහිල්ල ඔස්සේ සමාජය තුළ සාක්ෂි දරන්නටත්, ඒ මඟින් නව ජීවනයක් අත් දකින්නටත් යොමුවිය යුතුය. මෙවර ජාතික ධර්මෝපදේශ ඉරුදින තේමාවෙන් ඇරියුම් කරන්නේ ද එයයි.

මීට පනස් වසරකට පෙර මුළුදුන් දෙවන වතිකාන කතිකාවේදී අතිඋත්තම විසිතුන්වන ජුවාම් ශුද්ධෝත්තම පියතුමා මෙසේ පැවසීය. 'කතෝලික සභාවට අයත් වේද නිධානය මගින් මිනිසුන් අතීතය වෙත ගෙන යෑමට වඩා වැදගත් වන්නේ එකී වේද නිධානය නිවැරැදිව හදාරා නූතන යුගයට සරිලන අන්දමින් ප්‍රකාශ කිරීමය, ඒ අනුව දේව වචනය පදනම් කරගෙන ධර්මෝපදේශය මගින් බාලයන්ට, තරුණ තරුණියන්ට මෙන්ම ඇතැම් විට වැඩිහිටියන්ට පවා ඇදහිල්ලේ හා විශ්වාසයේ සවිමත් දිවි පැවැත්මකට ක්‍රමානුකූල හා සාමුහික අත්වැලක් ලබාදිය යුතු බව නොරහසකි.

විසි එක්වන සියවසේ වඩාත් දියුණු තාක්ෂණික ලෝකයක ධර්මෝපදේශ සේවාවද කාලය හා අනුරූපී විය යුතුව ඇත. වර්තමාන සමාජයේ පවත්නා නව ප්‍රවනතා හමුවේ ධර්මෝපදේශය ඉගැන්වීමද අභියෝගයට ලක්වී ඇතැයි පවසතොත් නිබොරුය. ඉරිදා හෝ සතියේ දිනවල පැවැත්වෙන දහම් පාසලට සහභාගි වීමට වඩා ටියුෂන් පංති වෙත දිව යාමේ ප්‍රවනතාවය මේ වන විට විශේෂයෙන් ඉහල පංතිවල දරුවන් විෂයයෙහි පවතින බලවත් අභියෝගයකි. එමෙන්ම අන්තර්ජාලය, ෆේස්බුක්, චැට් රූම්, වෙබ් අඩවි සමග තරග කරන්නට අප තවමත් යොදාගන්නේ දහඅටවන, දහනවවන, විසිවන සියවස් වල උපයෝගි කරගත් සාම්ප්‍රදායික ඉගැන්වීමේ රටාවන්මය. කාලය පිළිබඳව බරපතළ තරගකාරිත්වයක් ගොඩනැගෙමින් පවතින නූතන සමාජ වටාපිටාව තුළ අප තවමත් පැය දෙක තුනේ ඒකාකාරී දේශන ඔස්සේ පංති කාමර තුළ ධර්මෝපදේශය බෙදා දීමේ වෑයම් වල නිරත වෙමින් දරුවන් ඒවාට අනුගත නොවන්නේයැයි මැසිවිලි නැගීම කොයිතරම් දුරට කාලෝචිතද?

ශ්‍රී ලාංකේය සිසු දරු පරපුර ඉලක්ක කරගත් දහම් පාසල් හා පාසල් පද්ධතිය යම් සාර්ථකත්වයක් ලබාගැනීමට සමත්වී ඇතත් යොවුන් හා තරුණ පරපුර ඉලක්ක කරගත් ධර්මෝපදේශ සේවාව සාර්ථක යැයි අපට තක්සේරු කළ හැකිද? මේ නිසාම වඩ වඩාත් පුළුල් හා නූතන තාක්ෂණය ඇසුරු කරගත් යොවුන් ධර්මෝපදේශ ක්‍රමවේදයන් හා වැඩිහිටි ධර්මෝපදේශ ක්‍රමවේදයන් කෙරේ වැඩි අවධානයක් යොමුකර ක්‍රියාකාරී වීම මේ මොහොතේ කාලීන අභියෝගයක් ලෙස ගිනිය යුතුය.

විශේෂයෙන් අනාගත කතෝලික පරපුරේ හදවත බඳු කතෝලික යෞවන - යෞවනියන් වෙනුවෙන් මීසම් මට්ටමින් යොවුන් ධර්මෝපදේශය ඉලක්ක කරගත් දහම් පාසල් ඇරැඹීම ගැන සාකච්ඡා මතුවූයේ අද ඊයේ නොවේ. තැනක දෙකක එය ක්‍රියාත්මක විය හැකි වුවද මනා සංවිධානාත්මක මට්ටමින් දහම් පාසල් වල යොවුන් ධර්මෝපදේශය ක්‍රියාත්මක නොවන බව මුසාවක් නොවේ. එහෙත් මෙය ඉතා වැදගත් අවශ්‍යතාවයකි. නූතන සමාජය තුළ කතෝලික මුලය සහිත සැබෑ ඇදහිල්ලට ක්‍රියාකාරීවන කතෝලික තරුණ පරපුරක් වෙනුවෙන් මෙහි ඇති වැදගත්කම අමුතුවෙන් කිව යුතු නොවේ.

එමෙන්ම වැඩිහිටි ධර්මෝපදේශය කිතුනු ඇදහිල්ල වඩ වඩාත් සවිමත් කර ගැනීමෙහිලා වඩාත් මහෝපකාරී වන්නකි. වැඩිහිටියන්ට සිය ක්‍රියාකාරී ඇදහිල්ල වඩා ගැඹුරින් අත්දැකීමට මං පාදා දීමට එමගින් හැකිවිය යුතුය. හුදු ගුරු ගෝල වශයෙන් දහම එකඑල්ලේ ලබාදීමේ සාම්ප්‍රදායික පිළිවෙතින් බැහැරව යමින් නූතන සමාජ යථාර්ථයන් හමුවේ මතුවන අභියෝග, තර්ජන, ගර්ජන මෙන්ම ජීවිතයේ තනිකම, හුදකලාව අත්දකින තත්ත්වයක් තුළ ඇදහිල්ල තුළින් ඒවාට මුහුණදීමට සවියක් හා බලයක් අත් විඳීමට මං සැලසිය හැකිනම් එය වඩාත් ප්‍රායෝගික හා යථාර්ථවාදී තත්ත්වයකි.

මේ සියලු තත්ත්වයන් මැද මෙවර ජාතික ධර්මෝපදේශ ඉරුදින ඉදිරියේ ඇරැඹෙන විශ්වාසයේ වසර වඩ වඩාත් අරුත් ගන්වන සැබෑ දහම් ප්‍රබෝධයකට නිමිත්තක්ම වේවා!

# දරුවන් බේරා ගනිමු



**රිසානා මරණය අභියස දුක් විඳින්නේ කාගේ වරදින් ද? දරුවන්ට ගල් ගසා මරන්නේ කව්ද? මල් කැකුළු වේගයෙන් කාමාතුරයන් බිලි ගැනීම රටේ සංවර්ධනයේ කොටසක් ද? ක්‍රිෂ්ණ තුෂාරි, දුෂාන්ති කුණු ඇලට විසි කරන්නේත්, අකුරැස්සේ දැරිය දූෂණය වන්නේත් ආසියාවේ ආශ්චර්යයද? මේ සියල්ල කැටි කොට ගත් කල රටේ උත්තරීතර පදවිය දරන සියලු බලතල සහිත ජනාධිපතිතුමා පවසන්නේ කුමක් ද? සිදුවන දේ පිළිබඳ සතුටු විය නොහැකි බවයි. තත්ත්වය ඒ තරමට දරුණු වී ඇත. රටේ අනෙකුත් ප්‍රශ්න කෙසේ වූවත් දරුවන් වෙත එල්ල වන සියලු අයහපතින් ඔවුන් බේරා ගැනීම ශිෂ්ට සමාජයේ සියලු දෙනාගේ පරම යුතුකමයි.**

එදා පෙරදිග ලෝකයේ බබලන මුතු ඇටය ලෙසත් පෙරදිග ධාන්‍යාගාරය ලෙසත් දහම් දිවයින ලෙසත් නම් දරා සිටි අප මව්බිම ක්‍රම ක්‍රමයෙන් අයහපත වෙත ගමන් කරමින් සිටීම ඉතාම කණගාටුදායකය.

රිසානා මරණය අභියස දුක් විඳින්නේ කාගේ වරදින් ද? දරුවන්ට ගල් ගසා මරන්නේ කව්ද? මල් කැකුළු වේගයෙන් කාමාතුරයන් බිලි ගැනීම රටේ සංවර්ධනයේ කොටසක් ද? ක්‍රිෂ්ණ තුෂාරි, දුෂාන්ති කුණු ඇලට විසි කරන්නේත් අකුරැස්සේ දැරිය දූෂණය වන්නේත් ආසියාවේ ආශ්චර්යයද? මේ සියල්ල කැටි කොට ගත් කල රටේ උත්තරීතර පදවිය දරන සියලු බලතල සහිත ජනාධිපතිතුමා පවසන්නේ කුමක් ද? සිදුවන දේ පිළිබඳ සතුටු විය නොහැකි බවයි. තත්ත්වය ඒ තරමට දරුණු වී ඇත. රටේ අනෙකුත් ප්‍රශ්න කෙසේ වූවත් දරුවන් වෙත එල්ල වන සියලු අයහපතින් ඔවුන් බේරා ගැනීම ශිෂ්ට සමාජයේ සියලු දෙනාගේ පරම යුතුකමයි. එය එසේ නොවන්නේ නම් මේ ලිපියේ ආරම්භයේ සඳහන් කර ඇති පරිදි අප මව්බිම කොටගත් ජනතාව අතිබහුතරයක් වැඳ නමස්කාර කරන ඒ ඒ දහම් පණිවුඩ තුළ ජීවත්වීම තුළින් තමා හා තම පවුල පමණක් ගොඩ යාමට මග සලසා ගන්නේ නම් තත්ත්වය තවත් බරපතළ වනු ඇත. කිසිදු බියකින් හෝ ලැජ්ජාවකින් තොරව රටේ සාංඝික දේපල සොරා ගන්නා බලවන්තයින් නීතිය තමා අත රඳවා ගන්නවා පමණක් නොව එය තම ගෝලබාලයින් වෙතද නිර්ලෝබීව බෙදා දී ඇත. නැතිනම් සමාජයට මේ තරම්ම භීතිය උදා නොවනු ඇත. එක අතකින් දරුවන් මෙහෙකාර සේවයේ, තවත් අතකින් ආදරය කරුණාව අහිමිව දරුවන් වීදිවල, තවත් පැත්තකින් මව්පිය සෙනෙහස අහිමිව ළමා නිවාස වල, ඒ නැතිබැරි අයගේ දරුවන්ය. ඇති හැකි අයගේ දරුවන්ගේ තත්ත්වය කෙබඳුද? ඔවුන් විශ්ව විද්‍යාලවල අතරමං වී ඇත. උසස් පෙළ දරුවන්ගේ ප්‍රතිඵල ගැන විවිධ මත පළකර දුකින් තැවෙයි. මේ අතර දරුවන් ගඟට විසිකරන අම්මලා මෙන්ම තම දියණියන් කාමාතුරයන්ට දන් දෙන අම්මලා ගැන ද සමාජයෙන් ඇසෙයි. මේ අතර කොමිස් වලට, අල්ලසට මැරකමට පමණක් ප්‍රසිද්ධ වී සිටි සමහර දේශපාලනඥයින් මල් කැකුළු වලට අත තැබීමට පටන් ගෙන ඇත.

විවිධ දේශපාලන ක්‍රියාකාරීන් විසින් වරින් වර අප රටේ දරු පරපුරට කර ඇති විනාශයන් වලකා ගන්නට සැබෑ උවමනාවක් පාලකයින්ට ඇත්නම් නීතිය මේ සඳහා තදින් ක්‍රියාකරන තැනකට යා යුතු වෙනුවට නීතිමය දැලින් පලා යන්නට ඉඩකඩ ඇති කිරීම මේ රටේ දරුවන්ගේ අවාසනාවකි.

දරුවන් පිළිබඳ ඉහළම අධිකාරි බලයක් ඇති ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ සභාපති තුමිය කර ඇති ප්‍රකාශයක් අනුව දරුවන් බිලිග න්නා කාමාතුරයින් එල්ලා දැමීම සුදුසු වේ යැයි ප්‍රකාශ කර ඇත. දරුවන් වෙත එල්ල වන මේ මහා විනාශය වලකා ගන්නට රජය ජනතාව අතර අතරමැදියකු ලෙස අධිකාරි බලය සහිත මේ ආයතනයේ ක්‍රියාකාරිත්වය සතුටු විය හැකි මට්ටමක නොමැත. අද වන විට රටේ හතර වටින් අප හට දකින්නට ලැබෙන දරුවන්ගේ විලාෂය මේ රටේ සැමට ඇසිය යුතුය. එය මේ රටේ දේශපාලන නායකයන්ට මෙන්ම ආගමික නායකයන්ට ද පොදුය. බුදුරජාණන් වහන්සේ, ජේසුස් වහන්සේ වදාළ ධර්මයට අනුව දරුවන්ගේ අනාගතය විනාශ කරනවුන් විනාශ කළ යුතුය. ඔහු මවද, පියාද, බාප්පාද, සීයාද, ප්‍රාදේශීය සභා මන්ත්‍රිද ඊට ඉහළ අයෙකු ද යන වග වැදගත් නොවේ.

මේ යන ආකාරයට දැනට (මෑත භාගය තුළ) දරුවන් අපයෝජනය කර ඇති, නැතිනම් දරුවන්ගේ ජීවිත විනාශ කළ අය කුමන තරාතිරමක අය වුවත් ඔවුන්ට උපරිම දඬුවම දිය යුතුය. එසේම මේ අයහපතින් දරුවන් බේරා ගන්නට නම් අදාල සියලු පාර්ශවයන් වහාම තම යුතුකම හා වගකීම ඉටුකළ යුතුය.

දේවසංරක්ෂණය තුළ සියල්ල විඳගනිමින් අසරණ වූවන්ට සරණය වීම තම ජීවිතය කරගත් තෙරේසා මව්තුමියගේ රාවතාවත්ත ළමා නිවාසය සෝදිසි කරන්නට මාධ්‍යවේදීන් පිරිවරා කඩා වදින මේ රටේ දරුවන් පිළිබඳ අධිකාරි බලය සහිත සභාපති තුමිය මෑත භාගයේ දරුවන් වෙත එල්ල වූ සකලවිධ අකටයුතු කම් පිළිබඳව ගත් ක්‍රියා මාර්ගයන්ගෙන් දරුවන් වෙනුවෙන් නීතිරීති පැනවීම කාලීන අවශ්‍යතාවයකි. එහෙත්

15 පිටුවට »

කේ. පී. ඇන්ටනි සිල්වා
බේරුවල
ප්‍රාදේශීය සභා මන්ත්‍රී

කැමිලස්ගේ — තිත්ත ඇත්ත



මීසමෙන් මීසමට

# දෙමව්පියන්ගේ ධර්මෝපදේශය දැනීම දරුවන්ගේ විශ්වාසය ශක්තිමත් කළා

## ඇතුගල්පුර රදගුරු හිමිපාණෝ නාලවලානේදී පවසති

**එදා අපගේ දෙමව්පියන් කතෝලික සභාවේ ධර්මෝපදේශය නමැති කාලෝචිත සරල ග්‍රන්ථය මගින් ඉතා භක්තියෙන් ලබාගත් අද්විතීය සහ අසමසම දේව අනාවරණය පිළිබඳ අවබෝධය තම දරුවන්ගේ දේව විශ්වාසයේ ශක්තිමත් අත්තිවාරමවූ බව කුරුණෑගල රදගුරු අතිඋතුම් හැරල්ඩ් ඇන්තනි පෙරේරා හිමිපාණෝ ප්‍රකාශ කළහ.**

පසුගිය දින නාලවලාන අග්‍රදූත ශුද්ධවූ මිඛායෙල් තුමන්ගේ දේවස්ථානයේ පැවති අභිවෘද්ධි ආලේපය දානය කිරීමේ දේව මෙහෙයේදී රදගුරු හිමි මේ බැව් පළ කළේය.

නාලවලාන දහම් පාසල් ශිෂ්‍ය ශිෂ්‍යාවන් 158 දෙනෙක් මෙදින අභිවෘද්ධි ආලේපය ලබාගත්හ. වසර පහකට පමණ පසුව සුදතුම් වරම් දානය කිරීම සඳහා පැමිණි රදගුරු හිමිපාණන්ව මීසම්වාසිහු මහත් හරසරින් පිළිගත්හ.

නාලවලාන මීසම් සේවක ගරු ලීනස් මැක්ලවුඩ් පියතුමාගේ උපදෙස් මත නාලවලාන ශුද්ධ වූ පවුලේ පැවදි සොහොයුරියන් සහ දහම් ගුරු මණ්ඩලය, දෙමව්පියන් කිතුනු දූතසේවා මණ්ඩලය එක්ව මේ අවස්ථාව මනාව සංවිධානය කර තිබිණි.

එෆ්. ජේ. එල්. කරුණාරත්න



උතුරු කොළඹ දිසාවේ ධර්ම දුත ළමා සජීවික සජීවිකාවන් පිරිසක් පසුගිය දිනක එක් දින පුහුණු කඳවුරකට සහභාගි වුහ. දිසා උපාධ්‍ය ගරු ජූඩ් ලක්ෂාන්ත පියතුමන් සමඟ එම පිරිස සේයාරුවකට ද පෙනී සිටියහ.

ට්‍රිසිල් ඇෆ්. මැන්දිස්

## නිකවැරටිය 125 ජයන්ති සූදානමට ක්‍රිස්තු සංචාරයක් හා වැඩසටහන් රැසක්

කුරුණෑගල පදවියේ නිකවැරටිය ශු. අන්ද්‍රේ මුනිතුමන්ගේ දේවස්ථානයේ 125 වෙනි ජයන්තිය වෙනුවෙන් පදවි මරිය හමුදාව විසින් ක්‍රිස්තු සංචාරයක් පසුගියදා පවත්වන ලදී. පදවිය පුරා විසිරී සිටින මරිය භටයින් හැට දෙදෙනෙක් පවුල් 167 ක් බැහැ දුටහ.

මේ වැඩ සටහනට සමගාමීව කුඩා කිතුනු සංඝ පදවි අධ්‍යක්ෂ ගරු රූපස් තැලිස් පියතුමා හා එම කණ්ඩායම මෙහෙය වූ කිතුනු ඒකක රැස්වීම්ද පැවැත්විය. පසු දින ළමා වැඩ සටහනක් සහ මවුපිය වැඩ සටහනක් දේවස්ථානයේ දී පවත්වන ලදී.

නිකවැරටිය මීසම් සේවක ගරු ප්‍රැන්සිස් මිල්රෝයි පියතුමා 125 ජයන්තිය තුළින් ජනතාව වඩාත් දෙවියන් වෙතට ළං කිරීම සිය අරමුණ නිසා මේ වැඩසටහන් දියත් කළේය.

ටී. එම්. පී. සන්ධ්‍යා කුමාරි

## යට්ටෝවිට සභාවට තවත් පැවදි සොයුරියක්



හංවැල්ල මීසමේ යට්ටෝවිට සභාවේ නිර්මල දේව මාතා දෙව් විමනේ වර්තමාන මීසම් කමිටු ලේකම් මැක්ෂි රාමනායක සහ චාන්දනි කුමාරි යුවළගේ එකම දියණිය මේරි මහින්දි චතුරිකා පසුගියදා දේව සංරක්ෂණයේ දියණියෝ නිකායේ පැවිදිවරය ලැබුවාය.

දේව මාතා මංසන්ධියේ සිට එතුමිය පිළිගෙන දර්ශනීය පෙරහරකින් දෙව් විමන කරා කැඳවාගෙන පැමිණීමෙන් පසු තුති පිදීමේ මංගල දිව්‍ය යාගය පැවැත්විණ.

ගරු මේරි මහින්දි චතුරිකා පැවදි සොයුරියනගේ ස්තුති කතාවෙන් අනතුරුව සභාව නියෝජනය කරමින් කිතුනු පවුල් ඒකක හා සමිති සමාගම්, මීසම් සේවක ගරු ගියොම් නෝනිස් පියතුමා, සහයක ගරු ටිරොන් අජිත් පියතුමන්ගේ මෙහෙයවීම අනුව යට්ටෝවිට සභාව මෙය සංවිධානය කරන ලදි.

සටහන - ඇග්නස් විජේතුංග
සේයා - ඇන්තනි හෙට්ටිආරච්චි



මීගමුව මහහුණුපිටිය සා. ලාසරස් මුනිඳුන්ගේ දෙව්මැඳුරේ වාර්ෂික මංගල්ලය දින ආරාධිත පියතුමා ලෙස පැමිණි කට්ටුව මීසම් සේවක ගරු ජූඩ් සුරේෂ් පියතුමාව කටුවපිටිය මීසම් සේවක ගරු ශ්‍රීකාන්ත ප්‍රනාන්දු හා සහයක ගරු ඩිල්රන් පීරිස් පියතුමන් හා එක්ව මීසම් වාසීන් විසින් පිළිගෙන දෙව් මැඳුර වෙත කැඳවාගෙන එන අවස්ථාවයි මේ.

සේයා - ඇග්නස් සියඹලාපිටිය

# ක්‍රිස්තු චින්තනය තුළ මුහුකුරා ගිය කිතුනුවන් වෙමු

වත්පිළිවෙත්වලට පමණක්ම මුල්තැනදී පෙරපාසල් දරුවන් මෙන් නොවී ක්‍රිස්තු චින්තනය තුළ මුහුකුරා වැඩුණු විශ්වාසනීය කිතුනුවන් වෙමුයැයි මට්ටාකොටුව සින්දාත්‍රි දේවමාතා දේවස්ථානයේ වාර්ෂික මංගල උත්සවයේදී කුඩා කිතුනු සංඝ ජාතික අධ්‍යක්ෂ ගරු එරික් කොන්ස්ටන් පියතුමා පැවසීය.

මට්ටාකොටුව මීසම් සේවක ගරු හයිසින්ත් තිසේරා සහයක ගරු ඇලෙක්ස් පියතුමන් ප්‍රමුඛ මට්ටාකොටුව මීසම් සංඝය මංගල්‍යය කටයුතු සංවිධානය කර තිබිණ. තවත් වසර දෙකකින් 150 ජයන්ති මංගල උත්සවය පවත්වන බව ප්‍රකාශයට පත්කර ඊට සූදානමක් වශයෙන් ලොතරැයියක් ආරම්භ කිරීමද මෙදින සිදුවිය.

මට්ටාකොටුව, වැල්ලකැලේ කුඩාවැව, තොඩුවාව වැනි මීසම් වලින් සැදැහැවත් ජනතාව පැමිණ සිටි අතර තරුණ සමිති, ධර්මදූත ළමා සමිති මගින් ග්‍රාමය පුරා අලංකාර තොරණ සාදා තිබිණි.

ඇන්ටනි ස්ටැන්ලි කීර්ති සිරි පෙරේරා

# බලගල සදාසරණ දෙව්මැඳුර




හැඳල බලගල නව මීසමක් කිරීමෙන් පසු පැවැත්වෙන පළමු වාර්ෂික මංගලෝත්සවය සැප්තැම්බර් 30 ඉරුදිනට (අද) යෙදී ඇත.

ඒකාලයේ බලගල ප්‍රදේශයේ පෞද්ගලික ඉඩමක සිල්වා නමැති ගුරු මහත්මියක් කුඩා දරුවන් පිරිසකට දහම ඉගැන්වීම සුළුවෙන් කරගෙන ගිය අතර පසුව එය අතරමග නතර වූවත් බලගල දෙව්මැඳුරක් ඉදිකිරීමේ මුල් පියවර තබන්නට ගරු ඇන්තනි පියතුමාට එය විශාල රුකුලක් හා ශක්තියක් විය. පියතුමාගේ හා ගම්වාසීන්ගේ ඉල්ලීම පිට හැඳල රුද්‍රිගු පවුලෙන් පරිත්‍යාග කෙරුනු කුඩා ඉඩම් කැබැල්ලක මුලින්ම පොල්අතු මඩුවක් සාදා එහි ජපමාලය කියන්නටත් විටින්විට නුවාන පැවැත්වීමටත් ගරු ඇන්තනි පියතුමා පියවර ගත්තේය.

බලගල ග්‍රාමයේ පැරණි දෙව්මැඳුරු ගොඩනැගිල්ල ඉදිකිරීමේ කටයුතු ආරම්භ වූයේ 1980 දී පමණය. එය සදාසරණ මෑණියන්ට කැප කරන්නට ගරු එච්. ඩී. ඇන්තනි පියතුමා දැඩි ආශාවකින් පසුවෙමින් සිටි මොහොතක සදාසරණ ප්‍රතිමාවක් තෑගි ලැබුනේ ප්‍රාතිහාර්යයක් ලෙසටය. ඒ අනුව එම ප්‍රතිමාව 1982 මැයි තිස්වෙනි දින පැරණි දෙව්මැඳුරේ තැන්පත් කරනු ලැබීය.

පැරණි දෙව්මැඳුර වෙනුවට අද තිබෙන දර්ශනීය දෙව්මැඳුර ඉදිකිරීමේ ගෞරවය හිමිවන්නේ නායකකන්ද මීසම් සේවකව සිටි ගරු බෙනඩික්ට් ජයතිලක පියතුමාටය. එතුමාගේ උත්සහයත් උනන්දුවත් නිසා නව දෙව්මැඳුර ඉදිකිරීම පිණිස 1993 අගෝස්තු මස 23 වැනි දින එවකට කොළඹ සහයක රදගුරු අතිඋතුම් මැල්කම් රංජිත් හිමි මුල්ගල් තැබූ අතර නව දෙව්මැඳුර ඉදිකිරීමේ කටයුතු අවසන් වීමෙන් පසු 2000 ජූනි 17 කොළඹ අගරදගුරු අතිඋතුම් නිකලස් මාකස් ප්‍රනාන්දු හිමිපාණන් විසින් ආසිරි ගන්වනු ලැබීය.

නව මීසමක් වූ බලගල ප්‍රථම මීසම් සේවක ගරු ජූඩ් රාජ් ප්‍රනාන්දු පියතුමාගේ මඟපෙන්වීම හා උපදෙස් මත මෙවර මංගල්ලය සිදු කෙරේ. මංගල මෙහෙය පෙරවරු 8.00 ට කොළඹ සා. ඇලෝසියස් දෙව්සත්හලේ අධ්‍යක්ෂ ගරු ලලිත් ෆීලික්ස් පියතුමාගේ ප්‍රධානත්වයෙන් ද සන්ධ්‍යා මෙහෙය සැප්තැම්බර් 29 පස්වරු 7.00 ට ගරු එච්. ඩී. ඇන්තනි පියතුමාගේ ප්‍රධානත්වයෙන්ද සිදුකෙරේ.

නිමල් පෙරේරා

# ජාඇල විකෂෝප මාතා මංගල උලෙළ ජයයි

ජාඇල වික්ෂෝප දෙව් විමනේ 211 වෙනි වරටත් පවත්වන්නට යෙදුන වාර්ෂික මංගල්‍ය සන්ධ්‍යා මෙහෙයේදී කෝට්ටේ මීසම් සහයක ගරු ගිහාන් ෂෙනෝ පියතුමා වික්ෂෝප දේව අම්මා සිය පුතු ජේසු කුමරු එදා ජෙරුසලෙම් දේව මන්දිරයෙහි ඔප්පු කරන කල්හී ශුද්ධවූ සිමියොන් දිවස්ප්‍රසාදී තුමා පැවසූ වදන් අනුව 'ඔබගේ ඇලය කඩුවකින් සිදුරු වනු ඇත" යනුවෙන් ප්‍රකාශ කළ දිනයත්, එදා ගොල්ගොතා නම්වූ කඳු මුදුනේ සිට තමන් යාගයක් වීමට පෙරාතුව කුරුස ගසේ එල්ලී සිටියදී තම මෑණියන් සකල ලෝ වැසියන්ගේම මව ලෙස බාර දෙමින් වදාළ 'ස්ත්‍රීය මෙන්න ඔබේ පුත්‍රයා - පුත්‍රය මෙන්න ඔබේ මෑණියෝ' යනුවෙන් ආමන්ත්‍රණය කළ අවස්ථාවත් විකෂෝප මංගල්‍යයේ ආරම්භය බැව් සිහිගැන්විය. මංගල දිව්‍ය පූජා යාගය රාවතාවත්ත මීසම් සහයක හා ජාඇල මීසම් පුතකු වන ගරු කසුන් ඉෂාර ප්‍රනාන්දු පියතුමාගේ ප්‍රධානත්වයෙන් සිදු කෙරින. මෙවර මංගල්‍ය තේමාව වූයේ 'දේව වචනය තුළින් විශ්වාසයේ නවෝදයක් කරා' යනුයි.

මංගල සමයේ විවිධ තේමාවන් ඔස්සේ ගරු සනත් කුමාර (දිගැනි) පියතුමන් විසින් සැදැහැවතුන්ගේ සිත් සතන් පුබුදුවාලනු ලැබීය. පශ්චාත්තාපික හා රෝගීන්ගේ දින පැවති අතර දුගී දුප්පත් අසරණයන් හට පිළිසරණ වෙමින්, වියළි ආහාර ද්‍රව්‍ය බෙදා දීමක්ද සිදුවිය. තරුණ එකමුතුව පොල් තොරණක් ඉදිකර තිබිණ.

මීසම් සේවක ගරු ග්‍රෙගරි ජයන්ත ප්‍රනාන්දු පියනමගේ අධීක්ෂණය යටතේ, දහම් සේවා කමිටු සාමාජික සාමාජිකාවන් ඒකරාශිකර ගනිමින්, සියල්ල මැනවින් සංවිධානය කොට තිබිණ. ගරු නිහාල් රුද්‍රිගු පියතුමා හා ගරු ප්‍රියාන් සුභාෂණ සහෝදර තුමන්ගේ නොමඳ සහය ලැබිණ.

එල්. එස්. නෙල්සන් ප්‍රනාන්දු



දුන්ගාල්පිටිය වේලන්කන්නි දේවමාතා මණ්ඩපයේ වාර්ෂික මංගල්‍යය පසුගියදා පැවැත්විය. සැලේසියානු නිකායේ ප්‍රාදේශාධිපති අතිගරු නිහාල් ලියනගේ සහ කැපුන්ගොඩ මීසම් සේවක ගරු ක්ලෝඩ් වනසිංහ පියතුමන්ගේ ප්‍රධානත්වයෙන් පැවැති මංගල්‍යය සඳහා අති විශාල පිරිසක් සහභාගී වූ අතර මෙය සංවිධානය කරනු ලබන්නේ නියෝජ්‍ය අමාත්‍ය සරත් කුමාර ගුණරත්න මහතා විසිනි.



මත්තුමගල ශ්‍රී හෘද දෙව්මැඳුරේ වාර්ෂික මංගල්‍යය පසුගියදා පැවැත්විණ. සන්ධ්‍යා මෙහෙය මොරටුව සා. සෙබස්තියන් විදුහල්පති ගරු බොනි ප්‍රනාන්දුපුල්ලේ පියතුමන්ගේ ප්‍රධානත්වයෙන් ද මංගල දිව්‍ය පූජාව රත්නපුර පදවි අනුනායක අතිගරු ඩේමියන් පියසිරි පියතුමාගේ ප්‍රධානත්වයෙන්ද පැවැත් වුණි. මීසම් සේවක ගරු බී. ඒ. ශිරාන් පියතුමා මීසම් සභාව සමඟ මංගල්‍ය කටයුතු සංවිධානය කළේය.

# ජීවමාන දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ



**ශුද්ධවූ දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ ජීවමාන බව තහවුරු කෙරෙන සත්‍ය කතා පුවතක් මෙසේ දිග හරිමු. මේ කතා පුවතට පාදක වන්නේ ස්පාඤ්ඤයේ ටොන්කාඩා නගරයේ කිතුනු දෙව්මැඳුරක තරුණ මීසම් පාලක පියතුමකු වන භක්තිමත් එහෙත් නිරන්තර සැකයෙන් පීඩනයට පත්ව හුන් කතෝලික පූජාප්‍රසාදිතුමෙකි. තමා වලංගු ලෙස පූජාත්වරය ලබා තිබේ ද යන්න මෙතුමාට තිබූ ප්‍රධාන ගැටලුවයි. ඒ නිසාම දිව්‍ය පූජා යාගය ඔප්පු කිරීම මෙතුමාට මහත් හිසරදයක් ව පැවතුණි.**

කාලය ගෙවී යද්දී මෙතුමා ගැන අවධානය හා අනුකම්පාව දැක් වූ අප දෙවි පියාණන් වහන්සේ සැකය දුරු කරන්නට හා ගැටලුව නිරවුල් කර දෙන්නට වැඩ පිළිවෙලක් දියත් කළ සේක.

නත්තල උදා විය. ජේසු බිළිඳුන්ගේ උපත සිහි කැඳවමින් ටොන්කාඩා නගරයේ සියළුම දෙව් මැඳුරුවල ඝණ්ඨා නාදය දසත සිසාරා ඇසෙන්නට විණි. අප දෙව්මැඳුරේ සීනු හඬ ද ඊට නොදෙවෙනි වූවා සේ ය. මීසම් පාලක තරුණ පූජාප්‍රසාදිතුමා ශුද්ධවූ අල්තාරය මත දිව්‍ය පූජාව ඔප්පු කරන්නට ආරම්භ කළේ ය.

අල්තාරය පසෙකින් ඉදි කළ කුඩා ගවහල දැකුම්කළුය. ජේසු බිළිඳුන්ගේ කුඩා ප්‍රතිමාව කාගෙත් සිත් ගත්තේ ය. දෙව් මැඳුර හරහා සිසිල් සුළඟක් හමා ගියෙන් බැතිමත් හු සීතලෙන් හැකිළුණහ.

පූජා ප්‍රසාදිතුමා දිව්‍ය පූජාව ඔප්පු කරමින් සිටී. එතුමා තුළ වූ භය හා සැකය නිසා නත්තල් ප්‍රීතිය ද යටපත් වී තිබුණි. ශුද්ධවූ දිව්‍ය සත්ප්‍රසාදය කැප කිරීමේ අභිරහස්‍යමය වචන පවා කියාගත නොහැකිව එතුමාගේ තොල් හා දෙ අත් වෙව්ලන්නට විය. එහෙත්, ආයාසයෙන් එතුමා එම වචන පවසා ශුද්ධවූ දිව්‍ය සත්ප්‍රසාද පූපය ස්වර්ගය දෙසට ඔසවා, අල්තාරය මත තබා, ඉමහත් භක්තියෙන් දණ නමා වැඳ නමස්කාර කළේ ය.

අතුරු සිදුරු නැතිව බැතිමතුන්ගෙන් පිරී පැවතුණත්, දෙව් මැදුර පුරා ඉතා ඈඩි නිහඬ බවක් පැවතුණි.

"අම්මේ.... අම්මේ.... අර බලන්නකෝ ලස්සන චූටි බබෙක්... අර අර අල්තාරේ උඩ" ඒ මහා නිහඬ බව කෑලි කෑලි වලට කපා දමමින් කුඩා දරුවකු ඔල්වරසන් දෙමින්, අත්පොලසන් දෙන්නට විය.

බැතිමත්හු තිගැස්සී හඬ ආ දෙසට නෙත් යොමු කළහ. දරුවාගේ මව ලජ්ජාවටත්, කේන්තියටත් පත්ව දරුවාගේ අත් මිරිකා, මුව සිඟිත්ත වසා, කෑ නොගසන ලෙස තරවටු කළාය.

"අර බලන්නකෝ අම්මි.... චූටි බබා.... හරියට ගවලෙනේ ඉන්න ජේසු බබා වගේමයි" දරුවා අල්තාරය දෙසට අත දිගු කරමින් යළිත් කෑ ගසන්නට විය.

✍ **වසන්ත පී. ඒ. රත්නායක විසිනි**

බැතිමත්හු අල්තාරය දෙස බැලූහ. තරුණ පූජාප්‍රසාදිතුමා ශුද්ධවූ සත්ප්‍රසාද පූපය අනුභව කර අවසාන වූවා පමණි. දර්ශනය ද ඒ සමඟ නිම විය.

මැදියම් රාත්‍රී දේව මෙහෙය අවසාන විය. දෙවෙනි දිව්‍ය පූජාව ආරම්භ විය. බැතිමත් සමහරු එම මෙහෙයට ද සහභාගි වූහ. දර්ශනය දුටු දරුවා හා මව ද ඔවුන් අතර වූහ. ශුද්ධවූ දිව්‍ය සත්ප්‍රසාද පූපය ඉහළට ඔසවන වේලාව පැමිණියේය.

"අම්මි අම්මි අර... අර චූටි බබා ආයේමත් ඇවිත්.... අර බලන්න. අම්මිට පේන්නැද්ද?... අන්න ස්වාමි පුංචි බබාව අත් දෙකෙන් අල්ලන් ඉන්නවා. අන්න බබාව අල්තාරේ උඩින් තිබ්බා... ලස්සන බබෙක් අම්මි" පෙරසේම දරුවා කලබලයෙන් නැගිට මහත් සතුටින් කෑ ගසන්නට විය.

දරුවාගේ මව සහ අන් බැතිමත්හු යුහුසුළුව අල්තාරය දෙස වඩාත් උවමනාවෙන් බලන්නට වූහ. අප තරුණ පූජාප්‍රසාදිතුමාට ද මෙම සිදුවීම මහත් ප්‍රහේළිකාවකි. පෙර සේම දැනුත් සිදුවූයේ කුමක් ද? 'චූටි බබෙක් කියා කිසිවකු අල්තාරය මත සිටිනවා මම දැක්කෙත් නැහැ' පූජාප්‍රසාදිතුමා සිතන්නට විය.

දේව මෙහෙය අවසන් විය. බැතිමත්හු හුන් තැනම සිට දරුවාගේ කෑ ගැසිල්ලේ සිද්ධිය ගැන ස්වකීය අදහස් බෙදා ගන්නා අතර මව දරුවා ද කැටුව මීසම් පාලක පියතුමා මුණ ගැසී අරුම පුදුම සිදුවීම පවසා සිටියාය. එතුමා දරුවා දෙස බලා ප්‍රීතියට පත් වී, නිතරම දිව්‍ය පූජා යාගයට දරුවා ද සමඟ පැමිණෙන ලෙස දන්වා සිටියේ ය.

"මේ නම් එකත් එකටම මගේ පූජාත්වරය ගැන තිබෙන සැකය නැති කිරීමට දෙවියන් වහන්සේ පෙන්වපු ප්‍රාතිහාර්යයක් වෙන්න ඕනේ" තරුණ පූජාප්‍රසාදිතුමා සිතන්නට විය.

එහෙත් තම සැකය සම්පූර්ණයෙන් ම පහව ගොස් නැති බව පූජාප්‍රසාදිතුමාට හැඟුණි. එහෙයින් පුංචි පරීක්ෂණයක් කර බලන්නට එතුමා තීරණය කෙළේය. අරුම පුදුම දර්ශනය දුටු දරුවා දිව්‍ය පූජාවට පැමිණ සිටි දිනයක්, ඒ සඳහා තෝරාගනු ලැබීය.

දිව්‍ය පූජා යාගය ඇරැඹුණි. පූජාප්‍රසාදිතුමා පූප තුනක් රැගෙන දේව මෙහෙයට පැමිණියේ ය. පූප දෙකක් කැප කර අනෙක ඒ අසළම තැබීය. ශුද්ධවූ දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ සැදැහැවතුන් අතර බෙදා දීමෙන් අනතුරුව, පූජා ප්‍රසාදිතුමා කුඩා දරුවා ව අල්තාරය වෙත කැඳවීය.

"ජේසු බබා ඉන්නේ කොයි පූපයේ ද?" පියතුමා විමසීය. "මෙන්න අර චූටි බබා.... මේ මේ.... එයා මං දිහා බලාගෙන ඉන්නවා" මහත් ආනන්දයෙන් දරුවා කෑ ගැසීය. "එතකොට පුතා මේ පූපයේ ඉන්නේ කව්ද?" කැප නොකළ පූපය දෙසට ඇඟිල්ල දිගු කළ පූජාප්‍රසාදිතුමා යළිත් ඇසීය. "කවුරුත් නැහැ. ඒකෙ මුකුත් නැහැ" දරුවා සැණෙකින් පිළිතුරු දුන්නේ ය.

අප තරුණ පූජාප්‍රසාදිතුමාගේ සතුට පිටාර ගලන්නට විය. එතුමාගේ සැකය හා භය සදහටම පහව ගියේය. එතුමා සිය දැත් ස්වර්ගය දෙසට ඔසවා දෙවි මහෝත්තමයාණන්ට තුති ප්‍රශංසා කළේය.

**(ගරු පිලිප් සී. දිසානායක නි.ම.නි. පියතුමාණන් විසින් රචිත "මුවා වූ ජේසුගේ දර්ශන" පොතෙන් උපුටා ගැනුණි)**

---

දේව වචනයෙන් හික්මීම් ප්‍රදීපය

## ධර්ම සංග්‍රහය

**පසුගිය සතිය හා සබැඳේ....**

"කෙනෙකුට අපහාස වන දේ තැන් තැන්වල නොකියන්න. කුඩුකේඩු කම් නොකරන්න. චපල සිත් හෝ වංක සිත් ඇති කර නොගන්න. වංකකම "මරණයේ මලපත්" වැනි ය (හිතෝපදේශ 21:6). නුඹේ වචන වංක හෝ කුහක විය යුතු නොවේ. නමුත් ඒවා ක්‍රියාවෙන් තහවුරු කළ යුතුවේ.

ලෝභ හෝ බලහත්කාරකමින් උදුරා ගන්නා හෝ වංචනික හෝ ද්වේෂ සහගත හෝ මානාධික නොවන්න. නුඹගේ අසල්වැසියාට විරුද්ධව රහස් කුමන්ත්‍රණ නොකරන්න. කිසිම පුද්ගලයකුට වෛර නොකරන්න. සමහරුන්ට තරවටු කරන්න. අනෙක් අය උදෙසා යාච්ඤා කරන්න. එමෙන්ම නුඹගේ ජීවිතයටත් වඩා වැඩියෙන් අන්‍යයන්ට ආදරය කරන්න.

මාගේ දරුව, සියලුම දුෂ්ටකම් වලින් සහ ඊට සමාන දේවල් වලින් පලා යන්න. පහසුවෙන් කෝපයට පත් නොවන්න. එම හේතුව කෝපය මිනීමැරීමකට හේතු විය හැකි වීමයි. ඊර්ෂ්‍යා සහගත හෝ කලහයට පොළඹවන සුළු හෝ අපරික්ෂාකාරී නොවන්න. මේ සැම දෙයක්ම මිනීමැරීමට හේතු සාධක වේ.

මාගේ දරුව, රාගාශාව ඇති නොකරගන්න. රාගය කාමයේ වරදවා හැසිරීමට හේතු වේ. අප්‍රසන්න වචන හෝ රාගයෙන් බැලීම නොකරන්න. මේ සැම දෙයක්ම පරදාර සේවනය ව්‍යාප්ත කරයි.



සභා පියවරු 45 කොටස

**මහාචාර්ය ඇන්ටන් මීමන විසිනි**

### අපෝස්තුළුවරු දොළොස් දෙනාගේ ඉගැන්වීම හෙවත් ඩිඩාකේ - 3

මාගේ දරුව දේවාරූඪයෙන් පේන කියන්නෙක් නොවන්න. එයින් සැබෑ දෙවියන් වහන්සේව අතහැරීමක් සිදුවේ. වශී ගුරුකම් කරන්නෙක් හෝ ජ්‍යොතිෂ ශාස්ත්‍රඥයෙක් හෝ මායාකාරයෙක් නොවන්න. එමෙන්ම එවැනි දේවල් දැක බලා ගැනීමට හෝ ඒවාට ඇහුම්කන් දීමට කිසිදු ආශාවක් ඇති කර නොගන්න. මේ සැම දෙයකින්ම සැබෑ දෙවියන් වහන්සේව අත්හැර දැමීම තවත් ව්‍යාප්ත වේ.

මාගේ දරුව බොරුකාරයෙක් නොවන්න. බොරු කීම, සොරකම් කිරීමට මාර්ගය සලසයි. ධන තෘෂ්ණාව හෝ පුහුමාන්නය ඇති කර නොගන්න. මේ සැම දෙයක්ම සොරකම් කිරීම ව්‍යාප්ත කරයි.

මාගේ දරුව මැසිවිලි නගන්නෙක් නොවන්න. මැසිවිලි නැඟීම දේවාපහාසයට මාර්ගය සළස්වයි. හිතුවක්කාර හෝ දුෂ්ට සිත් ඇත්තකු නොවන්න. මේ සැම දෙයක්ම දේවාපහාසය ව්‍යාප්ත කරයි.

නිහතමානී වන්න. මන්ද "නිහතමානී ගුණ ඇත්තෝ භාග්‍යවන්තයෝ ය. ඔව්හු දේශය උරුම කර ගන්නෝ ය." (මතෙව් 5:5). ඉවසිලිවන්ත, කරුණාවන්ත, අහිංසාකාරී, සන්සුන් සහ යහපත් වන්න. සැම විටම "මාගේ වචනයට කීකරු වන මිනිසා මට ප්‍රියමනාප වේ." (යෙසායා 66:2).

පුහු ආඩම්බරයට ඉඩ නොදෙන්න, එසේ නොවුනහොත් උඩඟුකමට ඔබ ගොදුරු විය හැකිය. උසස් සහ බලවත් අයව ආශ්‍රය නොකරන්න. නමුත් දැහැමි සහ නිහතමානී අය සමඟ කාලය ගත කරන්න.

ලබන සතියට

---

**ජපමාලය ගැන කතා කිරීමේ දී නිසඟයෙන්ම අපට සිහිපත් වන්නේ, දේව පුත්‍රයාණන්ගේ මෑණියන් වීමට මහිමෝත්තම දෙවි පියාණන් විසින් තෝරා ගන්නා ලද "මරිය තුමිය යි." විශ්වය පුරා ජපමාල දැහැන ප්‍රචලිත වූයේ එතුමිය මඟිනි.**

එතුමියගේ දර්ශනය වීම් කිහිපයකම තේමාව වූයේ "පශ්චාත්තාපය" සහ "යාච්ඤාව" යි යාච්ඤාව සඳහා මරිය තුමිය හඳුන්වාදුන් මෙවලම "ජපමාලය"යි. එතුමිය ගේ ප්‍රමුඛ දර්ශනය වීම් කීපයකම "ජපමාලය" ද වීම එය සාක්ෂාත් කරයි.

ශ්‍රී ලංකාව තුළ ද දශක කීපයකට පෙර "ජපමාලය" පවුල එකමුතු කරන "යාච්ඤාදාමය" විය. අද වැඩිහිටියෝ එදා ළමා වියේ දිනපතා සන්ධ්‍යාවේ දී නිවෙස්වල පවුල් ජපමාලයේ ඉමිහිරි හඬ නැංවූහ. පවුලේ මව එහි පෙරමුණේ විය; පියා ද බොහෝ විට ජපමාලය උච්චාරණය සඳහා පැදුරට ආවේය; දරුවන්ට එය අනිවාර්ය විය. මොන වැඩ තිබුණත් පවුලේ සාමාජික සාමාජිකාවන්ට පවුල් ජපමාලය මගහරින්නට නොහැකි විය. එදා "අමිල පඬුර" මගින් දිනට නියමිත ජපමාල අභිරහස් ද මෙහිදී උච්චාරණය කෙරිණි. පවුල් ජපමාලයෙන් පසුව සැවොම එකිනෙකාට "ජේසු පිහිට" පැතූහ. මෙම "අඩ පැය" එදා පවුලට ආශිර්වාදය ගෙනාවේය. පවුලේ සැම දෙනා අතර මෙමගින් පුදුමාකාර බැඳීමක් ඇති විය. එදා "දේව කැඳවීම්" වලට තෝතැන්න වූයේ" "පවුල් ජපමාලයයි" එයට අද පූජක පැවදි ඇතුළු සභා ශ්‍රේෂ්ඨයන් ද සාක්ෂි දරනු නොඅනුමානය. යාච්ඤාවේ ජීවිතයක් නොමැති පවුලකින් දේව කැඳවීම් ඇතිවීම උගහට බව රහසක් නොවේ.

"පවුල් ජපමාලය"ට විනය කැටුනේ අප රටට විවෘත

# ජපමාලය



ආර්ථිකය හරහා පැමිණි "රූප පෙට්ටිය" නිසාවෙන් බව තුඩ තුඩ කියැවෙයි. සත්‍යය ද එයම ය. ක්‍රමයෙන් "ජපමාල දැහැන" වියැකී ගියේය; රූපවාහිනියේ "ටෙලි නාට්‍යය රැල්ල" ඉහලට ආවේය. නාලිකා සැමකක්ම තරගයට මෙන් "ටෙලි නාට්‍යය" සැඳෑ යාමයේ සිට රාත්‍රී 9.30 - 10.00 දක්වා ප්‍රදර්ශනය කරන්නට පටන් ගත්තේ ය. වාණිජ අරමුණු සාක්ෂාත් කරගන්නට රූපවාහිනී නාලිකා රොත්ත ගත් වෑයම සාර්ථක වූයේය. රූපවාහිනියට දොස් තබා අත සෝදා ගත හැකි ද? නොහැක්කේමය.

විශේෂයෙන් කතෝලික පවුලේ නියමුවන් වන දෙමාපියන් ප්‍රමුඛවම මෙයට වගකිව යුතුය. මන්දයත් දෙමාපියන්ට ද සැම දෙයටම "සැළකිල්ලක්" අවශ්‍යය. යාච්ඤාවම ද එසේමය. උවමනාව ඇත්නම් "පවුල් ජපමාලය" යළි "ජීව ගන්වන්නට" අපට බැරි නැත. රූපවාහිනිය අඩුම වශයෙන් "අඩ පැය"ක් අක්‍රීය කර "යාච්ඤාව" සඳහා යොමු වන්නට පළමුව පවුලේ දෙමාපියන් පෙරමුණ ගත යුතුය. දරුවන් ඊට නතුකර ගන්නට බැරිකමක් නැත. ඉතා කෙටි ශු. බයිබලීය පාඨයක් "ගීතාවලිය උපයෝගී කර ගත හැකිය) කියවා මෙනෙහි කිරීමක් කළ හැකි නම් පවුලේ "යාච්ඤාවේ ජීවිතය" ට එය තවත් ශක්තියකි. අවශ්‍ය වන්නේ "ඕනෑකම" යි.

"පවුලේ යාච්ඤාව" ජීව ගැන්වුණහොත් එහි යහපත පවුලටමය. මෙය කාගෙ 'වත් උවමනාවට ම නොව පවුලේ උවමනාවට ආරම්භ වුවහොත් වඩාත් "ඵලදායි වනු නොඅනුමානය.

මූලධර්මවාදීන්ට කතෝලික සැදැහැවතුන් ග්‍රහණය වන අයුරු දකිමින් ඇස් කන් වසාගෙන සිටීම තවත් පසුතැවිලි වීමට හේතුවකි. පවුල, ඒකකය, කොට්ඨාශය, මීසම තුළ සැදැහැවතුන් පණගැන්විය බලගැන්විය යුතුය; එයට හොඳම මෙවලම "ජපමාලය"යි

විවිධ වැඩසටහන් මඟින් ජපමාලය වඩ වඩාත් පවුල් අතරට ගෙන යන්නට හැකි අයුරින් දායක වෙමු. ජපමාල නොමිලයේ බෙදා දීමේ වැඩ පිළිවෙල විස්තර "ළමා ප්‍රදීපය" තුළ පළවුණි.

ළමා පරපුර ජපමාලයට හුරු කරවන්නට එය කදිම, අගය කළ යුතු වැඩපිළිවෙලකි. අද සමාජයේ දකින්නට ඇති වින්නැහියෙන් වියැකෙන්නට දෙවිඳු යදිමු. "ජපමාල රාජේශ්වරියනි! අපට පිහිට වුව මැනව! ඔබතුමිය අප පවුල් යළි යාච්ඤාවට යොමු කරනු මැනව!

✍ **සී. ආර්. ඩික්සන් ඇන්ටනි**

ජන වන්දනාව

# යාම යැදුමට සහ පොදු යැදුමට අත්වැලක් ලෙසින්

## පළමු සතිය සිකුරාදා සැඳෑ යැදුම

### 46 වැනි ගීය

පසුගිය සතිය හා සබැඳේ

<u>ගිගිරුම් දුන් සේක :</u>
ශු. බයිබලීය සම්ප්‍රදායන් තුළ දෙවියන් වහන්සේගේ "හඬ" ඉදිරිපත් කෙරෙන්නේ උන්වහන්සේගේ දිව්‍ය අනාවරණයන් උත්තරීතර බල මහිමයත් ප්‍රකාශ කරන සංකේතයක් විලසිනි (ජෝබ් 37:4-5, ගීතා 68:33)

<u>සව්බලැති සමිඳාණෝ :</u>
හෙබ්‍රෙව් බසින් මේ සඳහා යෙදෙන "සබාඕක්" යන්න "හමුදාවන්ගේ සමිඳාණෝ" ලෙස ද පරිවර්තනය වේ. එය පැරණි ලෝකයේ යුද සම්ප්‍රදා ශෛලිය ඇසුරින් දෙවියන් වහන්සේගේ මැදහත්වීම ප්‍රබලව විදහා දක්වයි. (1 සාමුවෙල් 1:3).

**(ඇ) වගන්ති 8 - 11:**
මෙම අවසන් කොටස සම්පිණ්ඩනය කොට දක්වන්නේ දෙවියන් වහන්සේගේ විශ්ව පරිපාලනය යටතේ අයහපත් බලවේග දුරු වී සාමයේ හා සංහිඳියාවේ පසුතලයක් උදාවීමයි.

<u>පලිහ ගින්නෙන් දවන සේක:</u>
සතුරු බලය තුරන් කරලීම හැඟවීමට යෙදෙන මෙම භාෂා භාවිතය විවිධ බයිබලීය ග්‍රන්ථවල දිස්වේ (එසකි. 39:9, ජෝෂුවා 11:6).

<u>දෙවිඳුන් බව සිතට ගන්න :</u>
දිවැසිවර ප්‍රකාශනවල කැපී පෙනෙන තේමාවක් වන්නේ උත්තරීතර දෙවියන් වහන්සේ සිය ජනතාවට සමීපව වැඩ විසීමේ සත්‍යතාව පිළිගැනීම සඳහා කෙරෙන ඇරියුමයි. (ජෙරමි 16:21, එසකි. 6:10).

**යැදුම :**
සියලු ශක්තියේ සහ රැකවරණයේ උල්පත වන දෙවි ස්වාමින් වහන්ස ඔබවහන්සේ ගැලවීමේ ඉතිහාසය පුරා දේව ජනතාවට දක්වන අසීමිත ආදරය හා රැකවරණය වෙනුවෙන් හෘදයාංගමව තුති පුදමු. අපගේ දෛනික ජීවිතයෙහි එළඹෙන විවිධවූ ගැටලු වලට මුහුණ දීමේ නිරතුරු ඔබගේ සෙනෙහෙබර රැකවරණයට යොමුවීමට වරම් දෙනු මැනව. නිරතුරු ඔබගේ වරප්‍රසාදය මත යැපීමට අපට මඟ පෙන්වා වදාළ මැනව. ආමෙන්.

## පළමු සතිය සෙනසුරාදා උදා යාම යැදුම

### 119 වැනි ගීය

මුළු ගීතාවලිය ග්‍රන්ථයේම දීර්ඝතම ගීය ලෙස හඳුන්වාදිය හැකි මෙම ගීයේ පද 176 කී. ගී වර්ගීකරණය තුළ මෙය අයත්වන්නේ ප්‍රඥා ගී කාණ්ඩයටයි. මෙම ගීයේ ලේඛන ආකෘතිය තුළ ගැඹුරු දේව ධාර්මික දැක්මක් මෙන්ම නිර්මාණශීලි කාව්‍යමය ස්වරූපයක් දැකිය හැකිය. හෙබ්‍රෙව් භාෂාව අකුරු 22 කින් සමන්විත වූවකි. මෙම 119 වැනි ගීයේ කොටස් 22 ක් ඇති අතර එක් එක් කොටස හෙබ්‍රෙව් හෝඩියේ අකුරු අනු පිළිවෙලට අනුව ආරම්භ වීම සුවිශේෂී ගුණාංගයකි.

මෙම ගීයේ තේමාව වන්නේ දෙවියන් වහන්සේගේ ව්‍යවස්ථාවේ උතුම්කම සහ මිනිස් දිවිය කෙරෙහි එහි ඇති කේන්ද්‍රීය බලපෑමයි. ඉහත ආකෘතිය තුළින් ගීතිකා කතුවරයා දෙවියන් වහන්සේගේ ව්‍යවස්ථාව පිළිබඳ පූර්ණ සම්පිණ්ඩනයක් ඉදිරිපත් කරන බව හඟවයි. මේ විවිධ ගී පද වලින් විදහා දැක්වෙන්නේ ඊශ්‍රායෙල් ජනතාවගේ ආගමික පැවැත්මට අදාළ වූ ආධ්‍යාත්මික, ශීලධාර්මික ප්‍රතිපත්ති සහ නියෝගයන් ය. අපගේ උදා යාම යැදුම සඳහා තෝරාගෙන ඇත්තේ වගන්ති 145 - 152 දක්වා කොටසයි. එහි මූලික තේමාව වශයෙන් "ගැලවීම සඳහා සමිඳුන් වෙත "ආයාචනය" යන්න දැක්විය හැකිය.

**ලේඛන සැලැස්ම :**
ගීයේ කොටස් දිස්වන්නේ අන්තර්ගතය අනුව එකිනෙක හා සබැඳිව ගලා යන දාමයක් ලෙසිනි. සම්බන්ධ කරන හුය වන්නේ "සමිඳුන්ගේ පනත් නොහොත් ව්‍යවස්ථාවයි : ව. 1- 8: ව්‍යවස්ථාවේ උතුම්කම, ව. 9- 16: ව්‍යවස්ථාවට කීකරුවීම; ව. 17 - 24: විනය මාර්ගයෙහි සතුටු වීම. ව. 25 - 32: ව්‍යවස්ථාව ඉටුකිරීමේ අධිෂ්ඨානය; ව. 33-40: ව්‍යවස්ථාව අවබෝධ කරගැනීමට යැදුම; ව. 41- 48: ව්‍යවස්ථාව කෙරෙහි විශ්වාසය; ව. 49-56: ව්‍යවස්ථාව කෙරෙහි භක්තිය; ව. 57-64: ව්‍යවස්ථාව වෙත ගරු බිය; ව. 65- 72:ව්‍යවස්ථාවේ අගය; 73-80: ව්‍යවස්ථාවේ සාධාරණත්වය; ව. 81-88. ව්‍යවස්ථාව තුළින් ගැළවීම; ව. 89-96: ව්‍යවස්ථාව කෙරෙහි බලාපොරොත්තුව; ව. 97-104: ව්‍යවස්ථාව වෙත ලැදියාව; ව. 105-112: ව්‍යවස්ථාවෙන් එළිය; ව. 113-120: ව්‍යවස්ථාවෙන් සුරක්ෂිත බව; ව. 121-128. ව්‍යවස්ථාවට කීකරු වීම; ව. 129-136: ව්‍යවස්ථාව පිළිපැදීමට ආශාව; ව. 137-144: ව්‍යවස්ථාවේ සාධාරණත්වය; ව. 145-152: ව්‍යවස්ථාව තුළින් ගැලවීම ලබාගැනීමේ යැදුම; ව. 153- 160: ව්‍යවස්ථාව අනුකූලව උපකාර පැතීම ; ව. 161 - 168: ව්‍යවස්ථාවට කැපවීම; ව. 169-176 ව්‍යවස්ථාව තුළින් දෙවි සරණ අයැදීම:
අදට නියමිත උදායාම යැදුමට අදාළ කොටස වන ව. 145 - 152 හෙබ්‍රෙව් භාෂා හෝඩියේ 19 වැනි අකුර හා සබැඳිය. එයට විලාප ගී ශෛලියකට සමීප බවක් දැක්වෙන අතර සමිඳුන්ගේ ව්‍යවස්ථාවෙන් බැහැර වූ අයට උරුම වන දුඃඛිත අනිටු විපාක ඉන් විස්තර වේ.




ශුද්ධ ලියැවිලි වසර

**(29)**

**ගරු දයා ෂෙල්ටන් වැලිකඩආරච්චි පියතුමා**

### විග්‍රහය සහ අරුත (වගන්ති 145 - 152)

<u>මුළු හදවතින් :</u> හෙබ්‍රෙව් බසින් (බකොල් ලේව්) දැක්වෙන අන්දමට මෙය යාච්ඤාවේ ආකල්පයක් පෙන්වයි. එය මූලිකව ගීතිකා කතුවරයා දෙවිඳුන් හා පවත්වන ඇතුළාන්ත සබැඳියාව ඉස්මතු කොට දක්වයි. (ද්වීතිය 6:5, ගීතා 57:8).

<u>ඔබේ අණ පනත් :</u> මෙය විශේෂයෙන් ගිවිසුම් ජීවිත පැවැත්මට අදාළය. දෙවි සමිඳුන්ට ආදරය කරන්නා ගිවිසුමේ කොන්දේසි (හෙබ්‍රෙව් බසින් "එදොත්") නිරතුරුව ආරක්ෂා කරන්නේ ය.

<u>ශික්ෂා පද :</u> මෙය ව්‍යවස්ථාවේ ප්‍රායෝගික පැත්ත පෙන්නුම් කරයි. ව්‍යවස්ථාවේ මූලික දැක්මට අනුව විවිධ තත්ත්ව යටතේ දී ශීලධාර්මිකව හැසිරිය යුතු අන්දම මෙයින් හැඟවේ.

<u>අළුයමට පෙර :</u> දේව ජනතා ආධ්‍යාත්මිකත්වයේ උල්පත වූයේ යැදුම් පැවැත්මයි. සැදැහැවතා උදාවන හැම දිනයක් ම දෙවි සමිඳාණන්ගේ සරණය මත යැපෙමින් ආරම්භ කරන අන්දම මින් ප්‍රබලව නිරූපණය වේ (ගීතා 3:5).

<u>ප්‍රේමය ස්ථිර නිසා :</u> ශු. බයිබලීය ලේඛනවල දෙවියන් වහන්සේගේ අනන්‍යතාව හඟවන එක් ගුණාංගයක් වන්නේ උන්වහන්සේගේ ස්ථිරසාර ප්‍රේමයයි (හෙබ්‍රෙව් බසින් "හෙසෙද්") ගිවිසුම් පැවැත්ම තුළ දෙවියන් වහන්සේගේ අචල විශ්වාසවන්ත බව හා මිනිසා වෙත දක්වන කොන්දේසි විරහිත ප්‍රේමය මෙයින් වඩාත් ප්‍රබලව ධ්වනිත වේ.

ලබන සතියට

---

**ගරු හෙන්රි සිල්වා පියතුමා** 54




## පුරාණ ගිවිසුම තුළ දිවැසිවරු

පසුගිය සතිය හා සබැඳේ

1. අසිරිමත් උපදේශකයාණෝය -
මින් අදහස් වන්නේ මෙසියස් තුමා දෙවියන් වහන්සේ වෙතින් උපදෙස් ලබන බව හා මිනිස් ප්‍රඥාව මත පමණක් විශ්වාසය නොතබන බවත්ය. තවද මෙහි ප්‍රතිඵලයක් ලෙස ඔවුන් වහන්සේ මිනිසාගේ උපදේශකයාණන් වන බවය. මිනිසාට මඟ පෙන්වන බවය.

2. ප්‍රතාපවත් දෙවිතුමාණෝය -
යෙසායා වෙනත් ස්ථාන වල දෙවියන් වහන්සේ සතු අතිඋත්කෘෂ්ඨ භාවය පිළිබඳව සඳහන් කරන බැවින් (යෙසායා 6, 3-4) 'ප්‍රතාපවත් දෙවිතුමාණෝ' යන ව්‍යවහාරය මිනිසකු හැඳින්වීමට මෙහිදි භාවිත කිරීම මවිතයට කරුණක් වෙයි. බොහෝ විට මෙම ව්‍යවහාරය මඟින් දිවැසිවරයා අදහස් කළේ මෙසියස් තුමා මගින් ගොඩ නැගෙන්නට නියමිත රාජ්‍යය ආශ්‍රිතව ඔවුන් වහන්සේ දේව බලයෙන් සන්නද්ධ වීම ය.

3. සදාතන පියාණෝය -
පුරාණ ගිවිසුම තුළ මෙම ව්‍යවහාරය භාවිත වන්නේ දෙවියන් වහන්සේ සඳහා පමණෙකි. බොහෝවිට යෙසායා මෙම යෙදුම අවබෝධ කර ගන්නේ මෙසියස් තුමා මගින් ගොඩනැගෙන්නට නියමිත සදාතනික රාජ්‍යය ය.

4. සාමයේ කුමාරයාණෝය -
සාමය සඳහා වන හෙබ්‍රෙව් වචනය, 'ශාලොම්' ය. ඉන් අදහස් වන්නේ කෙනකු තම සාධාරණ බලාපොරොත්තු හා අපේක්ෂාවන් මුදුන් පත්වීම හේතු කොට ගෙන අත්දකින සතුට හා සන්තුෂ්ටියයි.

හත්වන වගන්තිය :
සාමය සඳහා අවශ්‍ය වන අනිවාර්ය කොන්දේසි දෙකක් ද සමඟ එය තවදුරටත් විස්තර කෙරේ. එනම්, යුක්තිය හා ධර්මිෂ්ඨකමයි. යුක්තිය හෙවත් සාධාරණත්වය යනුවෙන් අදහස් වන්නේ සෑම පුද්ගලයකුටම, ඔහුට හෝ ඇයට ලැබිය යුතු දෙය දීමය. ධර්මිෂ්ඨකම යනු දෙවියන් වහන්සේගේ කැමැත්ත ඉටු කිරීම සඳහා එය සොයා දැන ගැනීමය. මෙසියස් තුමා දාවිත්ගේ පෙළපතෙන් පැමිණෙන බවද මෙම වගන්තිය තවදුරටත් පෙන්නුම් කරයි.

**යෙසායා 11/1-9 :**
පළමුවන වගන්තිය :
"දාවිත්ගේ රජ පෙළපත නමැති වෘක්ෂයෙන් රාජාංකුරයක්". යම් ආකාර චිත්ත රූපයක් නැතහොත් රූපාලංකාරයක් මෙහි දක්නට ලැබේ. දාවිත්ගේ පෙළපත, සමාන කෙරෙන්නේ කපා දමන ලද නමුත් එහි මුල් කඳ කොටස තවම වියළි පොළොවෙහි සවිව තිබෙන ගසකටය. මෙය බලාපොරොත්තු ශූන්‍යත්වයේ දර්ශනයකි. මෙම වියළි කඳෙන් අංකුරයක් හට ගන්නා බවද එම චිත්ත රූපයේම සඳහන් කරන්නේ සිතා ගත නොහැකි තරම්වූ බලාපොරොත්තුවක් ජනිත කරමිනි. මෙසියස් තුමා පිළිබඳ බලාපොරොත්තුව මෙම දෘශ්‍ය අත්දැකීමට සමාන කෙරේ. ජෙස්සේ දාවිත්ගේ පියා වූ බැවින්, ජෙස්සේගේ කඳ යනුවෙන් හැඳින්වෙන්නේ දාවිත්ගේ පෙළපතය.
දෙවන වගන්තිය :
"සමිඳුන්ගේ ආත්මානුභාවය" පුරාණ ගිවිසුම තුළ 'රුආහ් යාහ්වේ' යනුවෙන් අදහස් වන්නේ, මැවීමේ හා ගැලැවීමේ දේව ක්‍රියාකාරිත්වයයි. දිවැසිවරුන්ට හා පාලකයනට තම දූත මෙහෙවර ක්‍රියාත්මක කිරීම සඳහා සමිඳුන්ගේ ආත්මානුභාවය දානය කෙරිණි. (ජොචල් 2, 28-29, 1 සාමුවෙල් 16, 13)

"සමිඳුන්ගේ ප්‍රඥාව" -
ප්‍රඥාව (හොක්මා) යන්නෙහි අදහස, නිවැරදිව හා යුක්ති සහගතව ජීවිතයට මුහුණ දීමේ හැකියාව ය.

| | | |
|---|---|---|
| තේරුම් ගැනීම | - | (දේව කැමැත්ත)තෝරාබේරා ගැනීමේ හැකියාව |
| අනුශාසනා බුද්ධිය | - | මඟ පෙන්වීමේ හැකියාව |
| බලය | - | ඇතුලාන්තයෙන් පැන නගින අධිකාරී බලය |
| දැන ගැන්ම | - | අත්දැකීමෙන් ලබන දැනුම |
| දේව ගරු බිය | - | දේව අණ පණත් පිළිපැදීම මඟින් ඔවුන් වහන්සේට ගරු බිය දැක්වීම |

තෙවන වගන්තිය :
මෙසියස් තුමා ඇසට පෙනෙන සැටියට හෝ කනට ඇසෙන සැටියට හෝ විනිශ්චය නොකරන, සාධාරණ විනිසකරුවෙකි.

හතර වන වගන්තිය :
ඔවුන් වහන්සේ ධර්මිෂ්ඨයනට යහ විපාක ද, අධර්මිෂ්ඨයනට දඬුවම් ද පමුණුවන බැවින් ඔවුන් වහන්සේ සාධාරණ හා යුක්ති සහගත වන සේක.

ලබන සතියට....

---




# "අපට විපක්ෂ නොවන්නා අපගේ පක්ෂයෙහිය"

## සැප්තැම්බර් 30 - සාමාන්‍ය සමයේ විසිහයවන ඉරුදින

*මෙලොව දේව රාජ්‍යය සම්පූර්ණ කිරීමේ කාර්යය ඉතා බාරදූර අභියෝගාත්මක එකක් බව ඉතා පැහැදිලිය. දේව රාජ්‍යයට වින කරන බොහෝ අසීමිත බලවේග හමුවේ කිතුනු ආකල්පය කුමක්ද? අප තනි තනිවම අපට හැකි ආකාරයකට යමක් කරනවාද නැත්නම් මෙම කාර්යයට කැඳවීම ලත් සැම දෙනා සමඟ එකමුතුව හා සාමූහිකව ශුද්ධාත්ම මඟ පෙන්වීමට අනුකූල ක්‍රියා කරනවාද යන්න සොයා බැලිය යුතුවේ.*

*ආත්මයාණන් මිනිසාට නොමසුරුව දානය කරන දෙවියන් වහන්සේගේ සැලැස්ම තුළට අපි අව්‍යාජ කිතුනු අනුගාමිකයන් ලෙස ඇතුල් වෙමු. දේව රාජ්‍යයට වින කරන යක්ෂයා හා උගේ බලවේග යන්ට විරුද්ධව සටන් කිරීමට අප ලබා ඇති කැඳවීම හා අපගේ කැපවීම ගැන අද දින මෙනෙහි කරමු.*

### දිවැසිවැකි කීම :
දිවැසිවරයකුගේ කාර්යය වන්නේ දෙවියන් වහන්සේ වෙනුවෙන් කතා කිරීමත් පෙනී සිටීමත් ය. ඔහු දෙවියන් වහන්සේගේ අතේ ක්‍රියා කරන උපකරණයකි. ඔහු කතා කරන්නේ දෙවියන් වහන්සේ වෙනුවෙනි.

### දේවාත්මානුභාවය
දෙවියන් වහන්සේ වෙනුවෙන් ක්‍රියා කරන්නට ලැබෙන විශේෂ දීමනාවකි. මිනිස් උත්සාහයෙන් කිසිදා ලැබිය නොහැකි දේව ප්‍රේමයේ තිළිණයකි. දේවාත්මානුභාවය දරන්නා ඕනෑම අභියෝගයක් ඉදිරියේ ප්‍රබල ලෙස නොසැලෙන පර්වතයක් මෙන් සිටී. විශේෂයෙන් යක්ෂයා දේව රාජ්‍යයට විරුද්ධව හිස ඔසවන විට දේව ජනතාවගේ ආරක්ෂාව සඳහාත් යක්ෂයා දමනය කිරීමටත් අවශ්‍ය වන්නේ දේවාත්මානුභාවයයි.

### යකුන් දුරු කිරීම
යක්ෂයා යනු දෙවියන් වහන්සේගේ සැලැස්මට පටහැනිව ක්‍රියා කරන්නාය. යක්ෂයා මිනිසාව කාලයෙන් කාලයට පරික්ෂාවලට හසු කරගන්න. සදාචාරය සුළුකොට සලකමින් දේව රාජ්‍යයේ වටිනාකම් හෙළා දකිමින් දුර්වලයින් තම වාසියට යොදා ගනිමින් ජාතිවාදි අදහස් හා ආගම් භේද අවුස්සාලමින් අනිත් අයගේ ජීවිත සොච්චමකට සීමා කරමින් තණ්හාවට මිනිසාව ඇද දමන්නේ යක්ෂයාය. මෙම යක්ෂයාගේ ක්‍රියා කලාපය පරාජය කරන්නට දේව රාජ්‍යයේ අවංක සේවකයන්ගේ කැපවීමේ අවශ්‍යතාවය වෙනදාටත් වඩා අද දැනේ.

### ඔබේ වැටීමට හේතුවන අවයව (අත, පය, ඇස) කපා දමන්න :
මේවා මිනිස් දිවියේ යහපත් ක්‍රියාකාරිත්වයට අත්‍යවශ්‍ය වේ. නමුත් ජේසුස් වහන්සේව සිය ජීවිතයෙන් ඈත් කරමින් හුදු නිරෝගී ශරීරයක් පසුපස්සේ හඹා යෑම පලක් නොවේ. පාපයට ගොදුරු වන්නා අසීමිතව පාපයේ මියැදෙයි. ඒ නිසා ශරීරයෙන් කොටසක් ඉවත්කර හෝ පණ බේරා ගැනීම යෝග්‍ය බව පැවසේ. පිළිකාවක් වැළඳුණු කෙනෙකුගේ ඉරණම විසඳීම සඳහා ක්‍රියා කරන්නට ගන්නා පියවර දෙස බලන විට මෙය පුදුම වීමට කරුණක් නොවේ. මෙසේ ජේසුස් වහන්සේට විරුද්ධව අප ක්‍රියා කරන විට මුලදීම සුදුසු පියවර ගැනීම නොපසුබටව කළ යුතු බව පෙන්වා දෙන්නේ ය.

ශරීරයෙන් කොටසක් ඉවත් කිරීම යන්න වචනාර්ථයට සීමා කළ යුතු නැත. ස්වර්ග රාජ්‍යයට යන බව මෙලොව දී තීරණය වේ. පාපයෙන් මිදෙන්නට කළ යුතු දේ අතපසු කළ යුතු නැත. මෙලොව දිවිය කෙටිය. එමෙන්ම එය ස්වර්ගයේ දීර්ඝ කාලීන පැවැත්මට සූදානම් වන කාල පරිච්ඡේදයකි.

✍ **ගරු උපුල් සිල්වා පියතුමා**

ජනතා හඬ

# ශ්‍රී ලංකාවේ අපරාධ වර්ධනය



**කතුතුමනි,**

අද අප රටේ සිදුවන අපරාධ සංඛ්‍යාව සිතාගන්ටවත් බැරි තරම්ය. දිනපතාම පාහේ මිනිමැරුම් කීපයක් වාර්තාවේ. එකතැන තුන්හතර දෙනා මරා දැමීමට තරම් අපරාධකරුවෝ දරුණු වී සිටිති. එසේම, දූෂණය, වංචාව, සොරකම, කාම අපරාධ අද සාමාන්‍ය දේවල් බවට පත්වී තිබේ. මීට පෙරද යම් ප්‍රමාණයකට මෙම අපරාධ සිදුවූවත් අදවනවිට එය මහ පරිමාණයෙන් සිදුවන බව පෙනෙන්නට තිබේ.

මෙම තත්ත්වය විග්‍රහකර බැලීමේදී මීට ප්‍රධාන වශයෙන් බලපා ඇති හේතු සාධකනම්, ස්වාධීන පොලිස් කොමිසම, ස්වාධීන රාජ්‍ය සේවා කොමිසම, ස්වාධීන මැතිවරණ කොමිසම, ස්වාධීන අධිකරණ කොමිසම දහඅටවෙනි ව්‍යවස්ථා සංශෝධනය මගින් දේශපාලනීකරණය කර තිබීමය. කිසිදු දේශපාලන සම්බන්ධකමක් නොමැතිව හුදෙක් නිදහස්ව, ස්වාධීනව. සුදුසුකම් මත පමණක් කළ යුතු රාජ්‍ය සේවයේ සහ අර්ධ රාජ්‍ය සේවයේ පත්කිරීම් දේශ පාලන සම්බන්ධතා මත කිරීම. පොලීසියට නීතිය අපක්ෂපාතීව, නිර්භයව ක්‍රියාත්මක කිරීමේ නොහැකියාව, මැතිවරණ කටයුතු ස්වාධීන නොවීම. අද රහසක් නොවේ. නියමිත කාලය අවසන්වීමට පෙර පළාත් සභා කීපයක් විසුරුවා හැර මැතිවරණ පැවත්වීම කිසිසේත් ජනතාවට පලදායක ක්‍රියාදාමයක් නොවේ. එය හුදෙක් නායකයන්ගේ දේශපාලන හේතුන් මත පමණක් ක්‍රියාත්මක කර ඇත.

ඇතැම් අපරාධ නඩු විභාගවෙමින් තිබියදීම නීතිපති විසින් ඒවා අස්කර ගැනීම් අද දක්නට ලැබේ. ඊට දේශපාලනමය හේතු බලපා ඇතිබව කවුරුත් දන්නා කරුණකි. මේ අනුව සළකා බැලීමේදී ජන ජීවිතයට වෙසෙසින් බලපාන කාර්යය සාධක ආයතන දේශපාලනීයකරණය කිරීමේ ප්‍රවනතාවයක් අද දක්නට ලැබේ. දේශපාලනයට කිසිලෙසකින් සම්බන්ධ නොවී ස්වාධීනව සිටිය යුතු පුද්ගලයින් සහ ආයතන සහ සංවිධාන දේශපාලනයට සම්බන්ධ වීම ජන ජීවිතයට අයහපත් බලපෑම් ඇති කරයි. මේ සැමට වඩා මිනිමැරුම් වැනි අපරාධ වර්ධනය වීමට හේතුව අධිකරණ ක්‍රියාදාමයකින් මරණීය දණ්ඩනය නියම කරන ලද

අපරාධකරුවන්ගේ මරණ දඬුවම ක්‍රියාත්මක නොකිරීමය. මෙය කෙළින්ම එම අපරාධවලට ආධාර සහ අනුබල දීම හා සමානය. එක් අතකින් අධිකරණ තීන්දු ක්‍රියාත්මක නොකිරීම අධිකරණය හැල්ලුවට ලක් කිරීමක් බඳුය. එම නිසා අප රටේ මිනිමැරුම්, අපරාධ අඩු කිරීමට නම් සමස්ත මහජන සංවිධාන සහ ආගමික සංවිධාන වහාම මරණීය දණ්ඩනය ක්‍රියාත්මක කිරීමට රජයට බලපෑම් කළ යුතුය. මෙතරම් කාලයක් මරණීය දණ්ඩනය ක්‍රියාත්මක කිරීමේ අවශ්‍යතාවය අදාළ බලධාරීන්ට නොපෙනීම රටේ අභාග්‍යයකි. එය අපරාධ වර්ධනයට බෙහෙවින් හේතුවී තිබේ.

**ඩී. ඇන්ටනි වික්‍රමසිංහ**
පමුණුගම

## මීගමු කලපුව විනාශ කිරීමට එරෙහිව නැඟී සිටිය යුතුයි

**කතුතුමනි,**

මීගමු කලපුව ධීවර ජනතාවට ලැබී ඇති මා හැඟි දායාදයක්. මේ අසිරිමත් මීගමු කලපුවෙන් ජීවනෝපාය කර ගන්නා පවුල් සංඛ්‍යාව 5000 ක් 6000 පමණ වේ. මේ වන විට මෙම කලපුව බරපතළ ලෙස විනාශ වෙමින් පවතී. කලපුව ගොඩකිරීම සහ එහි ආශ්‍රිතව ඇති කඩොලාන විනාශ වෙමින් පවතී. කලපුවේ සමතුලිතතාවය ආරක්ෂා කිරීමට ඇති එහි කඩොලාන ශාඛා විනාශ කරමින් සුපිරි සංචාරක හෝටල් ඉදිවෙමින් පවතී. එසේම කලපුවේ විශාල භූමි ප්‍රමාණයක් මේ වන විට ගොඩකර නිවාස ව්‍යාපෘතියක්ද ආරම්භ කර ඇත.

මීගමු කලපුව ආශ්‍රිතව ඇති කඩොලාන විනාශකරමින් සංචාරක ලැගුම්පල ඉදිකිරීම මහා අපරාධයක් බව කලපුව අවට ධීවර ජනතාව පවසති. විශේෂයෙන් මත්ස්‍යයන් බිත්තර දමන්නේ කලපුව ආශ්‍රිත ඉවුරේ නිසා මත්ස්‍යයන් වඳ වී යාමේ තර්ජනයක් පවතින බව ඔවුහු පෙන්වා දෙති. මෙමම කලපුව විනාශ කිරීමට එරෙහිව කතෝලික සභා නායකයන් ධීවර ජනතාව සමඟ ඉදිරියට පැමිණ විනාශ වෙමින් පවතින මීගමු කලපුව රැක ගැනීමට කටයුතු කළ යුතුයි.

**ඩබ්ලිව්. සිරිල් ටයිටස් පෙරේරා**
කටුනායක

## අවසන් කටයුතු ගෞරව ලෙස කර ගැනීමට ඉඩදෙන්න

**කතුතුමනි,**

හැඳල ලාදුරු රෝහලට පමණක් සීමා වූ හේකිත්ත සුසාන භූමිය පසු කාලීනව හැඳල ලාදුරු රෝහලේ රෝගීන් ප්‍රමාණය අවම වී යාමත් සමගම එය පොදු සුසාන භූමියක් ලෙස පරිහරණය කිරීමට හැඳල ප්‍රාදේශීය සභාවෙන් නෛතිකව අවසර ලබාදෙන ලදී

ඒ අනුව මෙම සුසාන භූමිය තුළ ලාදුරු රෝගීන් ඇතුළු බෞද්ධ, හින්දු හා අන්‍යලබ්ධිකයින් මිය ගිය විට ප්‍රාදේශීය සභාවෙන් අවසර ලබාගෙන මිහිදන් කිරීම හෝ ආදාහන කිරීම තම තමන්ගේ ආගමානුකූලව සිදුකෙරේ. මෙම ස්ථානයට මිහිදන් කිරීමට හෝ ආදාහන කිරීමට ගෙන එන දේහයන් ආගමික වශයෙන් නිසියාකාරව බෙදා වෙන්කර දීමක් නැති නිසාත්, මේ සම්බන්ධව සොයා බැලීමට කිසිවකු යොදවා නොමැතිකමිනුත් ඔවුන්ගේ හිතුමනාපයට කැමති තැනකින් මිනීවල් කපා මිහිදන් කටයුතු සිදුකරති. මෙම තත්ත්වය යම් යම් ප්‍රශ්න ඇති වීමට තුඩු දෙන්නක් විය හැකිය. බැවින් එකිනෙක ආගමික අංශවලට අයිති කොටස් බෙදා වෙන්කර දී ගෞරවාන්විතව ඔවුන්ගේ අවසන් කටයුතු කර ගැනීමට අවකාශ ලබාදීමට බර පැන දරන්නන්ගේ අවධානය යොමුවිය යුතුය.

**ඒ. ඩී. සුනිල්**
හේකිත්ත

## අප දයාවේ දැත් දිගුකිරීමට දිගුකාලීන පැතුමකි වාසනාවන්!

**කතුතුමනි,**

ඇති හැකි මීසම් වලින් නැතිබැරි දෙව්මැඳුරු හා මීසම් වෙත ආර්ථික, ආධ්‍යාත්මික, ශීලධාර්මික සහයෝගිතාවයෙන් බැඳෙන්නට අතිඋතුම් මැල්කම් කාදිනල් රංජිත් හිමි වෙතින් නිල අවසරය හා ආශිර්වාදය ලැබීම ඉතා අගය කළ යුතුය.

එම පැතුම ඵලබරිත කළ යුත්තෝ අපය. අපට මඟ පෙන්විය යුත්තේ ගරු පියතුමන්ය. මෙම දයාවේ පිපාසය අපගේ ඉතා දිගු අතීතයකි. ඒ මන්දයත් අප අගරදගුරු පදවියේ පමණක් නොව මෙම දයාවේ දැත දිය යුතු රදගුරු පදවි තුළ තව බොහෝමයක් ඇත. උදාහරණයක් වශයෙන් අනුරාධපුර පදවියේ අපේම දෙවිපියාණන්ගේ දරුවෝ වන අපගේ අහිංසක කිතුනු ජනතාවගේ නැති බැරිකම් එමටය. දුක්දොම්නස් එමටය. නමුත් විශ්වාසනීය සහා මව තුළ ඔවුන් රැඳී සිටින්නේය.

පළමුව අප සහා නායක අතිගරු මැල්කම් රංජිත් හිමිපාණන් වහන්සේගේ මෙම උතුම් යෝජනාව අගරදගුරු පදවියෙන් පටන්ගෙන වෙනත් රදගුරු පදවි කරාද අප හදවත් යොමුවීමටද අප දයාවේ දැත් දිගුකිරීමටද වාසනාව ලැබේවා!

**ක්‍රිස්ටි ඔස්මන් පෙරේරා**
පුල්ලුහේන

# ප්‍රබල විරුද්ධ පක්ෂයක් රටට ඕනෑ!

**කතුතුමනි,**

පසුගිය සැප්තැම්බර් මස අටවැනි දින පැවති සබරගමු, රජරට, නැගෙනහිර පළාත් සභා මැතිවරණයෙන් වත්මන් රජයට එරෙහිව සටන් කළ එක්සත් ජාතික පක්ෂය ජනතා විමුක්ති පෙරමුණ මුස්ලිම් කොංග්‍රසය, කම්කරු කොංග්‍රසය ඇතුලු පක්ෂ අන්ත පරාජයට පත්වූ බව මැතිවරණ ප්‍රතිඵලවලින් විද්‍යමාන වෙයි. වත්මන් රජය නැගෙනහිර පළාත බහුතර බලයකින් ජයග්‍රහණය නොකළද පළාත් සභා තුනේම වැඩි ආසන ගණනක් ලබාගෙන ප්‍රමුඛයා වී ඇත.

පාලන බලයක් එසේත් නැත්නම් ජයග්‍රහණයක් ලබා ගැනීමේ නොහැකියාව දීර්ඝ කාලයක් පැවතීම ප්‍රජාතන්ත්‍රවාදී සමාජයකට හිතකර තත්ත්වයක් නොවන බව කිව යුත්තක්ද නොවේ. බෙලහීන විපක්ෂයක් පැවතීම පවත්නා රජයට ඉබේම හිතුවක්කාරි පාලන තලයකට පෙරමග සැලසීමකි. රජයට හිතකරයි සිතන ඕනෑම පනතක් සම්මත කර ගැනීමේ හැකියාව ඇති නිසා විරුදු මත නොසැලකීමේ තත්ත්වයක් ඉබේම නිර්මාණයවීම ස්වභාවිකය. විපක්ෂයේ බෙලහීනතාවය නිසා පාලන පක්ෂයට අසීමිත බලයක් හිමිවීම නොවැලක්විය හැක්කකි. එක්සත් ජාතික පක්ෂය මෙන්ම ජ.වි.පෙයද නායක විවේචන මෙන්ම භේදභින්නව විනයක් නොමැතිව උසාවි තීන්දු වෙත හඹා යෑම නිසා ඇතිවූ ආදීනව ගතවූ පළාත් සභා මැතිවරණ තුළින් මොනවට දිස්විය. කරුණු කාරණා මෙසේ හෙයින් මෙරට ජනසම්මතවාදය තහවුරුවීමට අවශ්‍ය ප්‍රබලතම විපක්ෂයක් සඳහා භේද මතවාද අමතකකර පෙරමුණ ගැනීම ප්‍රජාතන්ත්‍රවාදය අගය කරන මෙරට පුරවැසි ජනතාවගේ පරම යුතුකම වන්නේය. එසේ නොවන තාක් මෙරට ප්‍රජාතන්ත්‍රවාදයට කණකොකා හැඬීම නොවැලැක් විය හැකිය.

**තියබෝල්ඩ් සමරතුංග**
රත්නපුර



## බලංගොඩ කතෝලිකයන්ට කුඩම්මාගේ සැලකිලි

**කතුතුමනි,**

බලංගොඩ ශු. ජුසේ මුනි දෙව්මැඳුරේ වාර්ෂික මංගල දිව්‍ය පූජාවෙන් පසු ප්‍රතිමාව රැගත් පෙරහර බලංගොඩ නගරය වටා වීථි සංචාරය කිරීම ඇරඹිනි. පෙරහර තුඹගොඩ මංසන්ධිය වෙත පැමිණෙමින් සිටියදී, ඒ සමීපයේ වන ඉන්ධන පිරවුම්හලේ සිට පිටුපසට ධාවනය වූ "බිබිල කොළඹ" බස් රථය පෙරහරේ ගමන් කළ කීපදෙනෙකුගේ ඇඟේ හැපෙන පරිදි ධාවනය කැරුණි.

පෙරහර හසුරවමින් සිටි හා ගමන් කරමින් සිටි සැදැහැවතුන් කීපදෙනෙක් කෑ ගසා බසය නතර කරගත් අතර කළ වරද සාධාරණීකරණය කර කථා කළේ බස් රථයේ කොන්දොස්තර තැනයි. බලංගොඩ පොලිසියේ රථ වාහන අංශයේ නිලධාරියෙක්



මේ සියල්ල බලා සිටි අතර ඔහුට මේ පිළිබඳව කිසිවක් කර කියා ගත නොහැකි විය. පෙරහර මැද්දෙන් වාහන යන්නට වූ අතර මහා කලබලයක් හා වාහන තදබදයක් ඇතිවිය.

බලංගොඩ කතෝලික ප්‍රජාව ලෙස බලංගොඩ පොලිසිය කෙරේ අපට ඇතිවන්නේ මහා කලකිරීමකි. එසේම මතක් වන්නේ නුවර, දෙවිනුවර ආදී පෙරහරවලදී හා අනෙකුත් ආගමික කටයුතු වලදී පාර වසා ඉඩ දෙන ආකාරය ය. එය එසේ විය යුතුය. සියල්ලන්ට තම තමන්ගේ ආගමික කටයුතු වල නියැලීමට නිදහස හා අවස්ථාව තිබිය යුතුය.

2000 ක පමණ පිරිසක් සහභාගීවන එම පෙරහර යන මාර්ගයේ ප්‍රධාන මංසන්ධියේ වාහන හසුරුවන්නට සිටියේ එකම එක පොලිස් නිලධාරියකු පමණි. පෙරහර පුරාවට අප දුටු එකම පොලිස් නිළධාරියාද ඔහු පමණි.

**එෆ්. කේ. පීරිස්**
බලංගොඩ



**අධ්‍යාපනය, ධර්මෝපදේශය සහ බයිබල් දූත සේවා කතෝලික ජාතික කොමිසමේ ගරු සභාපති හලාවත රදගුරු අති උතුම් දෙව්ශ්‍රිත වැලන්ස් මෙන්ඩිස් හිමිපාණන් සමඟ කරන ලද සාකච්ඡාවකි.**



# කතෝලික ධර්මෝපදේශ කියන්නේ ක්‍රිස්තුන් වහන්සේ තුළ ජීවත් වන්නේ කෙසේ ද යන්න පිළිබඳව මනා අවබෝධයක් ලබා දීමයි.

**★ රදගුරුතුමෙනි, කතෝලික ධර්මෝපදේශය කෙලෙස හැඳින්විය හැකි ද?**

ඉතා කෙටියෙන් කියනවානම් කතෝලික ධර්මෝපදේශ කියන්නේ ක්‍රිස්තුන් වහන්සේ තුළ ජීවත් වන්නේ කෙසේ ද යන්න පිළිබඳව මනා අවබෝධයක් ලබා දීමයි. එම කාර්යය ක්‍රිස්තුන් වහන්සේ විසින්ම සිය ශ්‍රාවකයින්ට පවරා තිබෙනවා. උන්වහන්සේ ඔවුන්ට ඉගැන්වූ දෙය ද, තම වචනයන් හා ක්‍රියාවන් ද විස්තර කර දීමේ දූත කාර්යය හා වරය උන්වහන්සේ ඔවුන්ට පැවරූ සේක. (මතෙව් 29:20) දෙවන ජුවාම් පාවුළු ශුද්ධෝත්තම පියතුමන් විසින් නිකුත් කළ ධර්මෝපදේශය පිළිබඳ "කතෙකේසි ත්‍රාදෙන්දේ" යන අපෝස්තලික අනුශාසනා පත්‍රයේ ධර්මෝපදේශය ඉතා පැහැදිලිව විස්තර කර තිබෙනවා. ධර්මෝපදේශයේ මූලික පරමාර්ථය තමයි විශ්වාසය ගොඩනැගීම, ඒ නිසා ධර්මෝපදේශය අධ්‍යාපනය හෝ දැනුම ලබාදීම පමණක් නොවෙයි. අධ්‍යාපනයත් ධර්මෝපදේශයත් අතර විශාල වෙනසක් තියෙනවා.

**★ ජාතික ධර්මෝපදේශ දිනය ලෙස විශේෂ දිනයක් වෙන්කර තිබෙන්නේ ඇයි?**

ධර්මෝපදේශයේ වටිනාකම ජනතාවට විශේෂයෙන් දරුවන්ටත්, දෙමාපියන්ටත් ප්‍රජාවටත් අවබෝධ කර දීම තමයි ජාතික ධර්මෝපදේශ දිනය ලෙස විශේෂ දිනයක් වෙන් කිරීමේ පරමාර්ථය.

**★ ධර්මදානය කියන්නේ ධර්මෝපදේශය ද?**

ධර්මදානය කියන්නේ කතෝලික විශ්වාසය අන් අයට බෙදා දීම හා විශ්වාසය අන් අය හා බෙදා ගැනීම. ධර්මදානය හා ධර්මෝපදේශය එකිනෙකට බැඳී පවතිනවා. නමුත් ධර්මෝපදේශයෙන් තොරව කෙනෙකුට ධර්මදානයෙහි යෙදීමට හැකිකමක් නැහැ. ධර්මෝපදේශයෙන් තොරව ධර්මදානයෙහි යෙදීමට උත්සාහ කිරීම හරියට අත්තිවාරමක් නැතිව ගෙයක් ගොඩනගන්නට උත්සාහ කිරීමක් වගෙයි.

**★ ධර්මෝපදේශයෙහි නිශ්චිත අරමුණු පිළිබඳව යමක් කීවොත්?**

"ඔබ මා කවුරුන් කියා කියන්නහුදැ?"යි ක්‍රිස්තුන් වහන්සේ සිය ගෝලයන්ගෙන් ඇසූ විට ඔවුන් විවිධාකාර පිළිතුරු දුන් බව අප ශුද්ධවූ සුවිශේෂය තුළ අසා ඇත. ක්‍රිස්තුන් වහන්සේව නිවැරදි ලෙස හඳුනා ගැනීම කිතුනුවකුට අත්‍යවශ්‍ය වේ. ධර්මෝපදේශයේ තිරසාර ඉලක්කය හැටියට කියන්න පුළුවන් පූර්ණ කිතුනුවකු බිහි කිරීම. කිතුනු ජීවිතයේ ගුණාත්මකභාවය රඳා පවතින්නේ ධර්මෝපදේශය මතයි කීවොත් නිවැරදියි. ධර්මෝපදේශයේ වැදගත් අංගයක් තමයි දහම් පාසල, එමගින් අප උත්සාහ කරන්නේ ළදරු වියේ සිටම ක්‍රිස්තුන් වහන්සේව හඳුනා ගැනීමට දරුවන්ට සහය වීමයි.

**★ ඔබවහන්සේ සඳහන් කළා දහම් පාසල (දහම් පාඩම) ධර්මෝපදේශයේ අංගයක් බව. දහම් පාඩමේ අන්තර්ගතය ගැන පැහැදිලි කිරීමක් කළොත් ?**

මම කලින් කීවා වගේ දහම් පාසල තවත් එක් අධ්‍යාපන ආයතනයක් නොවෙයි. දහම් පාසලේ පෙළපොත් නැහැ. දහම් පාසලට පැමිණෙන දරුවන්ගේ වයස් සීමාවන් අනුව සකස් කළ පාඩම් මාලාවක් තමයි තියෙන්නේ. නමුත් දහම් ගුරුවරුන්ට මඟ පෙන්වීම සඳහා සකස් කළ අත් පොතක් බොහෝ පදවිවල භාවිත කෙරෙනවා. එ තුළින් යම් නිශ්චිත ක්‍රමවේදයක් තුළ දහම් පාසල් කටයුතු කරගෙන යනු ලබනවා. නිසි අන්තර්ගතයක් එ තුළින් සහතික වෙනවා. අපගේ ඉගැන්වීමක් හෝ වෙනත් ශාස්තෘවරයකුගේ ඉගැන්වීමක් නොව ජේසුස් ක්‍රිස්තුන් වහන්සේගේ ඉගැන්වීම පතුරුවාලීමේ, අනුන්ට දීමේ චේතනාව තමයි ධර්මෝපදේශයේ හා දහම් පාඩමේ අන්තර්ගතය.

**★ ධර්මෝපදේශයෙහි ලා දහම් ගුරු භවතුන්ගේ භූමිකාව කෙබඳු විය යුතු ද?**

දහම් ගුරුවරයා ක්‍රිස්තුන් වහන්සේට ප්‍රේම කරන, ගැඹුරු විශ්වාසයකින් පූර්ණ කෙනෙක් විය යුතුය. ඇත්තටම දහම් ගුරුවරයා කතෝලික විශ්වාසයේ ප්‍රතිමූර්තියක් විය යුතුයි. දහම් පාසල් දරුවා දහම් ගුරුවරයා හෝ ගුරුවරිය උගන්වන දේ ග්‍රහණය කරගන්නවා පමණක් නොවෙයි. ගුරුවරයා දහම උගන්වන්නේ කුමන අන්දමේ හැඟීමකින් ද යන්නත් අවබෝධ කරගන්නවා. එම නිසා දහම් ගුරුවරයා තමන් උගන්වන දේට අනුගත වීම අත්‍යවශ්‍යයි. ඒ වාගේම දහම් ගුරුවරයාගේ හෝ ගුරුවරියගේ හැසිරීමත් ජීවන රටාවත් දරුවාගේ නිරීක්ෂණයට ලක්වන බව අමතක කළ යුතු නැහැ.

**★ දෙමාපියන්ට ධර්මෝපදේශ කර්තව්‍යයට දායක විය හැකි ද? ඒ කෙලෙස ද?**

දරුවකු දහම් පාසලේ ගත කරන්නේ සතියකට පැයක් හෝ ඊට මඳක් වැඩි කාලයක් පමණයි. එම කෙටි කාලය තුළ ලබාදිය හැකි දැනුම තරමක් සීමිතයි. එහිදී දෙමව්පියන්ට විශාල කර්යභාරයක් ඉටුකළ හැකියි. ඔවුන් දරුවාගේ ප්‍රධාන දහම් ගුරුවරුන් විය යුතුයි. දරුවා දහම් පාසලෙන් ලබන අවබෝධය ජීවිතය තුළින් සක්‍රිය කිරීමට දෙමව්පියන් දරුවන්ට සහය විය යුතුයි. ඒ වගේම තවත් වැදගත් දෙයක් තමයි දෙමාපියන්ගේ ජීවිතාදර්ශය. ඔවුන් තුළින් ක්‍රිස්තු ප්‍රේමයේ පණිවුඩය දරුවාට යා යුතුයි. දෙමාපිය ජීවිතාදර්ශය දෙවියන් ඉදිරියේ දෙමාපියන්ගේ බරපතළ වගකීමක්.

**★ මෙවර ජාතික ධර්මෝපදේශ දිනයේ දී අප රටේ දුවා දරුවන් වෙත ඔබවහන්සේගේ පණිවුඩය කුමක් ද?**

ක්‍රිස්තුන් වහන්සේ අපගේ ජීවිතයේ ස්වාමියාණන් හා අපගේ විමුක්තිදායකයාණන් නිසා උන්වහන්සේට වඩ වඩා ළං වීමට හා උන්වහන්සේට ප්‍රේම කිරීමට දරුවන් උත්සාහ කළ යුතුයි. ඒ සඳහා ක්‍රිස්තුන් වහන්සේගේ ජීවිතය දැනගැනීම අත්‍යවශ්‍ය වෙනවා. දහම් පාසල හා ධර්මෝපදේශය ඒ සඳහා ඇති හොඳම මාර්ගය බව අවධාරණය කරන්නට මම කැමතියි.

සාකච්ඡා සටහන
**ලිඩ්වින් කිරිඇල්දෙණිය**

# ධර්මෝපදේශයේ

**හැඳින්වීම :**

සෑම වර්ෂයකම එක් දිනක් ජාතික ධර්මෝපදේශ දිනය වශයෙන් වෙන් කිරීම ඉතා සුවිශේෂී සිද්ධියකි. ධර්මෝපදේශය වසරේ දින 365 පුරා පැතිර යන ක්‍රියාවලියකි. එහෙත් වාර්ෂිකව මෙවන් විශේෂ දිනයක් වෙන් කිරීම මඟින් ධර්මෝපදේශය ප්‍රසාද ස්නාපනීය කැඳවීම ලබා ඇති කාගේත් වගකීම බව පසක් කර ගැනීමට පිටිබලයක් ලැබේ. ධර්මෝපදේශ දිනයක් පැවැත්වීමට ප්‍රථම වරට යෝජනා කරන ලද්දේ 1935 වර්ෂයේ දී එකළොස්වන පියුස් ශුද්ධෝත්තම පියතුමාණන් විසිනි. On better care to Catechetical මැයෙන් විශේෂ හසුන් පතක් නිකුත් කරමින් ධර්මෝපදේශයේ වටිනාකම ජාතික, පදවි සහ මීසම් මට්ටමින් බලවත් කිරීමේ අවශ්‍යතාවය පෙන්වා දුන්හ. මේ වැදගත්කම තහවුරු කිරීම සඳහා සකල විශ්වාසකයින් යාච්ඤා සහ සම්මාදම ලබාදීම වෙනුවෙන් ඉරුදින දැනුවත් කිරීම කළ යුතු බවද පෙන්වා දුන්හ.

ධර්මෝපදේශයේ ප්‍රභාවය සහ අපේක්ෂණය වනුයේ කිතුනු සංඝයේ පැවැත්මයි. මෙය පාදක කර ගනිමින් එහි අරමුණ සනිටුහන් වී ඇත. එනම් ක්‍රිස්තුන් වහන්සේ විසින් මෙලොව ආරම්භ කරන ලද සේවාව දිගටම පවත්වාගෙන යාමටත් මිහිපිට දේව රාජ්‍යය පතළ කිරීමටත් ය. එමඟින් ඔවුන් වහන්සේ සමඟ ගැඹුරු සබැඳියාවක් ජනිත කිරීමට හැකිය. (ධර්මාචාර්ය විභාග අත්පොතේ (නව නිර්දේශය) අටවැනි පාඩම).

දෙවියන් වහන්සේ සහ අප අතර වූ සම්බන්ධතාවය ආරම්භයේ දී පාපය නිසා බිඳ වැටුණි. (ශු. බයිබලයේ උත්පත්ති පොත 1,2 හා 3 පරිච්ඡේද) එහෙත් දෙවියන් වහන්සේ එදා දුන් පොරොන්දුව ජේසුස් වහන්සේගේ ජීවිත පූජාව තුළින් ඉටුකරමින් නැවත එම සම්බන්ධතාවය ගොඩනැගූහ. එහි ප්‍රතිඵල ලෙස සැනසීම, සාමය, ප්‍රීතිය, සංහිඳියාව අපට ලබා ගැනීමට හැකි විය. කොන්දේසි විරහිත ප්‍රේමය අප වෙත දක්වන දෙවියන් වහන්සේට අවශ්‍ය වනුයේ අප ජීවත්වනු දැකීමය. සතුටින් සිටිනු දැකීමය. මෙම ප්‍රේමය ජීවිතය තුළ ජීවත් වීමේ දී චර්යාමය වෙනසක් සඳහා අපට ඔවුන් වහන්සේ ආරාධනා කරයි. ප්‍රසාද ස්නාපනීය සක්‍රමේන්තුව තුළින් සාන්ත සභාවේ සාමාජිකයින් වන අප වෙත ජේසුස් වහන්සේ විසින් එක්තරා භාරධූර කාර්යයක් පවරා ඇත. එනම් සුබාරංචිය ප්‍රකාශ කිරීමයි.

"ඔබ ගොස් සකල ජාතින් ගෝලයන් කරමින් පියාණන්ගේ ද, පුත්‍රයාණන්ගේ ද, ශුද්ධාත්මයාණන්ගේ ද නාමයෙන් ඔවුන් බව්තිස්ම ස්නාපනය කරන්න. මා ඔබට අණ කළ සියල්ල රක්ෂා කරන්නට ඔවුන්ට උගන්වන්න"

(ශු. මතෙව් 28: 19-20).

**ඇදහිල්ලේ වර්ධනය**

ආදරයෙන් හඬ ගසන දෙවි සමිඳාණන්ට ආදරයෙන් පිළිතුරු දීමට, "හෙවත් ඇදහිල්ලේ ජීවිතය වර්ධනය කර ගැනීමට සහය වන" ශුද්ධවූ සභාවේ අනිවාර්ය වන දහම් සේවය, ධර්මෝපදේශයයි. මෙලෙස සහය දැක්වීම මහා ප්‍රයත්නයකි. (කතෝලික සභාවේ ධර්මෝපදේශය - 5) ඇදහිල්ල ජීවිතය ඔස්සේ ගලා යන සටනක් වන හෙයින්, එය පෝෂණය කිරීමේ වගකීම ශුද්ධවූ සභාවට පැවරෙයි. ඇදහිල්ලේ ප්‍රතිඋත්තරය පෞද්ගලික වන හෙයින්, එය විවිධ වෙයි. එම විවිධත්වය ඒ ඒ පුද්ගලයාගේ ආරය හා පරිසරය (සමාජ සංස්කෘතිය) අනුව දිස්වෙයි. එම නිසා දහම් සේවය දේශානුරූපී විය යුතුය.

මේ අනුව "පූර්ණ ඇදහිල්ලේ ජීවිතය සිසුන් තුළ ගොඩනැංවීම සඳහා, දේව ප්‍රකාශනය මඟින් මනුෂ්‍ය ජීවිතය ආලෝකවත් කර ජේසුස් ක්‍රිස්තුන් වහන්සේ වෙත සිසුන් ගෙන යාම" වශයෙන් ධර්මෝපදේශය විස්තර කළ හැකිය. කෙසේ විස්තර කළ ද, ආගම උගැන්වීම ප්‍රායෝගික විය යුතු බව ද විවිධ ක්‍රියාකාරකම් මඟින් කිතුනු ජීවිත පුහුණුව දිය යුතු බව ද ජනවන්දනාව සහ ශු. ලියවිල්ල පදනම් කරගත යුතු බව ද ධර්මෝපදේශයෙහි ලා අප සැලකිල්ලට පාත්‍ර විය යුතුය.

1971 මාර්තු 18 වන දින vi වන පාවුළු පාප් වහන්සේ අනුමත කළ "ජෙනරල් කැටකෙටිකල් ඩිරෙක්ටරි" හෙවත් "පොදු ධර්මෝපදේශ උපදෙස් ග්‍රන්ථය"ට අනුව අද සමස්ත සභාව තුළ ධර්මෝපදේශය නවතාවයට නැංවීමෙහිලා පදනම වෙයි. (ධර්මෝපදේශය පිළිබඳ අනුශාසනා පත්‍රය පිටු අංක 4)

ධර්මෝපදේශය සමස්ත ශු. සභාවේ ජීවය හා සමඟ තදින් වෙලී පවතී. ඒ නිසාම සාන්ත සභාවේ දැක්ම වනුයේ ද ධර්මෝපදේශය පූජනීය වගකීමක් ඉටුකරන බවයි.

කතෝලික සභාවේ ධර්මෝපදේශයට අනුව විශ්වාසය කිතුනු සැදැහැවතුන් තුළ බිහිකිරීම ධර්මෝපදේශයේ මුඛ්‍ය පරමාර්ථය වේ. (CATECHISM OF THE CATHOLIC CHURCH (ක.ස.ධ) Page No 3) මෙම සන්දර්භය කොටස් හතරක් තුළ විහිදුවා ඇත.

i. විශ්වාසය, ii විශ්වාසය සැමරීම, iii. විශ්වාසයෙන් ජීවත් වීම iv. විශ්වාසයේ ප්‍රශංසාත්මක බව

අප වෙසෙන සමාජයත්, පෞද්ගලිකව සාමාජිකයනුත් ඇදහිල්ලෙන් මුහුකුරා යාමට මඟ පෙන්වන ධර්මෝපදේශය තුළින් දෙවියන් වහන්සේ ගැන අංග සම්පූර්ණව සජීවී දැනුමක් ලබා දීම වැදගත් ය. එවිට විශ්වාසයේ සංසයක් ගොඩනැගේ. xxiii ජුවාම් පොදු පියාණන් ii වන වතිකාන කතිකාවෙ දී ප්‍රකාශ කළ පරිදි කතෝලික සභාවට අයත් වේද නිධානය මගින් මිනිසුන් අතීතය වෙත ගෙන යාමට වඩා වැදගත් වන්නේ එම වේද නිධානය හදාරා නූතනයට සරිලන අයුරින් ප්‍රකාශ කිරීමයි. සුපුවත උචිත ලෙස ද ප්‍රබෝධනාත්මකව ද දේශනා කිරීම, ඉගැන්වීම අද කිතුනුවා වෙත එල්ලවී ඇති අභියෝගයයි. ("ධර්මෝපදේශ කලාව" ගරු පියල් ජානක ප්‍රනාන්දු පියතුමා, පිටු අංක 05) එහි මූල ද්‍රව්‍යය වනුයේ දේව වචනයයි. "සමස්තයක් වශයෙන් ගත් කල ධර්මෝපදේශය වූ කලී, බාලයන්ට ද, තරුණ තරුණියනට ද, ඇදහිල්ලේ ජීවිතය සඳහා ක්‍රමානුකූලව හා සාමූහිකව ක්‍රිස්තු ධර්මය උගන්වමින් අධ්‍යාපනය දීමයි." (කතකේසි ත්‍රාදෙන්දේ - 18)

**ධර්මෝපදේශයේ ප්‍රගතිය**

ශ්‍රී ලංකාවේ ශු. සභාව නව මං ගැන්වීමෙහිලා අද ධර්මෝපදේශයේ සෑම පැතිකඩක් පිළිබඳවම ප්‍රමුඛතාවය ලබා දීම වැදගත් වේ. ධර්මෝපදේශයේ මෙහෙවර එල්ල විය යුත්තේ කිතුනු සංඝය ගොඩනැංවීමේ අරමුණ වෙතටය. මෙරට සමාජ ආර්ථිකයත් බහු ආගමික හා බහු සංස්කෘතික යථාර්ථයත් අනුව එය අත්‍යවශ්‍ය වන්නේය.

මෙහිදී ධර්මෝපදේශයේ ආරම්භක අවස්ථාව ගැන සිහි කළහොත් දේව රාජ්‍යය සහ ගැලවීම ගැන දේශනා කළ ධර්මෝපදේශයේ ආරම්භකයාණන් අනුගමනය කළ ක්‍රියාදාමය පසක් කළ යුතුය. තම ජනතාවට වැටහෙන පරිදි දේව රාජ්‍ය සහ ගැලවීම ගැන ඔවුන් වහන්සේ සරල බසින් උගන්වමින් ජුදා ගැමි ජීවිතයෙන්ම නිදසුන් ගෙන සාරධර්මයන් ද, දේව රාජ්‍යය ද ගුප්ත ධර්මය ද අනාවරණය කිරීමට උපමා හාස්කම් උපයෝගී කරගත් සේක. තවද ජේසුස් වහන්සේ සුබ අස්නට ජීවිත සාක්ෂි දැරූ සේක. එය ප්‍රබල ධර්මෝපදේශයක් විය.

ක්‍රි.ව. 100 - 600 කාලයේ දී දහම් පාසල් නොවීය. වැඩිහිටියන්ට ධර්මය දානය කරන ක්‍රමයක් පැවතුණි. තෙවන ක්‍රිස්තු ශත වර්ෂයේ දී "කැටක්‍යුමිනේට්" ධර්ම උපදේශ ක්‍රමය බෞතිස්ම අපේක්ෂකයන් සූදානම් කිරීමට යොදා ගත්තේ ය. මේ සඳහා වසර තුනක කාලයක් ගත කළේ ය.

ක්‍රි.ව. 600 - 900 අතර මැද යුගයේ දී ප්‍රධාන ධර්මෝපදේශ මාධ්‍ය වූයේ ජනවන්දනාවයි. විශ්වාසයේ වර්ධනය සඳහා කිතුනු පවුල හා ජනවන්දනාව මූලික කරුණු විය.

මෙය පසුකාලයේ දී වැඩිහිටියන් හා ළමුන් සඳහා විධිමත් ධර්මෝපදේශ විරල විය. ධර්මෝපදේශ ව්‍යාපාරයට හිමි තැන ක්‍රිස්තියානි පරිසරයට ලැබිණි. කිතුනු පරිසරය, පවුල, ජනවන්දනාව හා සමාජය යන සාධකයන්ගෙන් සංයුක්ත විය. බාලයන්ට ආගම ඉගැන්වීමේ වගකීම පවුලට හිමිවිය. වැඩිහිටියෝ ජනවන්දනාව මඟින් ආගම ඉගෙන ගත්හ. මෙයට එක් හේතුවක් වූයේ ජනතාව දිව්‍ය පූජාවෙන් ඇත් වී දිව්‍ය සත්ප්‍රසාදය ආශිර්වාදය, පෙරහර, මුනිවරුන්

# ජාතික ධර්මෝපදේශ හා බයිබල්

ශ්‍රී ලංකාව තුළ කිතු දහමට සාක්ෂි දැරීම සඳහා සැම දෙනාටම මඟ පෙන්වීම අපගේ දූත කාර්යය යි.

**මූලික සේවාවන් -** ★ මුළු මහත් ශ්‍රී ලංකාවටම ධර්මෝපදේශය, බයිබල් දූත සේවාව පිළිබඳ වැදගත් තීරණයන් ගැනීම, හා ඒවා ක්‍රියාත්මක කිරීම. ★ පදවි 12 හි ධර්මෝපදේශ හා බයිබල් දූත සේවා අධ්‍යක්ෂ පියවරුන් සමඟ සම්බන්ධීකරණයක් ගොඩනැගීම.

**ප්‍රකාශන -** ★ සිංහල, දෙමළ, ඉංග්‍රීසි ආගමික පොත පත පහසු මිලට අලෙවි කිරීම, ★ විශේෂයෙන් ශුද්ධවූ බයිබලය ජනතාව අතර ව්‍යාප්ත කිරීම. ★ සෑම වසරකම පොත් අලෙවි සතියක් පවත්වා විශේෂ අඩු මිලකට පොත් බෙදා හැරීම. ★ අ.පො.ස. සා.පෙළ කතෝලික ධර්මය හා අ.පො.ස. උ.පෙළ ක්‍රිස්තු ධර්මය විෂය හදාරන සිසු දරුවනට අවැසි අතිරේක පොත පත එළිදැක්වීම. ★ ධර්මාචාර්ය ගුරු විභාගයන් සඳහා අවැසි පොත් ප්‍රකාශන නිකුත් කිරීම. ★ කාලීන වැදගත්කමක් ඇති ආගමික පොත පත මුද්‍රණය කිරීම. ★ ගුරු සිසු සැමගේ ප්‍රයෝජනවත් "දහම් මඟ" සඟරාව සිංහල හා දෙමළ මාධ්‍යයන්ගෙන් නිකුත් කිරීම. ★ දිනපතා දේව වචනය මෙනෙහි කිරීම සඳහා ශුද්ධ ලියවිලි පාඨ ඇතුළත් පොත නිකුත් කිරීම

**පාඨමාලා සහ විභාග -** ★ තැපැල් මාර්ගික පාඨමාලාව - අ.පො.ස (උසස් පෙළ) ක්‍රිස්තු ධර්මය විෂය හදාරන දුෂ්කර පෙදෙස්වල ළමුනට අතදීමක් වශයෙන් තැපැල් මාර්ගික පාඩම් මාලාවක් ක්‍රියාත්මක කිරීම.

**ධර්මාචාර්ය විභාගයන්** - ජාතික වශයෙන් වාර්ෂිකව ධර්මාචාර්ය ගුරු විභාගයන් සංවිධානය කිරීම මෙම විභාගය අදියර තුනකින් පැවැත්වේ. 1. ධර්මාචාර්ය විභාගය, 2. ධර්මාචාර්ය විශේෂ විභාගය , 3. ධර්මාචාර්ය ගෞරව විභාගය. ධර්මාචාර්ය විභාගයන් සමත්වූවනට ජාතික වශයෙන් පිළිගත හැකි සහතිකයන් පිරිනැමේ. ගුරු අභ්‍යාස විද්‍යාලවල පාඨමාලාවන් සඳහා සිසුන් බඳවා ගැනීමේ දී

# ප්‍රවණතාවයන්

වෙත හා භක්ති මෙහෙය වැනි සංස්කාරයනට මුල් තැන දුන් නිසාය. තවද ක්‍රි.ව. 1517 පමණ වන විට ධර්මෝපදේශ ක්ෂේත්‍රය අඩපණ වී තිබිණි. විවිධ මිත්‍යා මත රාශියක් ද කිතුනු ජනතාව තුළට කඩා වැදිණි. රෙපරමාදු විප්ලවය තුළ "ද කැටකිසම්" හෙවත් උපදේශ පොත ප්‍රසිද්ධ විය. ප්‍රශ්න උත්තර ක්‍රමවේදය මෙහි දක්නට ලැබුණි. මෙයට සමගාමීව කිතුනු සභාව ද ප්‍රශ්න උත්තර ක්‍රමවේදය විකල්පයක් ලෙස භාවිත කළේ ය.

උදා: ජේසු නිකායේ පීටර් කැනීසියුස් තුමාගේ විධිමත් උපදේශ පොත

- විශ්වාසය හා විශ්වාස ලක්ෂණය ගැන කරුණු
- බලාපොරොත්තුව සහ යාච්ඤාව ගැන කරුණු
- ප්‍රේමය සහ දස පනත සම්බන්ධ කරුණු
- ප්‍රසාද නිධාන ගැන ඉගැන්වීම
  - වරප්‍රසාද ගැන කරුණු

මෙම උපදේශ පොත ද පොදු වශයෙන් ගත් විට කතෝලික දේව ධර්මයේ සංක්ෂිප්ත සංග්‍රහයක් වූ බව කිවයුතුය. ශ්‍රී ලංකාවේ ධර්මෝපදේශ ඉතිහාසය වෙත අපේ අවධානය යොමු කළොත් 1945 තරම කාලයේ දී ධර්මෝපදේශය ඉගැන්නුවේ "ඉරුදින දහම් පාසල" මඟිනි. මේවා බොහෝ විට පැවැත්තුවේ පල්ලියේ නොව පාසලේම ය. මීසම් පියතුමාගේ ප්‍රධානත්වයෙන් මෙහෙය විය.

1566 දී ප්‍රසිද්ධ කරන ලද "ද රෝන් කැටකිසම්" නමැති උපදේශ පොත ත්‍රිදෙන්තීනු මහා මන්ත්‍රණ ප්‍රතිඵලයක් විය. එහි වේද සත්‍යතා, ප්‍රසාද නිධාන, දස පනත, පරමණ්ඩල ආරාධනාව යන කොටස් හතරකින් සමන්විත විය. මෙය මතු උපදේශ පොත් සඳහා ආදේශ මූලාශ්‍රයක් බවට පත්විය. ශ්‍රී ලංකාවේ වර්ෂ 1961 දී පාසල් රජයට පවරා ගැනීමත් සමඟ අප රටේ "ඉරිදා දහම් පාසල්" ක්‍රමය මීසම් මට්ටමින් පවත්වා ගැනුණි. තවද එවක තිබූ රජය විසින් ඉරුදිනය වෙනුවට පොහොය දිනය රජයේ නිවාඩු දිනයක් බවට පත්වීම හේතු කොට ගෙන සතියේ මැද දිනවල ද දහම් පාසල් පැවැත්වුණි.

1945 ආශ්‍රිතව පැවැත් වූ ත්‍රිදෙන්තීනු මන්ත්‍රණ සභාව නොහොත් රෝමානු ධර්මෝපදේශය (ධර්මාචාර්ය ගෞරව විභාගය අත්පොත දෙවන, පිටු අංක 39) හේතුකොට ගෙන කතෝලික ප්‍රතිවිප්ලවයේ ප්‍රධානතම බලවේගයක් බවට පත්විය. ශුද්ධවූ ලියවිල්ල පමණක් නොව සභා සම්ප්‍රදායේ ද වැදගත්කම ඉගැන්වීම තීරණය විය. එමෙන්ම ගැලවීම සඳහා මනුෂ්‍ය ක්‍රියාකාරිත්වය අවැසි බව තහවුරු විය. මරිය බැතිය ද සභාවේ පූජක නිල බලය ද පූජකවරයේ නීත්‍යානුකූල භාවය ද දිව්‍ය සත්ප්‍රසාද වන්දනාවේ වැදගත්කම ද නැවත ප්‍රකාශ විය.

ධර්මෝපදේශයේ නව ප්‍රවේශයන් ලෙස පූජකයන් සඳහා දහම් අත්පොත වශයෙන් ධර්මෝපදේශයක් බිහිවීම වැදගත් මංසන්ධියක් විය. (ධර්මෝපදේශ කලාව" ගරු පියල් ජානක ප්‍රනාන්දු පියතුමා පිටු අංක 97 - 98)

**1. දෙවියන් වහන්සේ මනුෂ්‍යයාට කළ දෙය** - 1. විශ්වාස ලක්ෂණය, 2. ප්‍රසාද නිධානය,
**2. මනුෂ්‍ය පිළිතුරු** - 3. දස පනත, 4. යාච්ඤාව

ප්‍රධාන වේද සත්‍යයන් සහ යාච්ඤාව අන්තර්ගත කරමින් ධර්මෝපදේශ සාරය ලෙස "මගේ පළමු ආගම පොත" නමින් ද 1983 වසර තුළ "සුළු උපදේශය" නමින් අප දහම් පාසල් තුළ ඉගැන්වීමේ පොත් බිහිවිය.

කාලයාගේ ඇවෑමෙන් ක්‍රිස්තු කේන්ද්‍රීය ධර්මෝපදේශ රටාව ප්‍රචලිත විය. මෙය ප්‍රශ්න උත්තර ක්‍රමයට වඩා වෙනස් විය. අරමුණ, දැනුම, ආකල්ප, කුසලතා, දරුවන් තුළ ජනිත කිරීමට හැකිවිය.

මානව කේන්ද්‍රීය ධර්මෝපදේශය නවීනතම ධර්මෝපදේශ ක්‍රමය වශයෙන් ඉන් අනතුරුව කරලියට පැමිණීම තුළින් ඉතා උචිත ආගමික අධ්‍යාපන රටාවක් බව ප්‍රත්‍යක්ෂ විය. එහෙත් එහි එක්තරා ආකාරයක අවදානම් තත්ත්වයක් ද මතුවිය. එනම් නොනිසි ලෙස භාවිත කිරීම තුළ හුදෙක් සමාජ අධ්‍යයනයක පාඩමක් වීමයි.

අද අප දහම් ක්ෂේත්‍රය තුළ ක්‍රියාත්මක වන ශිෂ්‍ය කේන්ද්‍රීය ධර්මෝපදේශ ක්‍රමවේදය සාර්ථක වී ඇත. මෙවැනි ක්‍රමවේද තුළින් ගම්‍ය වන වර්තමාන ශ්‍රී ලංකාවේ ධර්මෝපදේශ ක්‍රියාවලිය සැලසුම් සහගත වීම සතුටට කරුණකි.

බහු ආගමික පරිසරයක් තුළ රෝපණය වූ දිනෙන් දින වැඩි වර්ධනය අප කිතුනු වෘක්ෂයේ සෙවන සහ ඵලය ලබා දිය යුත්තේ කිතුනු සංඝයට පමණක් නොවේය. එහි සන්දර්භය අන්තර් ආගමික සුහදතාව නංවන සමාජ සංගතභාවයක් තුළින් විහිදීම සාධාරණය, යුක්ති සහගතය. එවිට එය සමාජ සාධක වැඩපිළිවෙලක් මෙන්ම අන්තර් ආගමික සුහදතාවය නංවන සමකාරකයක් ද වේ. යොවුන් ධර්මෝපදේශ ක්‍රමවේදයක් මෙන් ම වැඩිහිටි ධර්මෝපදේශ ක්‍රමවේදයක් දැනට වඩා ක්‍රමවත්ව දියත් කිරීම කාලෝචිතය.

දැනට බොහෝ දහම් පාසල් තුළ යොවුන් ධර්මෝපදේශයක් ක්‍රියාත්මක නොවේ. එවැනි ක්‍රමයක් මීසම් මට්ටමින් දියත් කිරීම වැදගත් වී ඇත. ඒ සඳහා විෂය මාලාවක් සැකසීමේ දී ඔවුන්ගේ ස්වභාවය සැලකිල්ලට ගැනීම අත්‍යවශ්‍ය වේ. වයසට අනුකූල වීමත්, රුචිකත්වයත් ගැන ද සැලකිල්ල දැක්වීම අවශ්‍ය වේ. සමාජයෙන් එල්ල වන අභියෝග වලට එඩිතරව මුහුණ දීම, අර්ථවත්ව ආගමික පිළිවෙත් වලට සහභාගී වීම පිරිපුන් කිතුනුවකු ලෙස ක්‍රියා කිරීම, යාච්ඤාව හා භාවනාව තුළින් දේ සම්බන්ධතාවය තරකර ගැනීම යන ශීර්ෂ එම විෂය සන්දර්භයට ඇතුල් වීම වැදගත් ය.

වැඩිහිටියන්ට තමන්ගේ ඇදහිල්ල ගැඹුරු කර ගැනීමට සැලැස්වීම වැඩිහිටි ධර්මෝපදේශයේ පරමාර්ථය විය යුතුය. එක එල්ලේ දේව ධර්මය ඉදිරිපත් කිරීමට වඩා ඇදහිල්ලේ ජීවිතය නිවැරදිව මූලික ආකල්ප මත ගොඩනගා ගැනීමට අත දිය යුතුය. හුදකලා වූ දරු සෙනෙහස අහිමි වූ වැඩිහිටි දෙමාපියන් අද අපමණය. මේ පිළිබඳ කිතුනු අප සැමගේ අවධානය යොමු වීම වැදගත් ය.

### නිගමනය

කිතුනුවකු ලෙස කැඳවීම ලත් අප සැම ධර්මෝපදේශ සේවයේ මෙහෙවරට කැපවී ඇත. වර්තමාන ශ්‍රී ලංකාව තුළ ඇතිවී තිබෙන තර්ජන, අභියෝග හමුවේ සුබාරංචිය ප්‍රකාශ කිරීමේ කාලීන හදිසි අවශ්‍යතාවයට ගිහි පැවදි අප සැමගේ සහයෝගය අවශ්‍ය මොහොතක් බව සිහි තබා ගත යුතුය. ධර්මෝපදේශයේ ප්‍රවනතාවය පිළිබඳ වචන හරඹයන් කිරීම පහසුය. එහෙත් එය ක්‍රියාත්මක කිරීම අසීරු කරුණක් බව පසක් කර ගත යුතුය.

2012 ඔක්තෝබර් මස 11 වන දින සිට ඉදිරි වසර "විශ්වාසයේ වසර" ලෙස අති උත්තම සොළොස්වන බෙනඩික්ට් ශුද්ධෝත්තම පියතුමාණන් විසින් ප්‍රකාශයට පත් කිරීමට නියමිත බව අපි දන්නෙමු. දෙවන වතිකාන කතිකාවට වසර 50 ක් සපිරෙන මේ වසරේ එහි ප්‍රකාශනවල හරය සහ නියම දැක්ම කෙතරම් දුරට කිතුනු සභාව නතු කරගෙන තිබේ ද? යන්න විමසිල්ලට ගත හැකි කදිම කාල පරිච්ඡේදයකි. තවද එකී විශ්වාසය පතළ කිරීමෙහිලා බිහිවූ කතෝලික සභාවේ ධර්මෝප දේශයට වසර 20 ක් සපිරීම ද මේ සුවිශේෂී අවස්ථාවට නිමිත්තකි. අප ශ්‍රී ලාංකේය පාසල් කතෝලික ධර්මය පෙළ පොත් සහ විෂය නිර්දේශ කතෝලික සභාවේ ධර්මෝපදේශය පදනම්කොට ගෙන සැකසී ඇත. මෙම සමස්ථ ග්‍රන්ථයම සිංහල භාෂාවට පරිවර්තනය කිරීම ඇරැඹි කාර්යය සම්පූර්ණ කිරීමේ කර්තව්‍යයට අප දැන් අත ගසා ඇත. එය ඉතා කඩිනමින් ඔබ අතට පත් කිරීම අපේ දැඩි අපේක්ෂාවයි. එය පරිහරණය කරමින් අපට ඇදහිල්ලේ ගැඹුරට ගමන් කිරීමට හැකියාව උදාවෙනු ඇත.



ජාතික ධර්මෝපදේශ අධ්‍යක්ෂ
**ගරු පියල් ජානක ප්‍රනාන්දු පියතුමා**

# සේවා මධ්‍යස්ථානයේ සේවාවන්

ධර්මාචාර්ය ගුරු විභාග සමත්වීම අතිරේක සුදුසුකමක් ලෙස අද රජය ද පිළිගෙන ඇත. වෙනත් ආගමික පාඨමාලාවන් සඳහා ධර්මාචාර්ය ගුරු විභාග සහතික ප්‍රයෝජනවත් වේ.

**දහම් පාසල් අවසාන සහතික පත්‍ර විභාගය -** ★ ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව මඟින් සංවිධානය කරනු ලබන මෙම විභාගය සඳහා කතෝලික සභාවේ සම්බන්ධීකරණය ජාතික ධර්මෝපදේශ ආයතනය මඟින් ඉටුකරනු ලබයි. එම විභාගයට අදාළ පොත පත නිකුත් කිරීම.

**දැනුවත් කිරීමේ වැඩසටහන් -** ★ අ.පො.ස. සා.පෙළ කතෝලික ධර්මය හා අ.පො.ස. උසස් පෙළ ක්‍රිස්තු ධර්මය විෂයට පෙනී සිටින සිසු දරුවනට මඟ පෙන්වන සම්මන්ත්‍රණ පැවැත්වීම. ★ බයිබල් අධ්‍යයන සම්මේලන, ධර්මෝපදේශය පිළිබඳ සම්මේලන පැවැත්වීම. ★ රජයේ විශේෂ ආගමික වැඩසටහන් සඳහා ආධාර වීම, ජාතික මට්ටමේ තරග සංවිධානය කිරීමට ආධාර වීම.

**පෙළපොත් සැකසීම -** කතෝලික ධර්මය පාසල් පෙළ පොත් සැකසීමට ආධාර දීම සම්පත් දායකත්වය සැපයීම. ★ ඉංග්‍රීසි මාධ්‍යයෙන් කතෝලික ධර්මය හදාරන සිසුන් සඳහා සිංහල පෙළ පොත් ඉංග්‍රීසි භාෂාවෙන් පරිවර්තනය කිරීම.

**ප්‍රශ්න පත්‍ර සැකසීම -** ★ රජය මඟින් පවත්වනු ලබන අ.පො.ස. (සා.පෙළ) සහ අ.පො.ස. (උ.පෙළ) වැනි විභාගයන් සඳහා ප්‍රශ්න පත්‍ර සැකැසීමට හා පිළිතුරු පත්‍ර ඇගයීමේ දී විභාග දෙපාර්තමේන්තුව සමඟ සම්බන්ධ වී කටයුතු කිරීම.

**වෙනත් සේවාවන් -** ★ ජංගම පොත් අලෙවි සේවාව, පාසල් හෝ ආයතනවල ඉල්ලීම පරිදි කතෝලික පොත පත පහසු මිලට සැපයීම. ★ කිතු දහම පිළිබඳ විමසීම්, උපදෙස් පතා පැමිණෙන පිරිස හට මඟ පෙන්වීම් ලබා දීම.

**ජූඩ් රවින්ද්‍ර විනයසිරි පෙරේරා**
ජාතික ධර්මෝපදේශ මධ්‍යස්ථානය

# මාලදිවයිනේ වගතුග

පෘතුගීසින් දිවයිනට කඩා වැදුනේ මාල දිවයිනට යන අරාබි නැව් කණ්ඩායමක් ලුහුබැඳ යන අවස්ථාවක බව ඉතිහාසය සඳහන් කරයි. එසේ ම ඔවුන් ක්‍රි.ව. 1558 සිට 1573 දක්වා දස හත් වසරක කාලයක් බලහත්කාරයෙන් එහි රැඳී සිටි බව ද සඳහන් වන්නේ ය.

මාලදිවයින, සතරැස් සැතැපුම් (මයිල) 28.4 ප්‍රමාණයකින් යුත් ඉන්දියානු සාගරයේ පිහිටා ඇති කුඩා තිත් බඳු දූපත් පේළියකි. පෘතුවියේ ජලාශ්‍රිත පෙදෙසෙන් පහෙන් පංගුවක් හෙවත් සියයට විස්සක මතු තලය ඉන්දියන් සාගරය යි. මෙම කුඩා හිරිගල් දූපත් දෙ දහසකින් පමණ සමන්විත මාලදිවයින අතෝල (atoll) දොළොසකට බෙදා ඇත. මෙහි අගනුවර පිහිටා ඇත්තේ මාලේ දූපතේ ය. ඉහළින් ම උතුරේ පිහිටා ඇති දූපත් පෙළ ඉන්දියාව සතුය. මනිකෝයි නමින් වන මෙය සෙසු දූපත් වැලෙන් සැතැපුම් හැත්තෑ එකක දුරින් වෙන් වී තිබේ.

මෙම දූපත් අතුරින් ජනාවාස පිහිටා ඇත්තේ 220 ක පමණය. මේවායේ සරුවට වවා ඇත්තේ පොල් සහ විවිධ ධාන්‍ය වර්ග යන් ය. එළවළු වර්ග ද වවනු ලැබේ. මෙහි වැඩි දෙනා ධීවර කර්මාන්තයේ යෙදී සිටිති. මාලදිවයිනේ ජනතාව ප්‍රධානකොට ආර්ය ගෝත්‍රයකට අයත් ඉන්දු ආර්යයන් ලෙස පිළිගැනෙන අතර දොළොස් වැනි සත වසරේ දී ඔවුන් ඉස්ලාම් ලබ්ධිය පිළිගෙන ඇත. ක්‍රි.ව. 1558 සිට 17 වසරක පෘතුගීසි පාලනයේ ආදීනවය ඔවුන් ගේ සිත් තුළ තවමත් රැඳී තිබේ.



යටගිය දවස
විශ්‍රාමික අගරදගුරු
අති උතුම්
**ඔස්වල්ඩ් ගෝමිස් හිමිපාණෝ**
**125**

කලක් තුළ මාලදිවයින පැවැතියේ ශ්‍රී ලංකාවේ රැකවරණය යටතේ ය. ක්‍රි.ව. 1887 අස්සන් තබන ලද ගිවිසුමක් අනුව එය බ්‍රිතාන්‍ය රැකවරණය යටතට පත් විය. එහෙත් ක්‍රි.ව. 1965 අගෝස්තු මස ස්වාධීන රටක් බවට පත් වූ මාලදිවයින එක්සත් ජාතීන් ගේ සමුළුවේ සාමාජික රටක් වශයෙන් ශ්‍රී ලංකාව සමඟ තානාපති සම්බන්ධතා පිහිටා ගත්තේ ය. එහෙත් බ්‍රිතාන්‍ය අස්සන් තැබූ ගිවිසුමක් අනුව බ්‍රිතාන්‍ය ගුවන් කඳවුරු කිහිපයක් මෙහි පිහිටා ගන්නා ලදි.

ක්‍රි.ව. 1932 දක්වා මාලදිවයින බොහෝ දුරට පාලනය වී ඇත්තේ සුල්තාන් හෝ සුල්තානී වරුන් ගේ නියෝග අනුවය. රජ පෙළපතක් ලෙස පැවැති මේ පරම්පරාව දේව අනුග්‍රහයෙන් පාලනය කරනු වස් පත් වී ඇතැයි ජනතාව විශ්වාස කළෝ ය. මාලදිවයිනට ඈතට දිව යන ඉතිහාසයක් ඇති අතර ක්‍රි.ව. 1153 දක්වා එය බෞද්ධ බහුතරයක් විසූ රටක් විය. එහි ජනතාව ඉස්ලාම් ලබ්ධිය වැළඳ ගත්තේ ක්‍රි.ව. 1153 දී ය. මාලදිවයිනේ නිල පත්‍රිකා අනුව ඉස්ලාමය ඔවුනට හඳුන්වා දී ඇත්තේ උතුරු අප්‍රිකාවෙන් පැමිණි අබු - උල් - බරකාට් යූසුෆ් අල් බර්බරි නමැති සාන්තුවරයාණන් විසිනි. එවකට රජ කළ සුල්තාන් වරයා ප්‍රථමයෙන් ඉස්ලාම් ලබ්ධිය වැළඳගත් අතර සෙසු ජනයා ද ඒ පසුපස ඉස්ලාමය වැළැඳ ගත්තෝ ය. මෙ තුමා රටේ අරක්ගත් සාන්තුවරයාණන් ලෙස සැලකෙන අතර එතුමා අනුස්මරණය කෙරෙන අලංකාර ස්මාරකයක් මාලෙ නගරයේ පිහිටා තිබේ.

ක්‍රි.ව. 1953 ජනවාරි පළමු දා මාලදිවයින ජනරජයක් බවට පත් වූවත් නැගුණු ඇතැම් ප්‍රශ්න නිසා එම ව්‍යවස්ථාව හරියාකාර ක්‍රියාත්මක වූයේ නැත. මේ අනුව යළිත් රජ පාලනය ආරම්භ විය. ක්‍රි.ව. 1965 දී පූර්ණ නිදහස ලබා ගත් මාලදිවයින යළි ජනමත විමසුමකින් ඉක්බිති ක්‍රි.ව. 1968 නොවැම්බර මස 11 වැනි දා ජනරජ ව්‍යවස්ථාවක් අනුමත කරගත්තේ ය. මේ අනුව එහි ප්‍රථම ජනාධිපති වූයේ අමීර් ඉබ්‍රහිම් නසීර් මහතා ය.

මාලදිවයින ඉස්ලාමීය රටක් බවට පත්කරන ලද්දේ ලංකාවේ බේරුවලින් එහි ගිය ඉස්ලාමීය ලබ්ධිකයකු විසින් යැයි ද කියනු ලැබේ. එහෙත් ඉහත වාර්තා වන්නේ එ රට රජයේ ලේඛන සඳහන් කරති දත්ත අනුව බව සලකන්න.

කෙසේ වෙතත් මාලදිවයින නිදහස් රටක් බවට පත් වූ දා සිටත් ඉන් පෙර සිටත් එහි පොහොසත් දරුවන් උසස් අධ්‍යාපනය සඳහා එවන ලද්දේ ලංකාවට යි. එහි අගමැති ධුරය දැරූ ඩිඩී පවුලේ සිසුන් පවා අධ්‍යාපනය ලැබුවේ කොළඹ සාන්ත ජෝසෆ් මහා විදුහලේ ය. එසේ ම තවත් සිසුවෝ රැසක් කොළඹ සාන්ත පීතර මහා විදුහලේ ද නේවාසිකව රැඳී සිට, අධ්‍යාපනය ලැබූ බව වාර්තා වන්නේ ය. එහි රෝගීන් ප්‍රතිකාර සඳහා පැමිණියේ ද ලංකාවට යි. කලක් දිවයිනේ ජනප්‍රිය වෛද්‍යවරයකු වූ පී. ආර්. අන්තෝනිස් දොස්තර මහතාණන් ඉතා උසස් කොට සලකා ප්‍රතිකාර ලබා ගැනීම සඳහා සොයා ආවෝ ය. රට තුළ අධ්‍යාපනය දියුණු කැර ගැනීම සඳහා ඔවුන් ගුරුවර - ගුරුවරියන් සොයා ආවේ ද ශ්‍රී ලංකාවට යි. රජය විසින් ම සිසු - සිසුවියන් කණ්ඩායම් වශයෙන් අධ්‍යාපනය සඳහා මෙහි එවා ඇති අතර, ලාංකික ගුරුවර ගුරුවරියන් අධ්‍යාපන කටයුතු සඳහා එහි කැඳවාගෙන ද ඇත.

ලංකාවෙන් සැහෙන සේවක - සේවිකාවන් පිරිසක් එහි කලක සිට දායක වී ඇතත් ඔවුන් ගේ ආගමික කටයුතු සඳහා කිසිදු පූජාප්‍රසාදිතුමකු එහි නැත. ක්‍රි.ව. 1956 බ්‍රිතාන්‍යයට අයත් රාජකීය ගුවන් බලකායේ අංශයක් එහි ඩෑන් දූපතේ පිහිටුවීමත් සමඟ කතෝලික භටයන් සඳහා පමණක් පියතුමකු යැවිය හැකි විය. ගුවන් භටයන් ගේ පාපොච්චාරණය ඇසීම සඳහා නිල අවසරය දෙන ලද්දේ කොළඹ අගරදගුරු හිමිපාණන් විසිනි. මෙසේ පිටකොටුවේ දිව්‍ය සත්ප්‍රසාද නිකායට අයත් ඕස්ට්‍රේලියාන ජාතික පියවරුන් ද ජේසු නිකායේ ගරු මොරෑන් පියතුමන් ද හුදෙක් ගුවන් භටයින් ගේ උපාධ්‍යවරුන් ලෙස වරින් වර එහි ගියෝ ය. පසු කල බ්‍රිතාන්‍යයෙන් ම පැමිණි ගරු පියතුමෙක් ඒ සඳහා පත්විය.

මීට අමතරව මාලදිවයිනේ සේවාවන් සඳහා රැඳී සිටි, සහ අදත් රැඳී සිටින, කතෝලිකයෝ වෙති. මේ කිසිවකු සඳහා ආධ්‍යාත්මික සේවාවන් ඉටු කිරීමේ අවසරයක් නැත. කලකට ඉහත එහි ගුරු වෘත්තියේ යෙදී සිටි එක්තරා අයිරීන් ගුණවර්ධන නමැති කාන්තාවක් එහි දී මියගොස් භූමදාන කරන ලදි. එසේ ම ක්‍රි.ව. 1631 දී නැව් බත්වීම හේතුවෙන් එහි ගොඩ වැදුනු ප්‍රන්සිස්කාන නිකායට අයත් පියතුමකු ගේ මිනී වළ ද එහි ඇත. මේ හැර වෙනත් කිසිදු කිතුනු කතෝලික සළකුණක් එහි දකින්නට නො ලැබේ. එ පමණක් නො ව මේවා හැර වෙනත් කිසිදු ආගමික සලකුණක් එහි නැත. ක්‍රි.ව. 1950 දී ඩිඩී අගමැති තුමා ගේ කාරුණික ආරාධනය පරිදි සාන්ත ජෝසෆ් මහා විදුහලේ පාපන්දු කණ්ඩායම එහි ගොස් දස දවසක් තුළ රැඳී සිට පෙරළා පැමිණියහ. ගරු ලූෂන් ස්මිත් පියතුමා ද ඔවුන් සමඟ විය.

ක්‍රි.ව. 1968 දී ලංකාවෙන් එහි ගොස් සිටින පිරිස එක්සියය ඉක්ම විය. ඇතැමුන් තම පවුලේ සියලු දෙනා ද එහි ගෙන ගෙ ාස් සිටියහ. ඔවුන් ගේ එක ම පොදු ආග මික කටයුත්ත වූයේ එක් නිවෙසක සතියට වරක් රැස් වී පූජා ධ්‍යානයට සහභාගී වීම යි. ඉන් බාහිරව කිසිදු ආගමික පිරිසකට දහම් කටයුතු කරනු වස් එහි අවසර නැති බව කිව යුතුයි.

කලා සංග්‍රහය

# සාන්ත සබා මාතාවගේ නොමැකෙන උරුම




**කර්තෘ - ශිරාන් මෛත්‍රී**
**මිල - රු. 200/=**

කතෝලික පාඨක ලොවට ශිරාන් මෛත්‍රී අමුත්තෙක් නොවේ. විසිපස් වසරකට අධික කාලයක් 'ඥානාර්ථ ප්‍රදීපය' ඉපැරණිතම සිංහල පුවත්පතේ සහකාර සංස්කාරකවරයකු වශයෙන්, ලේඛක කර්තව්‍යයෙහිලා ඔහු දක්වා ඇත්තේ ඉමහත් පරිචයකි. ඔහුගේ ලේඛන විදුහුරුය; සරළය; සුමටය; එහෙයින් කියැවීමට රුචිය වඩයි.

ඔහු ග්‍රන්ථ කර්තෘවරයකු වශයෙන් දොරට වැඩියේ 'සාන්තුවර වීරාවලියේ නොදිරන සිරුරු' ග්‍රන්ථයෙනි. එයින්ම ග්‍රන්ථ පරිශීලනයට රුචියක් දක්වන කතෝලික පාඨක ජනතාව අතර ශිරාන් මෛත්‍රි ප්‍රසාදයට පත්විය. උණු කැවුම් මෙන් විකිණී ගිය එම ග්‍රන්ථයට ලැබුණු පාඨක ලොවේ උණුසුම් ප්‍රතිචාරයත් සමග 'සාන්ත සබා මාතාවගේ නොමැකෙන උරුම' ග්‍රන්ථය දැන් දොරට වැඩ ඇත.

එයද එක හුස්මට කියැවීමට රුචි වඩන කලාතුරකින් පාඨක දෝතට පත්වන, කුතුහලය දනවන කථා මාලාවක එකතුවකි. එහි එන මාතෘකා එතෙර මෙතෙර අපූර්ව කථා පුවත් 26 ක් පාදක කරගෙන ලියැවී ඇත. එම චිත්තාකර්ශනීය කථා වස්තුන් රැසක්ම අප බොහොමයකට කියවන්නට ලැබෙන්නේ ප්‍රථම වතාවට වීම එහි සුවිශේෂිත්වයයි.

'මහ සිකුරාදාට පණපිටින් ඇණගැසෙන පැම්පන් ගාවේ කතෝලිකයෝ', 'ලෝකයේ පව් උදෙසා කඳුළු හෙළූ සිරකුසා කඳුලේ දේව මාතාවෝ', 'බිළිඳු සිහින සැබෑ කරන බෙත්ලෙහෙමේ කිරිගල් ගුහාව', 'ජලය යට බැබළෙන ක්‍රිස්තු ප්‍රතිමා' එයින් උදාහරණ කීපයක් පමණි.

සෑම මාතෘකාවකින්ම අලුත් යමක් අපට තිළිණ කරන ශිරාන් මෛත්‍රීගේ ග්‍රන්ථය ගවේෂණශීලි අධ්‍යාපනයේ නියැලෙන අයටත්, පොදුවේ ඉහළ ශ්‍රේණි පාසල්/ දහම් පාසල් දරුවන්ටත්, අලුත් යමක් කියැවීමට කැමැති පාඨක ලේඛක ඕනෑම අයකුටත් අනගි ග්‍රන්ථයකි. ඉතාම ආකර්ශනීය පිට කවරය දේව මාතාවන්ගේ දුර්ලභ චිත්‍රයකින් නිමැවී ඇත.

'සාන්ත සබා මාතාවගේ නොමැකෙන උරුම' ග්‍රන්ථය තිළිණයක් වශයෙන් දරුවකුට, හිතවතකුට, හිතවතියකට, වැඩිහිටියකුට දීමට ඉතාම සුදුසු ය. ශිරාන් මෛත්‍රිට මාධ්‍යවේදියකු ලෙස ආ දුරටත් වැඩිදුරක් ග්‍රන්ථ කර්තෘවරයකු ලෙස සාර්ථකව යාමට සුබාසිංසන!

**සී. ආර්. ඩික්සන් ඇන්ටනි**

ෆිලීෂන් අබයකෝන්ගේ

## සුබස 216

### නිසා පුරා වඩා තුරු

නිසා, සඳහා, උදෙසා, අරබයා තබා පුරා, වඩා, වටා, සිසාරා, පිණිස, මිස, ගැන, හැර දැන් නිපාතයක කාර්යය ඉටුකළද ඇත්තෙන්ම ඒවා පූර්වක්‍රියායි. පිළිබඳ (බැඳුණු) හා මුත් (මිදුණු) නිපාත වේශය ගත් කෘදන්තයි. සිදත් සඟරාවේ නිපාත නිදසුන් අතර මේවා නැත. එහි සෙසු ගී වල නිසා, සඳහා, පිණිස නම් දක්නට ලැබේ.

2012.6.3 ප්‍රදීපයේ 1866 එහි පළමු කතු වැකියේ නිසාපති දිස් වේ. රාත්‍රියේ ස්වාමියා චන්ද්‍රයා නිසාපතිය. රාත්‍රි නිර්මාතෘ නිසා නිසාකරය. නිසාවට/ නිසාවෙන් කීවිට හඳට/ හඳෙන් ලෙසත් තේරුම් ගතහැකිය. පුරා නම් ආදියේ/ පෙරකල අරුතැති සකුවදනකි. පුරාතන, පුරා වස්තු, පුරා විද්‍යාව බලන්න. පුරා බඩු ගැල්පිට, පෙරුම් පුරා. මුල පුරා සඳහා දැන් බොහෝවිට යෙදෙන්නේ පුරා නොව පුරවාය.

DUE TO හා OWNG TO බලාගෙන නිසාවට ලෙසද BECAUSE OF බලාගෙන නිසාවෙන් ලෙසද වැරදි වහරක් ඇති විණැයි ගොසින්, අවුදින්, ලදින් ලෙස පූර්ව ක්‍රියා විටක මඳක් වෙනස් වුවද අර්ථය නොවෙනස්ය. මේ ස්වභාවය නිසා පූර්ව ක්‍රියාවට ක්‍රියා නිපාතය පරිදිද හැඳින්වේ.

වැඩිකර යන තේරුම ඇති වඩා පූර්ව ක්‍රියාව තර නම් තද්ධිත ප්‍රත්‍යයටත් MORE නම් ඉංග්‍රීසි වචනයටත් ගැලපෙන්නට අද භාවිතවේ. එහෙත් විශාලම. විශාලතම, වැඩියෙන් ම විශාල වැනි තැන්වලත් MOST යන්න සිංහලට හරවන අවස්ථාවලත් වඩාම හා වඩාත්ම යෙදීම නුසුදුසු 'වඩා' අගට ඇමුණුණු අනවශ්‍ය කොටස් නිසාය. තෙක්, දක්වා තේරුමට යෙදෙන තුරු වූකලි නිපාතයකි. තාලය හැසිරවීමට සසර පුරා - වසනතුරා, ජීවිතාන්තිමය තුරා යයි වෙනස් කර සැකසුණද නිවැරදි වදන තුරුය. නිසා, පුරා, තුරු යන නිදොස් වහරට පිටුපා නිසාවට, පුරාවට, තුරාවට දික්ගැසුණේ ඇයි? මිනිසාට, සොරාට, මෝරාට මෙන් නිසාට, පුරාට, තුරාට නැත්තේ නිසා ආදිය අප්‍රාණවාචී බැවින් විය හැකිය. ආ-කාරාන්ත හා උ-කාරාන්ත ස්ත්‍රීවාචී හා අචේතන පදවලට 'ව' කාරාගමයක් දිසාව, සුරාව, උෟරුව මෙන් සිද්ධ වේ. නිසා, පුරා ආදිය නිසාවට, නිසාවෙන් සේ විභක්ති වශයෙන් වර නැඟෙන නාමපද වෙතියි වරදන්නන් සිතන්නට ඇති. නිසා සඳහා කතාබහේ කියන හින්දා හා හන්දා විකෘත කිරීමට ජනවහර නම් කිසිසේත් ඉඩ නොදේ. ඒ තබා, ගත්වහරේ 'තබා' කියා කියන, කටවහරේ 'තියා' වචනයටත් පොදු ජනතාව හරස්වෙති.

# මෙනෙහිකරමු ඉරුදින දේව පණිවුඩය



**කර්තෘ - අතිඋතුම් ප්‍රැන්ක් මාකස් ප්‍රනාන්දු රදගුරු හිමි**
**මිළ - රු. 250/=**

ස්වර්ගස්ථ වී වදාළ සලාපුර විශ්‍රාමික රදගුරු අතිඋතුම් ප්‍රැන්ක් මාකස් ප්‍රනාන්දු හිමිපාණන් සිය විශ්‍රාමික දිවිය මුළුමනින් වැයකළේ 'මෙනෙහි කරමු ඉරුදින දේව පණිවුඩය' නම් මේ ග්‍රන්ථ මාලාව සම්පාදනය කිරීමටය. එතුමන්ගේ සග සැපතේ තෙවන සංවත්සරයට මේ ග්‍රන්ථ මාලාවේ තෙවැන්න හෙවත් අවසාන කාණ්ඩය (C වසර) නිකුත් කර තිබේ.

දේව වචනය ජනතාවට සරලව හා සිත් ආකර්ශනය කරගන්නා අයුරින් ඉදිරිපත් කිරීමේ සහජ හැකියාවක් උරුම කරගෙන සිටි ලේඛක රදගුරු හිමිපාණන්ගේ ඒ කුසලතාවය මේ ග්‍රන්ථය පුරා අපූරුවට දිස්වේ. දේව වචනය හුදෙක් කියවා හෝ අසා ඉවතට දමනවාට වඩා එය මෙනෙහි කරමින් ඒ අනුව අපගේ ජීවිත ගොඩනගා ගැනීමට මේ ග්‍රන්ථයෙන් ලැබෙනුයේ අනගි පිටුබලයකි. දේව වචනය ජීවිතයට බද්ධ කරගැනීම සඳහා කදිම මඟ පෙන්වීමක් මින් ලබා ගත හැකි අතර ඉතාමත් සරල සුගම බස් වහරකින් කොයිකාටත් කියවා තේරුම් ගත හැකි ලෙස රචනා කර තිබීම නිසා අගය තව තවත් වැඩිවේ. ඉරුදින දේව පණිවුඩය මෙනෙහි කරමින් දිවි ගෙවන්නට අතිඋතුම් ප්‍රැන්ක් මාකස් ප්‍රනාන්දු හිමිපාණන්ගේ මේ ග්‍රන්ථය සමගින් කතෝලික ජනවන්දනා චක්‍රයේ කාණ්ඩ තුනම (A,B,C) සහිත සම්පූර්ණ ජනවන්දනා සංග්‍රහයක් ශ්‍රී ලාංකික ජනතාවට ලැබීම මහත් සොම්නසකි. මේ සඳහා මඟපෙන්වූ සැමට ප්‍රදීපයෙන් සුබාසිරි!

# විශ්ව කීර්තියට පත්වූ දිව්‍ය සත්ප්‍රසාද ප්‍රාතිහාර්ය




**කර්තෘ - මොරිස් බොල්ලෑගල**
**මිළ - රු. 200/=**

මෙරට ප්‍රකට හා වියත් කතෝලික ගත්කරුවකු ලෙස පරසිඳු මොරිස් බොල්ලෑගලගේ විශ්ව කීර්තියට පත්වූ දිව්‍ය සත්ප්‍රසාද ප්‍රාතිහාර්ය ග්‍රන්ථය කාලයට උචිත මෙරට සිංහල කතෝලික දහම් කෙත සරු ගන්වන්නට සමත් කෘතියකි.

ජොආන් කැරොල් කෘස් නමැති ලේඛිකාවගේ දිව්‍ය සත්ප්‍රසාදයීය ප්‍රාතිහාර්යයන් ග්‍රන්ථය ඇසුරින් ලේඛකයා ඥානාර්ථ ප්‍රදීපය පුවත් පතට ලිපි පෙළක් සැපයූ අතර දැන් ඒ සියල්ල පොතක් ලෙස එක්තැන්වීම අගය කටයුතුය. මෙරට දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ කෙරේ මහත් උද්යෝගිමත් යොමුවක් කතෝලික සැදැහැවතුන් තුළ ඇතිවී තිබෙන වකවානුවක එය වඩ වඩාත් සවිගන්වමින් වැඩිහිටි, බාල, තරුණ සැම සියලුදෙනා තුළ නොදන්නා කරුණු රැසක් පිළිබඳව අවදි කිරීමකට මේ ග්‍රන්ථය හේතුකාරණා වනු නියතය.

දිව්‍ය සත්ප්‍රසාද වසර අවසන් කර දිව්‍ය සත්ප්‍රසාද දශකයක් ප්‍රකාශයට පත්කර ඇති වකවානුවක දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ තුළ ජේසුස් ක්‍රිස්තුන් වහන්සේ සැබැවින්ම වැඩ සිටීමේ සභා ඉගැන්වීම කදිමට තහවුරු කරන්නට මේ ග්‍රන්ථය මහෝපකාරීවේ. කතෝලිකයන්ගේ ආගමික විශ්වාසය වඩ වඩාත් තහවුරු කරන්නටත්, දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ කෙරේ පවතින ගරුබිය හා වන්දනාව වඩ වඩාත් ශක්තිමත් කරමින් ප්‍රචලිත කරන්නටත් මේ ග්‍රන්ථය පිටුවහල් කරගත හැකිය. දිව්‍ය සත්ප්‍රසාද ප්‍රාතිහාර්ය ග්‍රන්ථය ඔස්සේ කතුවරයා මෙරට කතෝලික පාඨකයන් වෙත පිරිනමන දහම් පඬුර සැබවින් අනර්ඝය. දූ දරුවන්ට මෙන්ම වැඩිහිටියන්ටද මේ ග්‍රන්ථය එකසේ වැදගත් බැව් අමුතුවෙන් කිව යුතු නොවේ.

# ජේසුස් වහන්සේගේ ශ්‍රී නාමයේ බලය



**පරිවර්තක - ජූඩ් රවීන්ද්‍ර විනයසිරි පෙරේරා**
**නොමිළේ බෙදාහැරීම පිණිසයි**

දොමිනිකාන නිකායික ප්‍රකට ධර්මධරයකු, ලේඛකයකු වන ගරු පෝල් ඕ සුලිවාන් පියතුමන්ගේ The Wonders of the Holy Name නම් ග්‍රන්ථය සිංහලට පරිවර්තනය කර නොමිළේ බෙදාහැරීමට පරිවර්තක ජූඩ් රවීන්ද්‍ර විනයසිරි පෙරේරා යොමුවීම අගය කටයුතු වැයමකි. ජේසුස් වහන්සේගේ නාමයට වඩා බලවත් නාමයක් විශ්වය තුළ නොමැති බව කතෝලික අපගේ විශ්වාසය යි. මේ නිසාම තාපස තුමන් ස්වකීය යැදුම් දිවියේ දී ප්‍රධාන අංගයක් කරගත්තේ ජේසුස් වහන්සේගේ ශ්‍රී නාමයයි. මේ කෙටි ග්‍රන්ථයෙන් ජේසුස් යන ශ්‍රී නාමයේ අති බලවත්කම තහවුරු කරන සැබෑ නිදසුන් රැසක් ඉදිරිපත් කරයි. ඒ සැම නිදසුනක් පාහේ සාන්තුවර - සාන්තුවරියන්ගේ ජීවිත අත්දැකීම් ඇසුරෙන් ලබාගෙන තිබීම අගය කටයුතුය. මේ ශ්‍රී නාමය මගින් ලෝකය උවදුරු වලින් මුදාගත් අන්දම කතෝලික කොයි කවුරුත් හොඳින් දැනගත යුතු කරුණුය.

දොමිනිකාන පියතුමන් ජේසුන් වහන්සේගේ ශ්‍රී නාමයේ සංගමය මෙහෙයවන අතර කතුවරයා මේ කුඩා පොත් පිංච සම්පාදනය කරන්නට හේතු වන්නට ඇත්තේද ඒ තත්ත්වයයි. කෙසේ වෙතත් කතෝලික බැතිමතුන් සැම සියලුදෙනා දැනගත යුතු - මැනවින් අවබෝධ කරගත යුතු ඒ ඔස්සේ සිය ජීවිත ගමනේදී ක්‍රියාත්මක කළ යුතු දෑ පිළිබඳව අවදි කිරීමට පරිවර්තකයා දැරූ වෑයමට ප්‍රදීපය සිය ආචාරය පුද කරයි. අද බොහෝ තාවකාලික හරසුන් දෑ සඳහා නිකරුනේ මිළ මුදල් නාස්ති කරන කොයි කවුරුත් මෙවන් දහම් පඬුරක් වැඩි වැඩියෙන් මුද්‍රණය කර සැම කතෝලිකයකු අතට පත්කරන්නට උර දෙන්නේ නම් එය ඉතා වැදගත් ධර්මදානීය මෙහෙවරකි.

# හලාවත පදවි දෙව්මැඳුරු මහිමය



**කර්තෘ - ගරු මොරිස් ඇන්ඩර්සන් ප්‍රියකාන්ත පියතුමා**

හලාවත රදගුරු වසමේ දෙව්මැඳුරු පිළිබඳ සංක්ෂිප්ත තොරතුරු අඩංගු ග්‍රන්ථයක් දැන් නිකුත් වී තිබේ. වසර 72 ක ඉතිහාසයකට උරුම හිමිකම් කියන සලාපුර රදගුරු වසම 1939 ජනවාරි 05 වැනිදා අතිඋත්තම දොලොස්වන පියුස් ශුද්ධෝත්තම පියතුමන් විසින් ප්‍රකාශයට පත්කර ස්ථාපිත කරන ලදී.

හලාවත රදගුරු වසම මේ වනවිට මීසම් 44 කින් ද දෙව්මැඳුරු 236 කින්ද සමන්විත වේ. මේ ග්‍රන්ථය මගින් ඒ ඒ මීසම්වල පිහිටි දෙව්මැඳුරු මෙන්ම ඒ ඒ දෙව්මැඳුරට අයත් පවුල් සංඛ්‍යාවත්, කතෝලිකයන් සංඛ්‍යාවත් ඉදිරිපත් කරන්නට සම්පාදක පියතුමා වෙහෙස දරා ඇත. මීට අමතරව හලාවත රදගුරු වසමේ ඉතිහාසගත තොරතුරු - පදවියේ දිසා 4 හා ඒ ඒ දිසාවන්ට අයත් මීසම්ද - ඒවායේ කතෝලික පවුල්, කතෝලික සංඛ්‍යාව, දහම් පාසල් සංඛ්‍යාවද වශයෙන් ඉතා වැදගත් ශාස්ත්‍රීය හා දත්තමය සංඛ්‍යා ලේඛන රැසක් දක්වා ඇත.

හලාවත රදගුරු වසමේ තොරතුරු සංක්ෂිප්තව දක්වමින් - පියතුමන්, පැවදි සොයුරියන්, මීසම් සේවක පියතුමන්, උපාධ්‍ය පියතුමන්, විදේශගත පදවි පියතුමන්, විශ්‍රාමික පියතුමන්, පැවදි නිකායයන්, කන්‍යාරාම, ආයතන, දහම් පාසල් හා දහම් ගුරු සංඛ්‍යාව දක්වා තිබේ. හලාවත පදවියේ පියතුමන්ගේ නම් ලිපින හා දුරකථන අංකද ස්වර්ගස්ථ පියතුමන්ගේ නාමලේඛණයද මෙහි ඇතුළත්ය. ඉතාමත් වටිනා, කාලෝචිත හා හරබර කරුණු රැසක් සාරාංශගත කරමින් මේ ග්‍රන්ථය ඉදිරිපත් කර ඇත. හලාවත රදගුරු වසම ගැන අත්පොතක් බඳු මේ ග්‍රන්ථය සම්පාදනය කළ සම්පාදක ගරු පියතුමාට අපෙන් උණුසුම් සුබපැතුම්!

# තපස් දිවි එකළු කළ බෙනඩික් මුනි චරිතාපදානය




**කර්තෘ - එච්. ඒ. සිරිල් පෙරේරා**

යුරෝපයේ තාපස දිවියේ පියා ලෙස විරුදාවලිය ලත් විශ්ව කතෝලික සභාවට අනුපමේය සේවාවක් ඉටුකළ ශුද්ධවූ බෙනඩික් මුනිඳුන්ගේ චරිතාපදානය දැන් ග්‍රන්ථයක් ලෙස එළිදැක තිබේ. ලෝකයේ අති පරසිඳු බෙනදිකාන නිකායේ නිර්මාතෘවරයාණන් ගැන මෙවන් ග්‍රන්ථයක් මගින් මෙරට සිංහල පාඨකයන් දැනුම්වත් කිරීමට සම්පාදක කතුවරයා පියවර ගැනීම අගය කටයුතු කාර්යයකි.

බෙනදිකාන නිකා ඉතිහාසය තුළ සාන්තුවරයන් 5000 ක් ද - ශුද්ධෝත්තම පියතුමන් විසිහතර නමක්ද, රදගුරු හිමිපාණන් 4000 ක් ද බිහිකර ඇතැයි පෙරවදනේ දැක්වේ. මේ ග්‍රන්ථය කියවීමෙන් සාන්ත බෙනඩික් මුනිතුමාගේ ජීවිත කතාවත්, ලෝක පූජිත අනගි සේවාවත්, අසමසමවූත්, ප්‍රාතිහාර්යාත්මක වූත් බෙනදිකාන පදක්කමත්. ශ්‍රී ලංකාවේ එම නිකායේ මහා මෙහෙවරත් ගැන දැන ගැනීමට අවකාශ සැලසේ. මෙරට දූ දරුවන් තබා වැඩිහිටියන්වත් මේ තොරතුරු නිවැරැදිව දැන සිටින්නේ දැයි යන්න සැක සහිතය.

කතෝලික සසුන තුළ සාදුවර චරිතයක් මෙන්ම දුරදක්නා නුවණින් යුතු මහා ප්‍රාඥයකු වූ එතුමා යැදුම්බර දිවියත්, ශ්‍රම ශක්තියෙන් වැඩ කිරීම මගින් යහපත් දින චර්යාවන් සකස් කර ගැනීමේ වැදගත් කමත් පෙන්නා දුන්නේය. යුරෝපයේ ආගමික පුනරුදයේ පුරෝගාමිත්වය බෙනදිකාන නිකාය දැරූ අතර ඒ නිසාම ශු. බෙනඩික් තුමන්ව 'යුරෝපයේ පියා' ලෙස හඳුන්වන්නේය.

බෙනදිකාන පදක්කම එදා කිතුනුවන් අතර ඉතා ප්‍රචලිත වූයේ යක්ෂ බලපෑම් වලින් ආරක්ෂා වීමේ බලගතු අවියක් ලෙසයි. කතුවරයා මේ ග්‍රන්ථයෙන් ඉටුකර ඇති සාසනික හා සාහිත්‍යයික සේවාව සුළුපටු නොවේ. ඉදිරියටත් මෙවන් පතපොත පළකරන්නට සුදතුම් වරම් බහුලව ලැබේවායි ප්‍රදීපය සුබාසිංසන පුදකරයි.

**මෛත්‍රී**

176

ගරු තිලකසිරි ප්‍රනාන්දු පැ.තූ.නි සොයුරු



| | |
|---|---|
| මැක්කට දුර ගමන් යන්න බෑ තනියම හරි | හනිකට |
| බල්ල එක්ක දුර ගමනක් යනවා උන් යාළු | දාට |
| ලූලෙක් නැති වලට බැස්ස දණ්ඩි පැටව් රජ | වෙනකොට |
| තිත්ත පැටව් දිලිසෙනවලු රෑට උනත් | අන්ධයන්ට |
| රෑ තෙමිච්ච කුකුලට සීතල දවසක් | නෑ |
| කපුට විලේ පීනුවාට හංස වෙන්නේ | නෑ |
| බල්ලෙක් බිරුවාට කන්ද කඩා වැටෙන් | නෑ |
| වැඩ බැරි උන් උඩ පැන්නට මෙලෝ රහසක් | නෑ |

**ගායනය : බල්ලපාන කේශර**

බැසිල් ෆොන්සේකා විසිනි

# ඉස්තාන්බූල් හී සමයාන්තර මහා සමුළුව බලාපොරොත්තු දල්වයි



මැදපෙරදිග රටවලැ ආගමික යහපැවැත්ම හා සංහිඳියාව පිළිබඳ ඉදිරි බලාපොරොත්තු දනවන මහා සමුළුවක් සැප්තැම්බර් මස 7 සහ 8 දිනයන් හී ඉස්තාන්බුල් හී පැවැති බැව් වතිකාන පුවත් වාර්තා කරයි. ඉස්ලාම් අධ්‍යාපනය පිළිබඳ තුර්කියේ ආගමික පදනම ද, මැදපෙරදිග අධ්‍යයන කටයුතු සඳහා වන මර්මරා විශ්ව විද්‍යාලීය ආයතනය ද විසින් මෙම සමුළුව සංවිධානය කර තිබුණි. සමයාන්තර කතිකාව පිළිබඳව සුද්ධාසන කවුන්සලයේ නව ලේකම් මිගෙල් අවුසෝ පියතුමා ඇතුළු දේශපාලනඥයෝද හාස්ත්‍රඥයෝ ද ප්‍රතිපත්ති සම්පාදකයෝ ද සංනිවේදකයෝ ද පිරිසක් ඊට සහභාගි වූහ.

එහිදී ඉලක්ක කොටගත් කරුණු කාරණා පිළිබඳ සම්පිණ්ඩනය මෙලෙස වේ.

"මෑත ඉතිහාසයේ ප්‍රථම වතාවට ලෝකයේ ඉහළ මට්ටමේ දැන උගත් ඉස්ලාම් හා කිතුනු නායකයෝ පිරිසක් මෙම සමුළුවට සහභාගි වූහ. මැදපෙරදිග පිබිදීම අරභයා එක් එක් අංශ වලින් සහභාගි වූ ප්‍රාඥයන් විසින් සිය මතිමතාන්තර හා යෝජනා ඉදිරිපත් කරනු ලැබීය.

නව සංකල්පනා සහිත නව මැදපෙරදිග රටවල් තුළ පවත්නා විවිධ සංස්කෘතීන් ආරක්ෂා කරමින් ජාතික ඒකාබද්ධතාවයන් හා බහු ආගමික පැවැත්ම සනිටුහන් කරගත යුතු බවට එකඟතාවයන් ඇති වී, බහු ආගමික පැවැතුම් හා සංස්කෘතීන්, එකමුතුව කෙරෙහි බාධාවන් ලෙසින් නොව සම්පත් වශයෙන් යොදාගත යුතු බැව් ද සනාථ කෙරිණි. විවිධ ආගම් හා කණ්ඩායම් අතර පොදු හා පෞද්ගලික නිදහස සුරැකීමේ සමාජ නීතිරීති පැනවිය යුතු යයි ද පිළි ගැණිනි. ඒකාධිපති පාලන ක්‍රමයන් විසින් ආගම් දඩමීමා කරගන්නා බැවින් ඒ පිළිබඳව ආගමික නායකයින් දැනුවත්ව සිටිය යුතු බැව් ද අවධාරණය කරනු ලැබීය.

කෙසේ වුවද උදාවෙමින් පවත්නා මැදපෙරදිග රටවල් භෞතික හා ධාර්මික වශයෙන් වර්ධනය කරා ගෙන යාමට, ආගම් විසින් කුමන දායකත්වයක් ලබා දිය යුතු ද යන්න කෙරෙහි ද සාකච්ඡා කරන ලදී.

එම අරමුණු සාක්ෂාත් කරගැන්ම සඳහා පොදු සංනිවේදනය ද සංස්කෘතික දායාදයන් ද, අධ්‍යයන ආයතනයන් ද නොතිත් උගැන්වීම් ද ආගමික නායකයන් ද විසින් සුවිසල් දායකත්වයක් දිය හැකි නිසා, ඉදිරියේදී සක්‍රීය ක්‍රියාදාමයක් ඉදිරිපත් කිරීමට ද එකඟත්වය පළ කරනු ලැබීය.

# න්‍යෂ්ටික විරෝධතා කරුවන්ට වෙඩි ; දෙව් මැඳුරකට නිගරු

තමිල් නාඩුවේ කුඩක්කලාම් නම් න්‍යෂ්ටික බලාගාරයට එරෙහි සාමකාමි විරෝධතාවයක් සැප්තැම්බර් මස 10 වෙනිදා ඉඩන්තකාරි නම් නගරයේදී පැවැත්විණි. පොලීසිය විසින් එම සාමකාමි විරෝධතා කරුවන්ට වෙඩි තබා ඇත. වෙඩි තැබීමෙන් 40 හැවිරිදි ධීවරයෙක් හා සය හැවිරිදි දැරියක් ජීවිතක්ෂයට පත්වූහ. එම දැරියගේ දෙමාපියන් දෙදෙනා ද තවමැ සොයාගෙන නැත.

මෙම ශෝක ජනක සිද්ධිය ජාත්‍යන්තර කිතුනු මාධ්‍යය වෙත ඉදිරිපත් කරමින් සමාජ ක්‍රියාකරුවකු වන එක්ස්. ඩී. සිල්වරාජ් පියතුමා මෙලෙස ප්‍රකාශ කළේය. "විරෝධතා කරුවන් කිසිදු ආයුදයක් දරා සිටියේ නැහැ. ඔවුන් නියුක්තව සිටියෙ සාමකාමී විරෝධතාවයකයි. විරෝධ කරුවන් අතර ගැහැනුන් හා ළමයි විශාල පිරිසක් ද සිටියා. විරෝධතා කරුවන් එලෙස සාමකාමීව හැසුරුනත්, පොලීසිය ඔවුන්ට සැළැකුවේ, අපරාධ කරුවන් ලෙසටයි. විරෝධතා කරුවන්ගෙන් වැඩි දෙනෙක් කතෝලිකයන් වූවා. පොලීසියේ ඇතැමුන් ආගමට ද පරිභව කරන්නට වූවා. සමහර පොලිස් භටයන් ලගතුබු දෙව් මැඳුරට ඇතුලු වී ලූර්දු හී අප ස්වාමිදුගේ ප්‍රතිමාව කඩා බිම හෙළුවා. සමහරු දෙව් මැඳුර තුළ මුත්‍රාකළා. තවත් ප්‍රතිමා කීපයකට ද හානි කර තිබුණා. එමෙන්මැ විරෝධතා කරුවන් සඳහා ආහාර පිසමින් සිටි තැනැත්තන් එළවා දමා, ආහාර වලට වැලි දැම්මා. තවද ගෙවල් දොරවල් ඇතුළට කඩා වැද ජනතාවට හිරිහැර කරමින් ඔවුන් බිය වැද්දුවා. පොලීසියේ මෙම දින හීන ක්‍රියාව සම්බන්ධයෙන් ස්වාධීන අධිකරණ පරීක්ෂණයක් අපට ඉල්ලා සිටිනවා."

රුසියානු ආධාර ඇතිව මෙම න්‍යෂ්ටික බලාගාරය ගොඩ නැගීම ආරම්භ කරනු ලැබුවේ, වර්ෂ 1987 දීය. එහෙත් ජනතාවගේ විරෝධතාවයන් නිසා මෙම බලාගාරය සම්පූර්ණ කිරීම දිගින් දිගටම කල් ගතවී ඇත. පසුගිය වසරේදීද විශාල පිරිසක් උපවාසයේ යෙදෙමින් න්‍යෂ්ටික බලාගාරය සම්පූර්ණයෙන් නවතා දැමිය යුතු යයි විරෝධතාවය පළ කළත්, එය ඉටුවන ලකුනක් නොමැති හෙයින් මෙම විරෝධතාවය යළි යළිත් දියත් කරනු ලැබේ.







# සෝවියට් වදකාගාරයක් තුබූ තැන පාතිමා මාතා දේවස්ථානයක්

කසකස්ථානයේ සෝවියට් පාලනය පැවැති සමයේදී, වදකාගාරයක් පැවැති, කරාග න්ඩා හී පාතිමා අප ස්වාමිදුගේ ආසන දෙව් මැඳුර, සැප්තැම්බර් මස 09 වෙනි ඉරිදා ආසිරි ගන්වන ලදී. මෙම ආසන දෙව් මැඳුර අති උතුම් XVI වැනි බෙනඩික්ට් සුදොතුම් පියා වෙනුවෙන් ආසිරි ගන්වනු ලැබුවේ කාර්දිනල් ඇන්ජලෝ සොදානෝ හිමිපාණන් විසිනි. මෙම ආසිරි ගැන්වීමේ මහෝත්සවයට කතෝලික හා ඔතොඩොක්ස් සභා බැතිමත්තු 1500 පමණ දෙනෙක් ද, මුස්ලිම් නායකයෝ ද, රාජ්‍ය නිළධාරීහු ද සහභාගි වූහ.

"මෙම ආසන දෙව් මැඳුර කසකස්ථානයේ හා අනෙකුත් සෝවියට් පාලනය තුබු රටවලැ ජීවත්ව සිට සිය දිවි පූජා කරමින් කිතුනුවන් හෙලූ රුධිරයේ අග්‍ර ඵලයක් වෙනවා. "එලෙස ප්‍රකාශ කළේ කරාන්ඩා හී දෙව්සත්හලේ අධ්‍යක්ෂ පිඩට් පිට්ලොවල් පියතුමා විසිනි. තවද සෝවියට් පාලනය යටතේ තුබු සියළු රටවල් පාතිමා මැණියන්ගේ ර කවරණයට බාර දෙන බවත් ඈ විසින් දැනටමත් ප්‍රාතිහාර්යයන් සිදුකර ඇතිවා මෙන්මැ, මෙම ආසන දෙව් මැඳුර තැනීම සඳහා රාජ්‍ය අවසරය ලැබීම ද පෙළහරක් බැව් එතුමා විසින් ප්‍රකාශ කරනු ලැබීය.

කසකස්ථානය සෝවියට් පාලන සමයේදී සිරකඳවුරක්ව පැවැතියා. ආගමික හා දේශපාලන සිරකරුවන් එම සිර කඳවුරු තුළ සිරකොට තබන ලදී. පෝලන්තය, යුක්‍රේනියාව, ජර්මනිය, නිතුඑ්නියාව, බෙලාරුස් යන රටවලින් පිටුවහල් කරනු ලැබූ කිතුනුවන් කසකස්තානයේ මෙම කරාගන්ඩා ප්‍රදේශයේ ඒ ඒ රැඳවුම් කඳවුරු තුළ සිරකොට තබන ලදි. එම අඳුරු කාල පරිච්ඡේදය තුළදී, එසේ පීඩාවට ලක් කැරුණු කිතුනුවන් ඇතුළු පූජකවරු හා රදගුරු හිමිවරුද සිටියහ. ඒ අතුරෙන් නිකිටා බ්‍රඩෙත් රදගුරු තුමා ද අලෙක්ෂිඩ් ෂරිටාස් පියතුමා ද ඇදැහිල්ල වෙනුවෙන් සිය ජීවිත පූජා කළහ. ගිහි කිතුනුවෝ ද විශාල සංඛ්‍යාවක් දෙව් සමිඳාණන් වෙනුවෙන් එම සිර කඳවුරු වලැ ජීවිත පූජා කළහ. එම නිසාවෙන් මෙම පාතිමා මාතා ආසන දෙව් මැඳුර යාච්ඤාවේ හා වන්දි ගෙවීමේ කේන්ද්‍රස්ථානයක් ලෙසින් සැමදෙනා පිළිගනිති.

# ඉරාකය හා මැදපෙරදිග හැරයන කිතුනුවෝ

කිතු දහමේ උපන් බිම වශයෙන් සැළැකෙන මැදපෙරදිග හැරදා යන කිතුනුවන්ගේ සංඛ්‍යාව වැඩි වෙමින් පවත්නා බැව්, ඒ ගැන විවෘත තක්සේරුවක් කරති ඉරාකයේ කර්කුක් හී ලුවිස් සෝකෝ රදගුරු හිමිපාණෝ පවසති. ඉරාකය ද සිරියාවද ඇතුළු මැදපෙරදිග බොහෝ රටවලැ කිතුනුවන්, වසර දහස් ගණනාවක් පුරා සිය පරම්පරාවන්ට නිජ භූමිය වු ඒ ඒ මැදපෙරදිග රටවල් හැරපියා වෙන්ව යාම වේදනාකාරි වේ යයි එතුමෝ පවසති. එතුමන් විසින් තවදුරටත් මෙලෙසින් ද පවසා ඇත.

"ප්‍රජාතන්ත්‍රවාදය හා ආගමික නිදහස පිළිබඳ දේශපාලන ප්‍රකාශයන් කොතෙක් කැරුණත් අන්තවාදය ද බෙදුම් වාදය ද වර්ධනය වීම නිසා කිතුනුවන් මැදපෙරදිග හැර යාම දිගටම කෙරී ගෙන යනවා. ඉස්ලාම් දහම දේශපාලනිකරණයට යටත් වී ඇත. ඒ අනුව කිතුනුවන් සම පුරවැසියන් සේ සළකනු නොලැබේ. බෙදුම් වාදය අනුව බහුතර පුරවැසියන්ට සියලු වරප්‍රසාදයන් ලැබෙන අතර සුළුතර ආගමිකයන්ට හා ජනතාවන්ට ලැබෙන්නේ කුඩම්මාගේ සැළකිලිය. වර්ෂ 2003 දී සදාම් හුසේන්ගේ පාලනය බිඳ වැටීමත් සමඟ ඉරාකයේ කිතුනු පීඩාවන් ද උග්‍ර වී ඇත. ඒ ඒ වකවානු වලදී දෙව් මැඳුර විශාල සංඛ්‍යාවක් විනාශ කර දමන ලදී. අදත්, එම පීඩාවන් හී කිසිදු අඩුවක් දක්නට නොමැත. මගේ පදවියේ පවා ඉතිරි වී ඇත්තේ පවුල් කීපයකි. ඔවුන් රඳවා ගැනීම සඳහා ඔවුන් සමඟ නිරන්තර සම්බන්ධතාවයකින් ජීවත් වෙනවා. තමන් සම පුරවැසියන් සේ රජයන් විසින් පවා නොතැකීමේ හේතුවෙන් මැදපෙරදිග පැවැත්ම කිතුනුවන්ට තිත්ත වී ඇත."

ක්‍රිස්තුන් වහන්සේගේ ජීවන දායක පණිවුඩය මැදපෙරදිග කිතුනුවන් තුළ යළි පණ ගැන්වීම සඳහා සක්‍රීය වැඩ පිළිවෙළක් සභා මාතාව විසින් ඉදිරිපත් කළ යුතු යයි ද එතුමෝ අවධාරණය කරති. මැදපෙරදිග සියලු පූජක පිරිස් එක මතයකට එළැඹ සුදොතුම් පියා සමඟ සක්‍රීය ක්‍රියාදාමයක් සඳහා තීරණ ගතයුතු යයි ද එතුමෝ පෙන්වා දෙති. විශ්ව සභාවේ දේව ධර්මයන්ට විරුද්ධ නොවන මැදපෙරදිග සංස්කෘතියට ඔබින කිතුනු අරාබි දේව ධාර්මික උගැන්වීමක් ප්‍රකාශයට පත් කිරීමේ කාලය එළඹ ඇතැයි ද එතුමෝ තවදුරටත් ප්‍රකාශ කරති.

# කිතුනු රාජ්‍යයක් කියා ව්‍යවස්ථා ගත නොකරන්නැයි ඉල්ලති

සැම්බියා රාජ්‍යය සඳහා නව ව්‍යවස්ථාවක් නිර්මාණය කිරීමේ කාර්ය තුන් වතාවකදී අසාර්ථක වී ඇත. හතරවෙනි වතාවේදී එම ව්‍යවස්ථා සම්පාදනය සාර්ථක වේ යැයි ව්‍යවස්ථා සම්පාදක කමිටුව විසින් ප්‍රකාශ කරති. නව ව්‍යවස්ථාව තුළ මරණීය දඬුවම ද, ගබ්සාව ද නීති ගත නොකළ යුතු යයි සැම්බියාවේ රදගුරු මණ්ඩලය ප්‍රකාශ කරයි. තවද රදගුරු හිමියෝ මෙලෙස ද කරුණු දක්වති. "සැම්බියාව කිතුනු දේශයකි" යන යෝජිත ප්‍රකාශය ද ව්‍යවස්ථා ගත නොකළ යුතුය. මන්දයත් එවන් හුදු ප්‍රකාශයකින් පමණක් කිතුනු වටිනාකම් හා වාර්තාවන් රටක් විසින් අනුගමනය කළ නොහැකි නිසාය. තවද රාජ්‍ය සහ ආගම් එකිනෙකට වෙනස් යන ධර්මතාවය බිඳ නොදැමිය යුතුය. එමෙන්මැ සැම්බියාව බහු ආගමික රටක් වශයෙන් යෝජිත ව්‍යවස්ථා පූර්විකාව හඳුන්වා දී තිබියදී සැම්බියාව කිතුනු රාජ්‍යයක් වශයෙන් ව්‍යවස්ථා ගත කිරීම එකිනෙකට පරස්පර වනු ඇත." සැම්බියාවේ රදගුරු හිමිවරුන්ගේ මෙම ප්‍රකාශය සුළුතර කිතුනුවන් පීඩාවට පත් කෙරෙන ලෝකයේ ඇතැම් රටවලැ නායකයන්ගේ දෑස් සත්‍යය කෙරෙහි විවර කරනු ඇතැයි ද කිතුනු පුවත් වාර්තා කරයි.

# පැහැරගත් කිතුනු දරුවන් ඉස්ලාම් දහමට හැරවේ

බංගලදේශයේ තිපුරි ගෝත්‍රයට අයත් කිතුනු දරුවන් නගරබද මිෂනාරි පාසල් වලට ඇතුළත් කැරෙන බවට පොරොන්දු දෙමින් ඔවුන් රැගෙන ගොස් ඉස්ලාම් පිරිස් වෙත ඒ දරුවන් විකිණීමේ ජාවාරමක් හෙළිවී ඇත. එලෙස විකුණනු ලබන කිතුනු දරුවන් ඉස්ලාම් දහමට බලයෙන් හරවා ගැනේ. මේ වන විට, තිපුර ගෝත්‍රික ගම්මානවල ජීවත් වූ දරුවන් 300-400 සංඛ්‍යාවක් එසේ බලෙන් රැඳවාගෙන ඉස්ලාම් දහමට හරවාගෙන ඇතැයි ද වාර්තා වී ඇත. තිපුරි ගෝත්‍රිකයෝ දිළිඳු ජනතාවක් වෙති. එබැවින් සුළු මුදලක් දී එම දරුවන් හට යහපතක් සැළැසෙනු ලැබේ යයි වංචා කොට ඔවුන් රැගෙන යාම ලෙහෙසි කාර්යයකි. අවසන් වරට රැගෙන ගොස් ඇති දරුවන් 11 දෙනා බංගලදේශයේ මිනිස් අයිතිවාසිකම් පිළිබඳ සංවිධානය විසින්, මාස තුන හතරක කාලයක් පුරා වෙහෙස දරා බේරාගෙන ඇත. බංගලාදේශයේ කඳුකර ප්‍රදේශයන් හී විසිරි ගම්මානයන්වල ජීවත් වන තිපුරි ගෝත්‍රිකයන්ගෙන් බහුතරය කිතුනුවෝය. එම දුර්දාන්ත ක්‍රියාවට හසු වූ වැඩි කිතුනු දරුවන් සංඛ්‍යාවක් එම ප්‍රදේශයේය.

# පිරිසක් කිතුනු දහමට හැරෙව්වායි කිතුනු නායකයා හිරේට

ලාඕස් හී මධ්‍ය ප්‍රදේශයේ වෙසෙන පුරවැසියන් 300 දෙනෙක් කිතුනු දහමට හරවා ඇතැයි යන චෝදනාව මත බවුන්තෙයුන්ග් නමැති කිතුනු නායකයා සිරභාරයට ගෙන ඇතැයි 'ජගත් කිතුනු සහෝදරත්ව' සංවිධානය විසින් වාර්තා කරැත. ඔහු සිරභාරයට ගෙන ඇත්තේ සති දෙකකට ඉහතදීය. ඔහුව සිරභාරයට ගැනීමට පෙරාතුව දෙවතාවකදීමැ දැඩි ලෙස තර්ජනය කරමින් ඔහුව පීඩාවට ලක්කොට ඇත. ප්‍රාදේශීය බලධාරීන් විසින් කිතු දහම වැළඳගත් එම ජනයාට තර්ජනය කරමින් නියෝග කර ඇත්තේ ඔවුන් කිතුනු දහම යළි ප්‍රතික්ෂේප නොකළහොත්. ඔවුන්ව පදිංචි ගමෙන් පිටුවහල් කරනා බවයි. කිතුනු ආගම වැළඳගත් එම පිරිස ලාඕසයේ උපන් පුරවැසියන් වුවද කිතු දහම ප්‍රතික්ෂේප නොකළහොත් පුරවැසි භාවය ද තහනම් කැරෙනා බවට ද තර්ජන පවතී. වර්ෂ 1991 දී සම්මත කරන ලද ලාඕසයේ ව්‍යවස්ථාව අනුව එහි සියලු වැසියන්ට ඕනෑම ආගමක් ඇදහීමේ නිදහස ඇති නමුත්, කිතුනු ආගම ඇතුළු අන් සියලු ආගම් අදහන අය පීඩාවට ලක් කිරීම නිරන්තරයෙන් සිදුවේ. ආගමික නිදහස මිනිස් අයිතිවාසිකමක් නිසා එය කඩ නොකළ යුතු යයි 'හියුමන් රයිට්ස් වොච්' නම් ජාත්‍යන්තර සංවිධානය විසින් ද ලාඕස් රාජ්‍යය වෙත නිරන්තරයෙන් කරුණු පෙන්වා දෙනු ලබන නමුත්, බොහෝ අවස්ථාවන් හිදී, ගම් මට්ටමේ කිතුනුවන්ට කෙරෙන තාඩන පීඩන ඇතිවීම වළක්වාලීමක් නම් සිදු නොවේ.




## ජන වන්දනා චක්‍රලේඛන - 06

# කොළඹ අගරදගුරු පදවියේ අගරදගුරු අති උතුම් මැල්කම් කාදිනල් රංජිත් හිමිපාණන් විසින් විශ්වාසයේ වසර නිමිත්තෙන් ඉදිරිපත් කරනු ලබන චක්‍ර ලේඛනය



කොළඹ අගරදගුරු පදවියේ සියලුම පූජාප්‍රසාදිවරුන්, පැවිදි සොහොයුරු සොහොයුරියන් හා ගිහි සැදැහැවතුන් ද වෙතට ය,

ක්‍රිස්තුන් වහන්සේ තුළ ආදරණීය සහෝදර සහෝදරියනි,

විශ්වාසය අපට දෙවියන් වහන්සේගෙන් ලැබුණ මාහැඟි තිළිණයකි. දේව පුත්‍රයාණන් වන ජේසුස් ක්‍රිස්තුන් වහන්සේගේ ප්‍රේමය තුළින් අපට අනාවරණය කළාවූ දෙවියන් වහන්සේගේ අභිරහසෙහි පූර්ණත්වය සොයා ගැනීමට එය අපට මඟ පෙන්වයි. ඒ ඉශ්‍රායෙල් ජනතාවගේ ඉතිහාසය පුරා තමන් වහන්සේගේ ප්‍රේමණීය මැදිහත්වීම් ඔස්සේ, දෙවියන් වහන්සේ උන්වහන්සේගේ අසීමිත කරුණාව අප වෙත අනාවරණය කිරීම සඳහා ඒ වන විටත් ආරම්භ කර තිබූ එම අභිරහස්මය. දෙවියන් වහන්සේම එම ස්ව - අනාවරණයේ ක්‍රියාවලිය ජේසුස් වහන්සේ තුළ පූර්ණත්වය කරා ගෙන ගිය සේක. හෙබ්‍රෙව්වරුන්ට ලියූ හසුන පවසන පරිදි "දෙවියන් වහන්සේ ආදි යුගවල දී නොයෙක් විට ද විවිධාකාරයෙන් ද, දිවැසිවරයන් මඟින් අපේ පියවරුනට කතා කළ සේක. එහෙත් දැන් මේ අවසාන කාලයේ දී උන්වහන්සේ සිය පුත්‍රයාණන් මඟින් අපට කතා කළ සේක" (හෙබ්‍රෙව් 1:1-2). නව පැවැත්මකට අපට ඇරයුම් කරන්නේ ද මෙම විශ්වාසයේ අභිරහසමය. එය ස්වකීය පුත්‍රයාණන් වන ජේසුස් වහන්සේ මඟින් සහ ශුද්ධාත්මයාණන් වහන්සේගේ බලය තුළින්, දෙවියන් වහන්සේ සමඟ ගැඹුරු ඒකත්වයක් තුළ වන පැවැත්මකි. එය, ශු. පාවුලුතුමා ප්‍රකාශ කළ පරිදි දෙවියන් වහන්සේගේ ප්‍රේමයේ "දිගත්, පළලත්, උසත්, ගැඹුරත්" (එපීස 3:18) අත්දැකීමට හැකියාව ලබා දෙන පැවැත්මකි. තමන් සතුකර ගන්නාට ගැළවීම ලබා දෙන්නාවූ දෙවියන් වහන්සේගේ ප්‍රේමය සොයා ගැනීමට සහ ඒ තුළම වර්ධනය වීමට අපට සහය වන විශ්වාසය හා අප අතර බැඳීම අප ජීවිතය පුද්ගලයින් ලෙස සහ සංඝයන් ලෙස, පාපයට වහල්වීමේ සියලු ආකාර දුර්පරික්ෂාවන්ගෙන්ද, ආත්මාර්ථයෙන් සහ මරණයෙන් ද නිදහස් වීමට අපට සහයවන අතර, එය ලෝකයට කිසි විටෙක ලබාදීමට නොහැකි නිදහසේ සහ ගරුත්වයේ උසස්තර මට්ටමකට අප ගෙන යන්නේය.

### ඒකත්වයට ඇරයුම

ක්‍රිස්තුන් වහන්සේගේ ශ්‍රාවකයින් ලෙස පෙරලා ලෝකයට පිළිගැන්වීමට අපට හැකි වන්නේද මෙම සාරවත් බවය. "මූලාරම්භයේ පටන් වූ. . . . කණින් ඇසූ, අපේ ඇස්වලින් දැක බලා, අපේ අත්වලින් ස්පර්ශ කළ සදාතන ජීවනය . . . . . අප ඇසූ දුටු . . . . " (1 ජොහාන් 1:1-3). විශ්වාසය අපට අනාවරණය කර ඇති, ශ්‍රේෂ්ඨත්වයට පත් කරන සහ නිදහස් කරන මෙම සුවිසල් ප්‍රේමයේ සුබාරංචිය මෙය ය. අන්‍යයන් සමඟ අපගේ ප්‍රීතිය බෙදා හදා ගැනීම වන, එම අභියෝගයට මුහුණ දී සිටින අප, දෙවියන් වහන්සේ සමඟ ඇති ඒකත්වයේ අලංකාරයට නිරන්තරයෙන්ම විවෘතව සිටීම අවශ්‍යය. එම ඒකත්වය එහි සත්‍ය උල්පත සහ මූලාරම්භය වෙයි. "සමස්තයක් ලෙස සාන්ත සභාව ද, ඇයගේ සියළු එඬේරුන් ද, ක්‍රිස්තුන් වහන්සේ මෙන් ජනතාව පාළුකරයෙන් ඉවතට ගෙන, ජීවනයේ පැවැත්ම මෙන්ම දේව පුත්‍රයාණන් සමඟ මිත්‍රත්වය කරා, එනම් අපට බහුලව ජීවිතය දානය කරන තැනැන්වහන්සේ කරා, ඔවුන් මෙහෙයවීමට අරමුණු කොට ගත යුතුයැ"යි පවසද්දී [2005 අප්‍රේල් 24 දා රෝමයේ රදගුරු තුමන්ගේ දූත කාර්යයේ ආරම්භක දේව මෙහෙයේ දේශනය; 97 (2005) 710] ඇත්ත වශයෙන්ම සොළොස්වන බෙනඩික්ට් ශුද්ධෝත්තම පියතුමන් පේදුරු තුමන්ගේ තැන ගන්නා අය ලෙස තම දූත සේවාව ආරම්භයේදීම සාන්ත සභාව ඉදිරියේ තැබූ ආරාධනය මෙයයි. එහෙයින් දෙවියන් වහන්සේ සමඟ අපගේ ඒකත්වය ශක්තිමත් කර ගැනීම වෙත ද උන්වහන්සේ තුළ ගැඹුරු විශ්වාසයේ ආකල්පයන් වෙත ද උන්වහන්සේව දැනගැනීමට, උන්වහන්සේට ප්‍රේම කිරීමට සහ සේවය කිරීමට ශුද්ධෝත්තම පියතුමන් 'විශ්වාසයේ දොරටුව' (Porta Fidei) නමැති විශ්වාසයේ වසර කැඳවමින් ලියූ ස්වකීය අපෝස්තලික සංදේශය තුළින් අප සැමට ඇරයුම් කර තිබේ.

නිරන්තර සිත්හැරීමේ මෙම ස්ප්‍රීතුව නොමැති වීමෙන්, සාන්ත සභාවේ විශ්වාසය වඩා සමාජයීය, සංස්කෘතික සහ දේශපාලනික කැපවීමක් ලෙස දැකීමේ ලෞකිකායන ක්‍රියාවලියක් සභාව තුළට සෙමින් ඇතුළුවෙමින් පවතින, ආධ්‍යාත්මිකත්වයෙන් අප බැහැර කිරීමේ අනතුර එතුමෝ දකිති. ශුද්ධෝත්තම පියතුමෝ මෙසේ ද කියති: ක්‍රිස්තියානි ජනතාව තම කැපවීමෙහි සමාජයීය, සංස්කෘතික සහ දේශපාලනික ප්‍රතිවිපාක පිළිබඳව වඩා සැලකිලිමත් වීම බොහෝ විට සිදුවෙයි. ඔවුහු විශ්වාසය සමාජ ජීවිතයේ ස්වයං - ප්‍රත්‍යක්ෂ පූර්ව කල්පනයන් ලෙස දිගටම සිතති.

(විශ්වාසයේ දොරටුව, 2) - එය එක්තරා ආකාරයක "දන්නා නිසා නොතකා හැරීමකි." අප තේරුම් නොගන්නා ලෙස හෝ ඇතැම් විටෙක උවමනාවෙන්ම නොසලකා හරින්නේ යැයි හෝ පෙනෙන්නට ඇති දෙය නම්, විශ්වාසය මත ගැඹුරින් මුල්බැසගත් දෙවියන් වහන්සේ සමඟ වන සම්බන්ධතාවයකට ශක්තිමත්ව පෙරළා පැමිණීමක් නොමැති විට සමාජය වෙත ඇති එම කැපවීමම දුර්වල වන්නේය සහ එහි අභ්‍යන්තරික තාර්කිකය ක්‍රමයෙන් හිස්වන්නේය යන සත්‍යතාවයය.

### විශ්වාසයේ වර්ෂය

විශ්වයීය සාන්ත සභා එකමුතුව අලුත් කිරීමේ සහ ප්‍රතිප්‍රබෝධකරණයේ උපක්‍රමයන් ලෙස විශ්වාසය පිළිබඳ ශක්තිමත් හැඟීමකට පෙරළා පැමිණීමේ කඩිනම් අවශ්‍යතාවය ගැන සංවේදීතාවයෙන් යුතුව ශුද්ධෝත්තම පියතුමන් විසින් සාන්ත සභාව තුළ, 2012 ඔක්තෝබර් 11 දා ආරම්භ වී, 2013 නොවැම්බර් 24 වන දිනෙන්, එනම් ක්‍රිස්තු රජාණන්ගේ මංගල්‍යයෙන්, නිමාවට පත්වන විශේෂිත වර්ෂයක් ස්ථාපිත කර තිබේ. උන්වහන්සේ එය හඳුන්වා ඇත්තේ විශ්වාසයේ වර්ෂය ලෙසයි. එහි ආරම්භය ලෙස 2012 ඔක්තෝබර් 11 දින තෝරාගෙන ඇත්තේ, එදින දෙවන වතිකාන කතිකාවතේ සමාරම්භයේ 50 වන සංවත්සරය සැමරීමත්, කතෝලික සභා ධර්මෝපදේශය ප්‍රකාශයට පත්කොට 20 වන සංවත්සරය සැමරීමත් සනිටුහන් කරන හෙයිනි. මේ සිද්ධීන් දෙකම අපගේ කාලයේ සාන්ත සභා අලුත්වීමෙහි වැදගත් සංධිස්ථානයන් වෙති.

වසර 50 පුරාවට වටිනාකම සහ දීප්තිය නැති නොවූ මෙම කතිකාවේ ලේඛණයන්හි ශ්‍රේෂ්ඨ අපේක්ෂාවන් මත නැවත වතාවක් විශ්වාසයේ අලුත්වීමක් සඳහා වන පෙළඹවීම පදනම් කිරීම පිණිස ශුද්ධෝත්තම පියතුමන් මෙම විශේෂ වර්ෂය දෙවන වතිකාන කතිකාවට සමීප සබඳතාවයක් තුළ රැඳවීමට අදහස් කොට තිබේ.

නමුත්, යම් අන්තරායයන් මඟ හරිමින් මෙම ලේඛණ නිවැරදිව අර්ථකථනය කිරීමට සහ නිදොස් ගැටපද විවරණ ඔස්සේ, එනම් සාන්ත සභාවේ ජීවමාන සම්ප්‍රදායන්ට අනුකූලව: සභාව සතු සම්ප්‍රදායික දහම් විවරණය ඔස්සේ, ක්‍රියාවට නැංවීමට ශුද්ධෝත්තම පියතුමෝ අදහස් කරති. එහෙයින් විශ්වාසයේ වර්ෂය, කතිකාවත සහ එහි දර්ශනය ක්‍රියාවට නැංවීම නැවත අගැයීමට ලක්කිරීම සඳහා අවස්ථාවක් බවට පත්වනු ඇත. මෙම අදහස පදනම් කොට ගත් යමක් ශුද්ධෝත්තම පියතුමන්ගේ හදවතට සමීපව තිබේ: එනම් දෙවන වතිකාන කතිකාවත සාන්ත සභාවේ නව ආරම්භයක් නොව සහස්‍ර දෙකක ඉතිහාසය තුළ සාන්ත සභාව සජීවකරණයට ලක් කළ එම විශ්වාසයේම, ප්‍රාණවත් බවේ නව ස්ප්‍රීතුවක් සහිත අඛණ්ඩ ඉදිරි ගමනක් බව පෙන්වීමය.

### සිත් හැරීමට කැඳවීමක්

විශ්වාසයේ වර්ෂය ස්වාමින් වහන්සේ වෙත අව්‍යාජ සිත් හැරීමකට කෙරෙන කැඳවීමක් බවට ද, විශ්වාසය වෙත සහ දෙවියන් වහන්සේ සමඟ ඒකත්වයකටද කෙරෙන කැඳවීමක් බවට ද පත්වේවා යි ද එතුමෝ ප්‍රාර්ථනා කරති. ශුද්ධෝත්තම පියතුමෝ මෙසේ ද පවසති: "විශ්වාසය වර්ධනය වන්නේ විශ්වාස කිරීමෙන් පමණකි; දෙවියන් වහන්සේ තුළ එහි ප්‍රභාවය ඇති නිසා අඛණ්ඩව වර්ධනය වන බව පෙනී යන ප්‍රේමයේ දෑතට, කෘතප්‍රාප්තියක් කරා යන අඛණ්ඩ ගමන තුළ සිදුවන ස්ව-ත්‍යාජය හැරෙන්නට, කෙනකුගේ ජීවිතය පිළිබඳ නිශ්චිත විශ්වාසයක් අත්කර ගැනීමට වෙනත් මඟක් නැත." (විශ්වාසයේ දොරටුව, 7). මේ අර්ථයෙන්, එක් එක් විශ්වාසිකයා සාන්ත සභාවේ දේව වන්දනාවේදී පමණක් නොව, පෞද්ගලිකව සහ ජීවිත සාක්ෂිය මඟින් ද තම විශ්වාසය නිර්භීතව ප්‍රකාශ කිරීම ශුද්ධෝත්තම පියතුමන්ට අවශ්‍යය. "යමෙක් මනුෂ්‍යයන් අබිමුවෙහි මා පිළිගත් බවට සාක්ෂි ' දරන්නේ ද, මනුෂ්‍ය පුත්‍රයාණෝත් දෙවියන් වහන්සේගේ දූතයන් අබිමුවෙහි ඔහු පිළිගත් බවට සාක්ෂි දරණ සේක.

එහෙත් මනුෂ්‍යයන් අබිමුවෙහි මා ප්‍රතික්ෂේප කරන තැනැත්තේ දෙවියන් වහන්සේගේ දූතයන් අබිමුවෙහි දී ප්‍රතික්ෂේප කරනු ලැබේ යයි මම ඔබට කියමි" (ලූක් 12 : 8 - 9). විශ්වාසයේ වර්ෂය තුළ දී දිව්‍ය පූජාවේ දී සහ අනෙක් අවස්ථාවන්හි දී විශ්වාස ලක්ෂණය පෞද්ගලිකව උච්චාරණය කළ යුතුය. ප්‍රකාශ කරනු ලබන දේ පිළිබඳ ගැඹුරු අවබෝධයකින් යුතුව සහ එයට සාක්ෂි දැරීමට අධිෂ්ඨානයකින් යුතුව එසේ කළ යුතුය. විශ්වාස ලක්ෂණය උච්චාරණය කිරීම, මෙම විශ්වාසයේ ප්‍රකාශිත සහතික කිරීමක් ද, එය තමන්ගේම බවට පත් කර ගැනීමක් ද, කෙනකුගේ ජීවිත දිශානතියක් ද වෙයි. ඒ හැර, මෙම වර්ෂය අතරතුර කතෝලික සභා ධර්මෝපදේශයේ අන්තර්ගතය කියැවීම, තේරුම් ගැනීම සහ මෙනෙහිකිරීම කෙරෙහි වැඩි අවධානයක් යොමු කිරීම ශුද්ධෝත්තම පියතුමන්ගේ අපේක්ෂාව වෙයි. හැකිතරම් කතෝලිකයින් පිරිසක් විසින් මෙම මූලික පෙළ පුළුල්ව අධ්‍යයනය කිරීම එතුමන්ට අවශ්‍යය. "විශ්වාසයෙන් තොර දයාව සැකයට අඛණ්ඩව නතුවන මනෝභාවයක් වන අතර, දයාවෙන් එකිනෙකට සම්බන්ධ වන්නේ කෙසේ දැයි අපට පෙන්වා දෙන අතරතුරම මේ වර්ෂය තුළ දී දයාව වෙත ස්වකීය කැපවීම තියුණු කර ගැනීමට ද එතුමෝ සාන්ත සභාව දිරිමත් කරති.

විශ්වාසය දන්නේ යැයි සිතා නොසලකා හැරිය නොහැකි බව ශුද්ධෝත්තම පියතුමන් අපට අවවාද කරන බව පෙනී යයි, විශ්වාසයට එරෙහිව සටන් වදින ලෞකිකවාද, සහ අන්‍යාගමික ප්‍රවණතාවයෙන් විශාල ලෙස බලපෑමට ලක්ව ඇති ලෝකයක ජීවත්වන අපි මෙම තිළිණය නිරන්තරයෙන්ම පෝෂණය කළ යුතු වෙමු. "ඔබ ලෝක ව්‍යවහාරය අනුව හැඩ නොගැසී සිත අලුත් කරගැනීමෙන් වෙනස් අය වන්න. එවිට දෙවියන් වහන්සේගේ කැමැත්ත, එනම්, යහපත් වූ, පිළිගත යුතු වූ, සම්පූර්ණ වූ දේ කුමක්ද කියා ඔබට තේරුම්ගත හැකිය" (රෝම 12:2).

### අගරදගුරු පදවි ජීවිතයේ විශ්වාසයීය පැතිකඩ

සොළොස්වන බෙනඩික්ට් ශුද්ධෝත්තම පියතුමා විසින් දී ඇති මඟ පෙන්වීම අනුගමනය කරමින්, අපිදු කොළඹ අගරදගුරු පදවිය තුළ 2012 ඔක්තෝබර් 11 සිට 2013 නොවැම්බර් 24 වන දා දක්වා වන වර්ෂය විශ්වාසයේ විශේෂ වර්ෂය ලෙස කැප කරමු. එය දිව්‍ය සත්ප්‍රසාදයීය දශකයේ, 2010 අගෝස්තු මස සිට 2011 අගෝස්තු මාසය දක්වා අප සැමරූ දිව්‍ය සත්ප්‍රසාදයීය වර්ෂය සහ 2011 නොවැම්බර් 27 දින සිට මේ දක්වා සැමරූ දේව වචනයේ වර්ෂයට පසුව එන දිව්‍ය සත්ප්‍රසාදයීය දශකයේ තෙවන වර්ෂය වනු ඇත. විශ්වාසයේ වර්ෂය තුළදී සාන්ත සභා ජීවිතයේ නිධානයන් වන දේව වචනය සහ දිව්‍ය සත්ප්‍රසාදය වඩා හොඳින් අගැයීමට, සැමරීමට සහ ජීවත්වීමට අප දැනටමත් දරා ඇති උත්සාහය තවදුරටත් ශක්තිමත් කිරීමට අපි බලාපොරොත්තු වෙමු. ශුද්ධෝත්තම පියතුමන් විසින් ප්‍රකාශයට පත් කොට තිබෙන විශ්වාසයේ වර්ෂයේ අවශ්‍යතාවන් සමඟ යමින් අගරදගුරු පදවි සංඝය සඳහා අපගේ තේමාව වන්නේ: "ඇදහිල්ලේ, ජීවත්වීමේ හා බෙදාගැනීමේ විශ්වාසයීය අත්දැකීමක් කරා . . . . . ." යන්නයි.

### එඬේරික අරමුණු

විශ්වාසයේ වර්ෂය ප්‍රකාශයට පත් කිරීමත් සමඟ අගරදගුරු පදවි සංඝයේ පූජක, පැවිදි සහ ගිහි සැදැහැවතුන් විශේෂ ගමනක් ආරම්භ කිරීම අවශ්‍යය. එය විශ්වාසයේ අලංකාරය අලුතින් සොයාගන්නා ගමනකි. මේ දැක්ම සහිතව විශ්වාසයේ අභිරහස් පිළිබඳ දැනුවත් බව සහ එහි වන දේව අභිරහස් තමන් සතුකරගැනීම තුළින් වැඩි වැඩියෙන් තම ජීවිතය තුළ අලුත් කර ගැනීමට විශේෂ කැපවීමකින් යුතුව කටයුතු කරන ලෙස සියලු දෙනාටම ඇරයුම් කෙරේ. මීසම් සේවක පූජාප්‍රසාදිතුමන් සහ ආයතන නායකයින් ස්වකීය රැළෙහි (ලූක් 22:32) විශ්වාසය ශක්තිමත් කිරීමට, විශ්වාසයෙන් පැන නඟින ප්‍රීතිය අත්දැකීමට ඔවුන්ට ඉගැන්වීමට, අනුශාසනා කිරීමට සහ මඟ පෙන්වීමට හැකි සියලු දේ මේ වර්ෂය තුළ කිරීම තමන්ට ලැබී ඇති කැඳවීමක් ලෙස සැලකිය යුතුය. දැඩි ලෞකිකවාදය සහ ඇතැම් ක්‍රිස්තියානි මූලධර්මවාදී කණ්ඩායම් වල ප්‍රබල ක්‍රියාකාරකම් සමඟින්, අපගේ ඇතැම් සැදැහැවතුන්ගේ විශ්වාසය තුළ ඇති වන අවබෝධය සහ ප්‍රීතිය පිළිබඳ හැඟීම ඇත්තවශයෙන්ම තර්ජනයට ලක්ව ඇති අතර, සභාව අත්හැර යාම් ද වාර්තා වී ඇත.

එමනිසා කතෝලික සැදැහැවතුන් අතර විශ්වාසයේ සැබෑ අලුත්වීමක් ඇති කිරීම පිණිස තමන් සතු සම්පත්, දැනුම, විශේෂඥතාවය සහ තම හැකියාව එකට ගොණු කරන්නැයි අපගේ කලාපීය රදගුරු හිමිවරුන්ගෙන්, සියලු අනුනායක පියවරුන්ගෙන්, දිසා නායක පියවරුන්ගෙන්, මීසම් සේවක පියවරුන්ගෙන් සහ අපෝස්තලික සේවා සම්බන්ධීකාරක පියවරුන්ගෙන් මම ඉල්ලා සිටිමි. ඔබගේ රැළ වනාහී දෙවියන් වහන්සේගේ ස්වකීය මහ කරුණාවෙන් ඔබගේ රැකවරණයට බාර දුන් බැටළුවන් හෙයින්, මෙය ඉටුකිරීමේ දී නිර්මාණශීලී වන්න. සියලු දෙනා වෙත ලඟාවන නව ධර්මෝපදේශය ද, සමඟි සන්ධානයේ ප්‍රසාද නිධානය වෙත ශක්තිමත් නැවත පැමිණීමක් අන්තර්ගත ඉතා භක්තියෙන් ප්‍රසාද නිධාන සැමරීම කෙරෙහි වන අලුත් උද්‍යෝගය ද, ඊටත් වඩා ප්‍රබල සහ භක්තිමත් ලෙස දිව්‍ය පූජාවට සහභාගි වීමෙහි ද, විශේෂයෙන්ම Lectio Divina ශුද්ධ ලියැවිල්ල පැතිරවීම සහ භාවිතය ද, මීසම් මට්ටමින් යාම යැදුම පැවැත්වීම හා මීසම් තුළ බයිබලීය සජීවකයන් බලාත්මක කිරීම ද, අසිපා සහ කුඩා කිතුනු සංඝ වැඩසටහන් පුනරුදය ද, විශ්වාසය තුළ පොළඹවනු ලැබූ සහ ශක්තිමත්ව පදනම් වූ දයාවේ ක්‍රියාවන් ඉටුකිරීමට ඇති කැපවීම ද, අන්‍යයන් සමඟ විශ්වාසය බෙදා හදා ගැනීමට ඇති අලුත් උද්‍යෝගයක් ද වටා මෙය මූලිකව කේන්ද්‍රගත විය යුතුය.

යාච්ඤාව, ප්‍රබල යාච්ඤාව, මේ වර්ෂය තුළ අප සිදු කරන අනෙකුත් සියලු ව්‍යායාමයන් වට කොට ගත යුතුය. මෙම උත්සාහය මෙහෙයවනු ලබන අධ්‍යාත්මික බලය යාච්ඤාව වේවා ! අගරදගුරු පදවි සභාව මේ විශේෂ වර්ෂය සැබෑ අලුත්වීමක් සහ "වරප්‍රසාදයීය කාලයක්" අත්දකින පිණිස, තම නිවසේදී ද, තමන් විසින් සහ තම සමිති සමාගම් මඟින් ද, දේවස්ථාන තුළ ද යාච්ඤා කිරීමට අපගේ ජනතාව දිරිමත් කරමු.

සෑම මීසම් සේවක පියතුමකුම පළමුව තමන් විශ්වාසයේ අභිරහස් අත්දකිමින් සහ අනතුරුව තම රැළට විශ්වාසයේ අභිරහස් පිළිබඳ වැඩි අවබෝධයක් කරා යාමට මඟ පෙන්වමින්, වචනයෙන් සහ ආදර්ශයෙන්ද ස්වකීය ජනතාවගේ ප්‍රධාන ධර්මෝපදේශකයා වෙත්වා. ඔහු දුර්වලයින් පිළිබඳ විශේෂ සැලකිල්ලක් දක්වත්වා. විශ්වාස ලක්ෂණය පිළිබඳ විවිධ ඉගැන්වීම් ඔවුන්ට පැහැදිලි කරනාකාරයෙන් සහ ඔවුන් වෙනුවෙන් වන දෙවියන් වහන්සේගේ ප්‍රේමණීය සැලැස්මෙහි අලංකාරය පිළිබඳව ඔවුන් දැනුවත් වන ආකාරයෙන් ඉරුදින දේශනා සඳහා සූදානම් වීමට අමතර උත්සහයන් දරත්වා.

### විශ්වාසයේ වර්ෂය තුළ සිදු කෙරෙන වැඩසටහන්

සොළොස්වන බෙනඩික්ට් ශුද්ධෝත්තම පියතුමන් විසින් "විශ්වාසයේ දොරටුව" (Porta Fidei) නමැති ස්වකීය අපෝස්තලික සංදේශයෙහි දක්වා තිබෙන මඟ පෙන්වීම් පිළිබඳව මෙනෙහි කිරීමෙන් අනතුරුව ද, උන්වහන්සේගේ ඉල්ලීම අනුව යමින් ද, අනෙක් අය මෙන්ම, පදවි ක්‍යූරියාවේ සාමාජිකයින් වැනි විවිධ කණ්ඩායම් ද විමසා බැලීමෙන් පසුව ද දැනටමත් මා සඳහන් කර ඇති පරිදි 2012 ඔක්තෝබර් 11 දා ආරම්භ වී 2013 නොවැම්බර් 24 දින (එනම්, ක්‍රිස්තු රජාණන්ගේ මංගල දින) නිමාවට පත්වන වර්ෂය, කොළඹ අගරදගුරු පදවිය තුළ විශ්වාසයේ වර්ෂය ලෙස සැලකිය යුතු බවට නියම කරමි.

අගරදගුරු පදවිය තුළ විශ්වාසයේ වර්ෂයේ සමාරම්භය ඔක්තෝබර් 7 වන ඉරුදින ප.ව. 6.00 ට, කොටහේන සාන්ත ලුසියා ආසන දෙව්මැදුරේ පැවැත්වෙන විශේෂ දේව වන්දනා මෙහෙයක දී සිදු කෙරේ. වර්ෂය ගාම්භීර ලෙස ප්‍රකාශයට පත් කිරීම මෙම උත්සවයේ දී සිදු කෙරෙනු ඇත. කොළඹ නගරයේ දිසා තුනෙහි සහ කෝට්ටේ දිසාවේ සියලුම පූජාප්‍රසාදිතුමන්, පැවිදි සංඝයන් සහ මීසම්වල ගිහි නියෝජිතයින් මෙම උත්සවයට සහභාගි වනු ඇතැයි අපේක්ෂා කෙරේ. කොළඹ නගරයේ සහ කෝට්ටේ දිසාවෙහි මීසම්වල එදිනම උදෑසන හෝ එම සතිය තුළ වෙනත් පහසු දිනක දී හෝ පැවැත්වෙන දිව්‍ය පූජාවක දී විශ්වාසයේ වර්ෂය ප්‍රකාශයට පත් කළ හැකිය. අනෙකුත් සියලුම මීසම්, ආසන දෙව්මැදුරේ පැවැත්වෙන උත්සවයට සමගාමීව එනම් ඔක්තෝබර් 7 ඉරුදින තම ප්‍රධාන දේවස්ථානයේ දී විශ්වාසයේ වර්ෂය ගාම්භීර ලෙස ආරම්භ කිරීම සඳහා වන විශේෂ දේව වන්දනා මෙහෙයක් පවත්වනු ඇත. එහි දී මීසම් සේවක පියතුමන් විසින් වර්ෂය ආරම්භ කිරීමේ ගාම්භීර ප්‍රකාශය ප්‍රසිද්ධ කරනු ලබනු ඇත. සමාරම්භක උත්සවය සඳහා වන දේව වන්දනාත්මක මෙහෙයේ පිටපත සහ නිල ප්‍රකාශනය, අපගේ දේව වන්දනා කාර්යාලය මඟින් යථා කාලයේ දී ඔවුන් වෙත ලැබෙනු ඇත.

අගරදගුරු පදවි අධ්‍යාපන කාර්යාලය ද මෙම අවස්ථාව සඳහා පාසල් සූදානම් කරනු ඇත. දැනුවත් කිරීමේ මෙහෙයුමක් දියත් කිරීම සහ පාසල් තුළ විශ්වාසයේ වර්ෂය ප්‍රකාශයට පත් කිරීමේ උත්සවයන් ඔවුන්ට පහසු දිනක දී සංවිධානය කෙරෙනු ඇත.

☛ 13 පිටුවට

# කොළඹ අගරදගුරු පදවියේ අගරදගුරු අති උතුම් මැල්කම් කාදිනල් රංජිත් හිමිපාණන් විසින්විශ්වාසයේ වසර නිමිත්තෙන් ඉදිරිපත් කරනු ලබන චක්‍ර ලේඛනය

12 පිටුවෙන්

## වර්ෂයේ නිර්දිෂ්ට වැඩසටහන්

### 1. ධර්මෝපදේශය

අගරදගුරු පදවි ධර්මෝපදේශ අපෝස්තලික සේවාව,

අ) සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි භාෂාවන්ගෙන් දැනටමත් පවත්වාගෙන යනු ලබන පාසල් දරු දැරියන් සඳහා වන ධර්මෝපදේශ වැඩසටහන් තවදුරටත් ශක්තිමත් කිරීමට කටයුතු යොදනු ඇත.

ආ) මීසම් තුළ දෙමාපියන් සහ වැඩිහිටියන් සඳහා වන වැඩිහිටි ධර්මෝපදේශ වැඩසටහනක් ස්ථාපිත කරනු ඇත. මේ සඳහා ගුරු උපදේශකවරුන් සූදානම් කරනු ලබන අතර යෝග්‍ය පෙළ පොත් සොයා ගැනීම හෝ දේව ධර්ම නිකේතනයේ සහ දෙමළ සහ ඉංග්‍රීසි දේව ධර්ම පීඨයන්ගේ උපකාරය ඇතිව පෙළ පොත් සැකසීම හෝ සිදු කරනු ඇත.

ඇ) අති උතුම් ඔස්වල්ඩ් ගෝමිස් විශ්‍රාමික අගරදගුරු හිමි පාණන් විසින් පළ කොට ඇති පවුලේ ධර්මෝපදේශය හෙවත් මහෝපදේශය සහ "Life in Christ" පොත් පෙළ ඉංග්‍රීසි බසින් හෝ දේශීය භාෂාවන්ගෙන් හෝ පළ වී ඇති කතෝලික සභාවේ ධර්මෝපදේශය වැනි වැදගත් පොත් ද, Youcat හි ඉංග්‍රීසි සංස්කරණය සහ හැකි පමණ එවැනි ධර්මෝපදේශ ප්‍රකාශන ද ලබා ගැනීමට පහසුකම් සැපයීම සහ ව්‍යාප්ත කිරීම සිදු කරනු ඇත. ඒවා භාවිත කිරීම දිරිගැන්වීමක් ලෙස තරග සහ දැනුම මිණුම වැඩසටහන් ද සංවිධානය කරනු ඇත.

ඈ) අගරදගුරු පදවි අධ්‍යාපන අපෝස්තලික සේවාවේ උපකාරය ඇතිව පාසල්වල, විශේෂයෙන්ම කතෝලික සිසුන් සුළුතර සංඛ්‍යාවක් ඉගෙනුම ලබන රජයේ පාසල්වල සහ ජාත්‍යන්තර පාසල්වල, කතෝලික සිසු සිසුවියන්ට ආගමික අධ්‍යාපනය ප්‍රමාණවත්ව සැපයීම සහතික කිරීමට අවශ්‍ය පියවර ගනු ඇත. අවාසනාවකට මෙන් මෙම පාසල් තුළ කතෝලික ධර්මය ඉගැන්වීමට අවශ්‍ය පහසුකම් නොලබන දරු දැරියන්ට ධර්මෝපදේශය සහ ආගමික උපදේශනය සැපයීමේ විකල්ප ක්‍රම, කලාපීය සම්බන්ධී කාරක පියවරුන්ගේ සහය ඇතිව සම්පාදනය කිරීමට උත්සහ දැරිය යුතුය. මෙම වර්ෂයේ පාසල් තුළ ආගමික අධ්‍යාපනය නොලබන දරු දැරියන් පිළිබඳ සමීක්ෂණයක් සිදු කිරීමට සහ ඒ මත පිහිටා පිළියම් යෙදීමට ද පියවර ගත යුතුය.

ඉ) දහම් ගුරුවරු ගුරුවරියන් සඳහා වන මාසික පෝය පුහුණු සම්මන්ත්‍රණ තීව්‍ර කරනු ලබන අතර, කතෝලික අභිධර්මයේ ධන සම්භාරය පිළිබඳ වඩා වැඩි දැනුමකට ඔවුන් ද විවෘත කිරීම සහතික කරනු ඇත.

ඊ) අගරදගුරු පදවි සන්නිවේදන කොමිසමේ සහය ඇතිව, අපගේ විශ්වාසයේ වැදගත් අංශ පිළිබඳ සංයුක්ත තැටි සහ විද්‍යුත් වීඩියෝ තැටි (CDs, DVDs) සහ එවැනි අනෙකුත් දෑ වැනි ප්‍රයෝජනවත් උපකාරක මෙවලම් සූදානම් කරනු ඇති අතර ඒවා ව්‍යාප්ත කිරීමට ද මීසම්, පාසල් එවැනි වෙනත් ආයතන තුළ භාවිතයට ගැනීමට ද පහසුකම් සපයනු ඇත

### 2. දේව ධර්ම නිකේතනය

දේව ධර්ම නිකේතනය සහ දෙමළ සහ ඉංග්‍රීසි දේව ධර්ම පීඨ, දේවධර්ම දැනුම පිළිබඳ ගැඹුරු හැඟීමක් ව්‍යාප්ත කරන අගරදගුරු පදවියේ ප්‍රධාන ආයතනය ලෙස,

අ) අගරදගුරු පදවි ධර්මෝපදේශ අපෝස්තලික සේවාවේ සහය ලබා ගනිමින්, පූජා ප්‍රසාදිතුමන්, පැවිදිවරුන් සහ ගිහි සැදැහැවතුන් වෙනුවෙන් ධර්මෝපදේශය සඳහා පොදු තොරතුරු සංග්‍රහය (1979) Catechesi Tradendae (1979) සහ කතෝලික සභාවේ ධර්මෝපදේශය වැනි ධර්මෝපදේශ පිළිබඳ සාන්ත සභා ලේඛණ වඩා හොඳින් ඉදිරිපත් කිරීම සඳහා අධ්‍යයන දින සංවිධානය කරනු ඇත.

ආ) එවැනි දැනුවත් කිරීමේ වැඩසටහන් දහම් ගුරුවරු ගුරුවරියන් සහ ගිහි නායකයින් සඳහා කලාපීය මට්ටමින් සංවිධානය කරනු ඇත. මේ කටයුත්ත සඳහා අගරදගුරු පදවි ධර්මෝපදේශ අපෝස්තලික සේවාවේ සහ ගිහි සංවිධානයන්හි ද, තරුණ සහ ළමා සංවිධානවල ද සහය ලබා ගත හැකිය.

ඇ) අගරදගුරු පදවි බයිබලීය අපෝස්තලික සේවා සමඟ එක්ව, වැඩසටහන් සංවිධානය කරනු ඇත. මීසම් මට්ටමින් ඔවුන් බාරගත යුතු නිශ්චිත කාර්යභාරයන් මොනවාදැයි පෙන්වා දීම සහ එම කාර්යභාරයන් ඇගැයුමට ලක්කොට පදවි මට්ටමින් නිසි පිළිගැනීමක් සහිතව ඔවුනට ප්‍රදානයන් සිදු කරනු ඇත.

ඈ) විශ්වාස ලක්ෂණයේ සත්‍යතා සරල භාෂාවෙන් විස්තර කෙරෙන අත් පත්‍රිකා සූදානම් කර මීසම් මට්ටමින් ඒවා බෙදා හරිනු ඇත.

ඉ) ක්‍රිස්තියානි මූලධර්මවාදීන්ට සහ කතෝලික විශ්වාසයේ මූලික සත්‍යතාවන්ට එරෙහිව සිදුකරන ඔවුන්ගේ වැරදි ලෙස පිළිසිඳගත් සහ අපහාසාත්මක ප්‍රහාරයන්ට පිළිතුරු සපයන විවිධ භාෂාවන්ගෙන් දැනටත් පළවී ඇති, කුමන හෝ පොත් පිංච හෝ අත් පත්‍රිකා එකතුකොට හෝ අලුත් දේ සූදානම් කොට හෝ පදවිය තුළ ව්‍යාප්ත කිරීමට කටයුතු යොදනු ඇත.

ඊ) විශ්වවිද්‍යාල උපාධ්‍ය පියතුමන්ගේ උපකාරය ඇතිව කතෝලික විශ්ව විද්‍යාල සිසුන් සහ කථිකාචාර්යවරුන් සහ බුද්ධිමතුන් සඳහා විශ්වාසය ඉදිරිපත් කිරීමේ වැඩසටහන්, විශ්වාසය සහ තාර්කනය පිළිබඳ ශාස්ත්‍රීය සංවාද සංවිධානය කරනු ඇත.

### 3. අගරදගුරු පදවි බයිබලීය අපෝස්තලික සේවාව

හැකිතරම් ජන සංඛ්‍යාවකට, විවිධ භාෂාවන්ගෙන් ශුද්ධ බයිබලයේ පිටපත් ලබාගැනීමේ පහසුකම් සැපයීම සහ ශුද්ධ බයිබලය කියැවීමට සහ යාච්ඤායෝගීව මෙනෙහි කිරීමට (Lectio Divina) ඔවුන් දිරිමත් කරනු ඇති අතර දේව ධර්ම නිකේතනය සමඟ එකට එක්ව මීසම්හි බයිබලීය සජීවකයින් සඳහා පුහුණු වැඩසටහන් සංවිධානය කිරීමට ද තම මීසම් තුළ බයිබල් අධ්‍යයන කණ්ඩායම් සංවිධානය කිරීමට සහ එවැනි වෙනත් ක්‍රියාකාරකම් සංවිධානය කිරීමට ඔවුන්ව දිරි ගන්වනු ඇති අතර දිනපතා පුරුද්දක් ලෙස පවුල තුළ ශු. බයිබලය කියැවීම ද දිරිමත් කරනු ඇත.

මෙම අපෝස්තලික සේවාව, ශුද්ධවූ බයිබලය පිළිබඳව මෑතක දී ලියැවුන විවිධ ප්‍රකාශන ලබාගැනීමේ පහසුකම් කිතුනු බැතිමතුන් වෙත සැපයිය යුතුය. එමඟින්, ඔවුන් දේව වචනයේ අලංකාරය පිළිබඳ වැඩි අවබෝධයක් ලබා ගැනීමටත්, තම විශ්වාසය වඩා හොඳින් තේරුම් ගැනීමටත්, එහි ඉල්ලීම්වලට අනුව ජීවත් වීමටත් විශ්වාසකයින්ට සහය වනු ඇත.

### 4. අගරදගුරු පදවි පවුල් අපෝස්තලික සේවාව

නාසරතයේ ශුද්ධවූ පවුල , විශ්වාස වර්ධනයෙහි ලා පවුලේ ඇති වැදගත්කමට සාක්ෂි දරන්නේය (ලූක් 2:52). වත්මන් පවුලේ අධිස්වාභාවික කැඳවීමෙන්, එනම් ස්වකීය දූ දරුවන්ගේ විශ්වාස වර්ධනයේ තෝතැන්න බවට පත්වීම, මුක්ත කොට හුදු සමාජයීය ඒකකයන් බවට පත් කිරීමට විවිධ ප්‍රවණතා සහ මතවාදයන් උත්සහ දරයි. එහෙයින්, තම දූ දරුවන්ට විශ්වාසය පිළිබඳ පළමු ගුරුවරුන් ලෙස තමන් සතු වගකීම් අතිශය උදාර වගකීමක්ය යන හැඟීම දෙමාපියන් තුළ ධාරණය කිරීම පිණිස, විශේෂ වැඩසටහන් සංවිධානය කළ යුතුය. එමනිසා, ධර්මෝපදේශ කාර්යාලය සමඟ එක්ව, මහෝපදේශයේ ද, "Catholic Family Chatechism" කතෝලික සභා ධර්මෝපදේශයේ සහ එහි ඉංග්‍රීසි, සිංහල, දෙමළ අනුවාදන පිටපත් පවුල් අතර ව්‍යාප්ත කිරීමට කටයුතු කරන ලෙස ද, එම පොත් සියල්ලක්ම පවුලක් ලෙස නිවසේ දී කියැවීම දිරිගන්වන ලෙස ද අගරදගුරු පදවි පවුල් අපෝස්තලික සේවාවෙන් ඉල්ලා සිටිමි. එවැනි පොත් පත් කියැවීම දිරිගැන්වීම අරමුණු කොටගත් වැඩසටහන් දිසා මට්ටමින් හෝ කලාපීය මට්ටමින් හෝ සංවිධානය කළ හැකිය.

පවුල් ජීවිතය තුළ එකමුතුකමේ අවශ්‍යතාව ද, එහි ගැඹුරු ආධ්‍යාත්මික ස්වභාවය ද, පවුල් තුළ සහ අසල්වැසියන් වෙත විශ්වාසයේ ගුරුවරයා බවට පත්වීම සඳහා පවුල සතු කාර්යභාරය ද අවධාරණය කෙරෙන විවාහයට පෙර සහ පසු වැඩසටහන් තවදුරටත් ශක්තිමත් කිරීම වැදගත් වෙයි. මෑතක දී විවාහ වූ, විශේෂයෙන්ම තම පළමු මීසම හැර දමා, වෙනත් පෙදෙසකට සංක්‍රමණය වී ඇති යුවළ සඳහා පශ්චාත් වැඩසටහන් (Follow Up Programmes) පැවැත්වීම මෙහි ලා අත්‍යවශ්‍ය ලෙස සැලකිය යුතුය. ගැඹුරු විශ්වාසයකින් යුත්, අන්‍යයන් වෙනුවෙන් යාච්ඤා කරන සහ ත්‍යාගශීලීව සේවය කරන, නාසරතයේ ශුද්ධ වූ පවුල මෙන් එකට සිටින, පවුලක් බවට පත්වීමේ පරමාදර්ශවාදය තරුණ පවුල් තුළ ජනනය කිරීම අනාගතය සඳහා වැදගත් වෙයි. මෙය "ගෘහස්ත සභාව" ලෙස පවුලේ ප්‍රතිරූපය වර්ධනය කිරීමෙහි ලා අත්‍යවශ්‍යම දෙයක් බවට පත්වෙයි. ඒ හා සමගම, පවුලේ උත්තරීතර වටිනාකම පිළිබඳව අපගේ සැදැහැවතුන් ද, පොදු ජනතාව ද සවිඥානවත් කිරීමේ ද ගබ්සාකිරීමේ සහ ස්වකීය අසීමිත කරුණාවෙන්ම පමණක් දෙවියන් වහන්සේ අපට ලබා දෙන ජීවිතය නමැති නිධානය ප්‍රතික්ෂේප කරන්නාවූ අනෙක් සියලු ආකාරයන්ගේ පාපිෂ්ඨ බවට එරෙහිව වඩා ප්‍රබල ව්‍යාපාරයක් සංවිධානය කිරීමේද තම ව්‍යායාමයන් තීව්‍ර කරන ලෙස මම පවුල් අපෝස්තලික සේවාවෙන් ඉල්ලා සිටිමි.

### 5. අගරදගුරු පදවි කරිටාස් සංවිධානය සහ ශා. විසෙන්ති ද පාවුලා සංගමය

සාධාරණත්වය පිළිබඳ කාරණාවන් හට අපගේ කැපවීම ද, සාමයේ අපේක්ෂාවන් මෙන්ම අන්‍යයන්ගේ සුබ සාධනය වෙනුවෙන් කැපවීම ද, දුක්විඳින්නන් වෙත කරුණාව දැක්වීම ද ජේසුස් වහන්සේ තුළ අපගේ ඇති ගැඹුරු ප්‍රේමයෙහි අත්‍යවශ්‍යයෙන්ම අන්තර්ගත වෙයි. වඩ වඩා ආත්මාර්ථය සහ තණ්හාව වෙත ජනතාව යොමු කිරීමට උත්සහ කරන සමාජ සන්දර්භයක් තුළ , කොන්වූවන් බවට පත්වන හෝ දුප්පත් තත්ත්වයන් තුළ ජීවත් වන සංඛ්‍යාව වැඩිවෙමින් පවතියි. සමාජ ආතතියේ ද, මානව අභිමානයට ඇති ගෞරවය හීනවීම මෙන්ම සමාජයීය වගවීමේ සහ විනිවිදබවේ අඩුව පිළිබඳ ලකුණු ද පෙනෙන්නට තිබේ. විශ්වාසයේ මූලධර්ම සහ සාන්ත සභාවේ සමාජ දර්ශනය මත පදනම්ව, ඉහත කී කාරණා පිළිබඳව අපගේ සංඝයන් දැනුවත් කිරීමේ වැඩසටහන් සංවිධානය කරන මෙන් ද දුප්පතුන්ට සහය වන ස්වකීය වැඩසටහන් තීව්‍ර කරන මෙන් ද මම සාධාරණත්වය, සාමය, මානව සංවර්ධනය සහ මැවීමේ පූර්ණත්වය පිළිබඳ අගරදගුරු පදවි කොමිසමෙන් ඉල්ලා සිටිමි.

දිළින්දන්ට උදව් කිරීමේ සිය වැඩසටහන් ප්‍රබල කරන ලෙස විසෙන්ති ද පාවුලා සංගමයේ හෝ වෙනත් එවැනි සංගම්වල මීසම් පදනම් කොට ගත් ඒකකවලින් ද, දිළින්දන්ට සහනය සැපයීමේ අගරදගුරු පදවි අරමුදලේ ව්‍යායාමයන්ට වඩ වඩා සහභාගි වන්නැයි මීසම් වලින් ද මම ඉල්ලා සිටිමි. අවශ්‍යතා ඇති අය සමඟ සහෝදරත්වයේ සැබෑ හැඟීමක් අප ජනතාව අතර ගොඩනැගීමෙහි ලා චතාරික අධ්‍යාපන වැඩසටහන වඩාත්ම ප්‍රයෝජනවත් මෙවලමක් වෙයි.

### 6. අගරදගුරු පදවි දේවවන්දනා අපෝස්තලික සේවාව

අ) දේව ධර්ම නිකේතනයේ සහයෝගය ඇතිව, ජනවන්දනා කාලයන්ගේ විවිධ යොමුවීම් සහ අදාළ ශුද්ධ ලියැවිලි පාඨ ප්‍රයෝජනයට ගනිමින් වර්ෂයේ සති සඳහා දේශන සටහන් සූදානම් කෙරෙනු ඇත. මෙහි ලා විශ්වාස ලක්ෂණයේ මූලික ඇදහිලි ඉදිරිපත් කිරීම වෙත ද, කතෝලික සභා ධර්මෝපදේශය, ශුද්ධ ලියැවිලි සහ දෙවන වතිකාන කතිකා ප්‍රකාශන මඟින් පූජාප්‍රසාදි තුමන්ට අවශ්‍ය මඟ පෙන්වීම් ලබා දෙමින් සැදැහැවතුන්ට දස පනත සහ දේව ප්‍රසාද නිධාන පිළිබඳ අවබෝධයක් ලබාදීම වෙත ද අවධානය යොමු කිරීම සඳහා ද සියලු උත්සහයන් ගත යුතුය.

ආ) වර්ෂය තුළ භාවිත කිරීම පිණිස විශේෂ ලාංඡනයක් ද, දේවස්ථානයන්හි සහ අනෙකුත් ගොඩනැගිලිවල සවි කිරීම සඳහා බැනර් ද සූදානම් කරනු ලබනු ඇත.

ඇ) වර්ෂය පුරා දේව වන්දනාත්මක මෙහෙයයන්හි දී ගායනා කිරීම පිණිස විශ්වාසයේ උත්තරීතර වටිනාකම සහ එහි ගැළවීමදායක බලය ගෙනහැරපාන ගීතිකාවක් ද සූදානම් කරනු ලැබේ.

ඈ) යෝග්‍ය අධ්‍යාත්මික සූදානමක් සහ පූජනීයත්වයකින් යුක්තව ප්‍රසාද නිධාන, විශේෂයෙන්ම දිව්‍ය පූජාව, පැවැත්වීමේ අවශ්‍යතාවය පිළිබඳව, විශේෂයෙන්ම පූජාප්‍රසාදිතුමන් අතර වඩා වැඩි අවබෝධයක් මේ වර්ෂය තුළ ජනනය කිරීම සහතික කරනු ඇත. පූජාසන සැරසිලි, දිව්‍ය සත්ප්‍රසාද කුටිය, භාජන, ශුද්ධ මණ්ඩපය, දේවවන්දනාවේ දී භාවිත වන ඇඳුම් සහ ඒවායේ භාවිතය ද, පූජාසනයේ අලංකාරය පිළිබඳව ද අගරදගුරු පදවි නිර්ණායකයන් පරෙස්සමින් අනුග මනය කළ යුතුය. එසේම දණගසා, දිවෙන් දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ ලබා ගත යුතුය. දිව්‍ය පූජාව සඳහා යෝග්‍ය අධ්‍යාත්මික සූදානමක් ලෙස, පූජා ඇඳුමේ එක් එක් කොටස් පළඳින අවස්ථාවේදී උච්චාරණය කිරීම සඳහා පූජාප්‍රසාදිතුමන් වෙනුවෙන් පැළඳීමේ යාච්ඤා, අගරදගුරු පදවි ජනවන්දනා කාර්යාලය විසින්, හඳුන්වා දෙනු ඇත. දිව්‍ය පූජාව පවත්වන පූජා ප්‍රසාදි තුමන් හෝ ඊට සෘජුව එක්වන පූජාප්‍රසාදි තුමන් පළඳින ඇල්බ, බඳපටි (girdles) කරපටි (Stoles) සහ පූජා ඇඳුම් කට්ටල වලින් සෑම මීසම-ක්ම මේ වසර තුළ සන්නද්ධ විය යුතුය.

ඉ) චතාරික කාලය තුළ දී, කෙනෙකුගේ විශ්වාසය ගැඹුරු කිරීමේ මාර්ගයක් ලෙස සමඟි සන්ධානය ප්‍රසාද නිධානය ලැබීම වඩා අර්ථවත් කිරීම අරමුණු කොට ගෙන එහි දී භාවිත කිරීම සඳහා අදාළ යාච්ඤා සහ ඒ පිළිබඳ කරුණු කාරණා කෙටියෙන් අඩංගු කර ඇති අත් පත්‍රිකාවක්/ පොත් පිංචක් මීසම් අතර හඳුන්වා දෙනු ඇත.

ඊ) කතෝලික සංඝය තුළ විශ්වාසය වර්ධනය සඳහා, ශුද්ධවූ පැය සහ ජපමාලය අඩංගු නිරන්තර යැදුම් ව්‍යාපාරයන්, මීසම් වල තිබෙන පැවිදි සහ තාපසික සංඝ ජාලය මඟින් සංවිධානය කරන ලෙසද ඉල්ලා සිටිමි.

උ) ඉරුදින වල හා නියම කරනු ලබන අනෙකුත් දිනවල දිව්‍ය පූජාව අවස්ථාවේ දී කොටස් වශයෙන් නොව, සමස්ත විශ්වාස ලක්ෂණයම ජනතාව සමඟ උච්චාරණය කිරීම සහතික කිරීමට සියලු පූජාප්‍රසාදිවරුන්ට උපදෙස් දෙමි.

අගරදගුරු පදවි කිතුනු සභා සමඟිය සහ සමයාන්තර සංවාද පිළිබඳ අගරදගුරු පදවි කොමිසමට අනෙකුත් ආගමික විශ්වාසයන්ට අයත් සාමාජික සාමාජිකාවන් සමඟ හොඳහිත සහ සහයෝගය වඩා ශක්තිමත් කිරීම අරමුණු කොට ගෙන ඔවුන් හා සමඟ තම විශ්වාසය බෙදා හදා ගැනීමේ විවිධ ක්‍රියාකාරකම් සංවිධානය කළ හැකිය.

## ඉල්ලීම

ඉහත කී බොහෝ දේ, අවසානයේ දී ක්‍රියාත්මක වනු ඇත්තේ මීසම් තුළය. එහෙයින් මේ අවස්ථාවේ දී පූජක දූත සේවාව තුළ මාගේ ආදරණීය සම - ක්‍රියාකාරීන් ඇමතීමට කැමැත්තෙමි. ආදරණීය පියවරුනි, යහපත් එඬේරාණන් වූ ක්‍රිස්තුන් වහන්සේගේ ප්‍රතිරූපය තුළ අප ජනතාවගේ එඬේරුන් වීමේ උදාර දූත සේවාව සඳහා දෙවියන් වහන්සේ උන්වහන්සේගේ කරුණාවෙන් තෝරා ගත් අප, උන්වහන්සේගේ දූත සේවාව වෙනුවෙන් විශේෂයෙන්ම, පේදුරුතුමන්ගේ අනුප්‍රාප්තිකයාණන් අප කැඳවා ඇති මෙම වරප්‍රසාදයීය කාල පරිච්ඡේදයේ දී, මෙම ගැඹුරු අලුත්වීමේ කාල පරිච්ඡේදයේ දී, ඔබගේ උපරිම සහය ඔබ මෙම වැඩ පිළිවෙලට ලබා දෙනු ඇතැයි බලාපොරොත්තු වෙමි.

එහෙයින්, මෑතක දී ඔබ පවුල් බැහැදැක නැතිනම්, මීසමේ සියලු පවුල් බැහැදැකීමට ප්‍රමුඛත්වය ලබා දෙන ලෙස මම ඉතා ඕනෑ කමින් ඉල්ලා සිටිමි. ඔබ දන්නා පරිදි යහපත් බැටළු එඬේරාගේ ලකුණ වන්නේ තමාගේ රැළ දැන ගැනීමත්, අනෙක් අතට ඔවුන් එඬේරාව දැනගෙන සිටීමත්ය. ශු. පාවුලු තුමන්ගේ වදන් සිහි කරන්න: "සුබ අස්න ගෙන එන ධර්මදූතයන්ගේ පාද කෙතරම් මනහරද?"(රෝම 10:15).ඔබගේමීසම තුළඔබ දැකගන්නට ලැබීම,එය බැහැදැකීම සහ එහි ඇවිදයාම යහපත් එඬේරා වීමේ පළමු පියවරය. ඔබේ රැළට ආදරය කරන ලෙස ද, ඔවුන් වෙනුවෙන් යාච්ඤා කරන ලෙස ද, දෙවියන් වහන්සේට ඔවුන් වඩා සමීප කිරීමට උදක් ආශාවන ලෙස ද, මැසිවිලි නඟමින් නොව ප්‍රීතියෙන් ඔබගේ උපරිමය දෙන ලෙස ද, දේව වන්දනා මෙහෙයන් මෙන්ම ඔබගේ දේශනා ද හොඳින් සූදානම් කරන ලෙස ද, සමඟි සන්ධානයේ දේව ප්‍රසාද නිධානය මඟින් පවුකරුවන්ට දෙවියන් වහන්සේ වෙත නැවත පැමිණීමට උපකාර කරන ලෙස ද, රෝගීන්, තනි වූවන් සහ දිළින්දන් රැක බලාගන්නා ලෙස ද මම ඔබෙන් උදක්ම ඉල්ලා සිටිමි. ඒ සැමට වඩා භක්තිවන්තව ද ශ්‍රද්ධාවන්තව ද ඔබ අල්තාරය මත පුදන යාගය, එනම් කල්වාරි යාගය ඔබගේ පූජක පරිත්‍යාගයේ උල්පත කර ගනිමින් පූජාප්‍රසාදිතුමන්ගේ ආරක්ෂක මුනිවරයාණන් වන සාන්ත ජෝන් මේරි වියානි තුමන් කළාක් මෙන් දෙවියන් වහන්සේ සමඟ නිරන්තර ඒකත්වයෙන් සිටින්න. විශේෂාකාරයෙන් මේ වරප්‍රසාදයේ වසර තුළ ඔබගේ මීසම් අලුත් වූ විශ්වාසයෙන් ගිනිලන්න.

විශේෂ අංගයක් ලෙස එක් සෙනසුරාදාවක හෝ ඉරිදාවක ඇතැම් විශාල මීසම්වලට ගොස් විශ්වාස ලක්ෂණයේ සඳහන් මූලික ඇදැහිලි පැහැදිලි කරමින්, මා විසින් ඉදිරිපත් කරනු ලබන කාරණා පිළිබඳව දේවධාර්මික පැහැදිලි කිරීම් අවශ්‍ය සැදැහැවතුන් සමඟ සංවාදයක නිරත වීමට ද මම බලාපොරොත්තු වෙමි.

මෙහි දී මංගලම් කීමේ සිට ස්වකීය ස්වර්ගාරෝපණය දක්වා ද විශේෂයෙන්ම කුරුසිය පාමුලදී ද, තමන් වෙනුවෙන් වූ දේව කැමැත්ත දෙවියන් වහන්සේ කෙරෙහි වූ ගැඹුරු විශ්වාසයෙන් යුතුව බාරගත්තා වූ ස්වර්ගයීය මාතාවෝ අප සැම දෙනාගේම පරමාදර්ශය වෙත්වා ! විශ්වාසය අප ශක්තිමත් කරත්වා !

ඔබ සැමට ජේසු පිහිටයි !

✠ **අති උතුම් මැල්කම් කාදිනල් රංජිත් හිමිපාණෝ,**
**කොළඹ අගරදගුරු**

*2012 සැප්. 14 ක් වූ ශ්‍රී කුරුසියේ මංගල දින කොළඹ අගරදගුරු මැදුරේ සිට ලියමි*

දැල්වෙන පහන්

# දේව ඇරියුමට සවන් දුන් අක්කා නගෝ

සමිඳු සේවයට කැපවූ මේ අක්කා නගෝ දෝනියන් දෙදෙනා අපට මුණගැසුනේ තුඩැල්ල දිසාවට අයත් බෝපිටිය පුල්ලුහේන නමැති සුන්දර ගම්මානයෙන්. ශාන්ත නිකුලා මුනිවරයාට කැපවූ බෝපිටිය දේවස්ථානයේ ඉතිහාසය වර්ෂ 1837 තරම් ඈතට විහිදී යනවා. අදටත් මෙම දෙව්මැඳුරට යාබදව පිහිටා ඇති ප්‍රාතිහාර්යාත්මක නාන ළිඳ සැදැහැවතුන් අතර ප්‍රකටයි.

මීට අවුරුදු 49 ට පෙර එවන් පිටිසර ග්‍රාමයකින් සොහොයුරියන් දෙදෙනකුම සසුන්ගතවීම අහඹු සිදුවීමක්. මෙම උදාර පරිත්‍යාග කරමින් ශුඬවූ පවුලේ පැවැදි නිකායට තම දෝනියන්දෑ දෙදෙනකුම බාරදුන් ඒ පිංවත් දෙමාපියන් ගැන මුලින්ම කතා කරමු. පියා ඇස්. ඩී. ජේම්ස් අප්පුහාමි, මව එච්. සිසිලියා පොන්සේකා, මේ වාසනාවන්ත දෙමාපියන් අද ජීවතුන් අතර නොසිටීම නම් අවාසනාවක්. එහෙත් සමිඳු මිදි උයනේ සේවය සඳහා යෑමට අවසර දෙමින් තමන්ගේ පෙරමඟ සැකසූ එම දෙමාපියන් අදටත් මෙම අක්කා නගෝ දෙදෙනා සිහිපත් කරන්නේ හද බැඳි අවංක ආදරයකින්. දරුවන් දෙදෙනකුම එකවර අහිමි කර ගැනීමට තරම් ත්‍යාගිවන්තවූ තම දෙමාපියන් නිසා අද අප ඉතාමත් ප්‍රීතිමත් වාසනාවත් ජීවිතයක් ගත කරන බව මෙම දෙසොහොයුරියන් පැවසුවේ අමන්දානන්දයෙන්.

අප ඉස්සරින් දෙටු දෝනියන් දෑ ගැන කතාකරමු. ඒ සිස්ටර් මාරි ජේම්ස්. ශුද්ධවූ පවුලේ නිකායේ පැවදි සොහොයුරියක් වීමේ බලාපොරොත්තුවෙන් ඇය එම කන්‍යාරාමයට මුලින්ම පා තබා ඇත්තේ 1963 වසරේ. ඊට වසර 3 ට පසු 1966 ජූනි 18 වැනි දා වේදභාරදීම ඉටුකළා.

ගරු මාරි ජේම්ස් (ශු. ප. නි) පැවදි සොහොයුරිය පෙර පාස් අධ්‍යාපනය පිළිබඳ පුහුණුව ලද ඩිප්ලොමාධාරිණියක්. හුරු බුහුටි බහ තෝරන වයසේ දරු දැරියන්ගේ මනස ඉරියව් ගති පැවතුම් මේ හැමකක්ම මනාව හඳුනා ගැනීමේ හැකියාවක් ඇය සතුයි. ඇගේ ජීවිත කාලයෙන් වැඩිහරියක්ම ගෙවිලා තියෙන්නෙ මොන්ටිසෝරි වයසෙහිලා බාලයින් ඇසුරේ. ළමා මනසට ඔබින ගැලපෙන චිත්‍ර අත් වැඩ නිර්මාණයටත් ඇය තුළ තිබ්බෙ සහජ හැකියාවක්. අහරක් ඉහිරක් නැතිව දැනීමක් අත්දැකීමක් නොමැතිව අපේ ගම් දනව්වල ආකර්ශනීය නාම පුවරු යොදාගෙන හතු පිපෙන්නාක් වගේ මතුවන ළදරු පෙර පාසල් ව්‍යාපාරයට




බහින්න පෙර සිස්ටර් මාරිලා වගේ අත්දැකීම් ඇති අයගෙන් උපදෙස් ගත්තොත් අපතේ යන්නෙ නැහැ.

මේ පෙර පාසල් විශේෂඥවරියගේ සේවාව ලබාගත් ස්ථාන හැටියට බම්බලපිටිය, කළුතර, මාරවිල, දියතලාව, වෙන්නපප්පුව, මල්කඩුවාව, කුරුණෑගල, නිකවැරටිය, කටුනායක, මොණරාගල, හඹරන සහ ඇඹිලිපිටිය අපට හඳුන්වා දෙන්න පිළිවන්. කොළඹ 7 ට නෑකම් කියන බම්බලපිටියට වඩා හද්ද පිටිසර ඇඹිලිපිටියෙ පෙර පාසල්වල තත්ත්වය අහසට පොළොව වගෙයි. එවැනි වියළි නිසරු දුෂ්කර මිදි උයන්වලත් සිස්ටර් මාරි සුපුරුදු සිනාවෙන් තම රාජකාරිය ඉටුකළා.

සිස්ටර් මාරිගෙ බාල සොහොයුරිය තමයි සිස්ටර් තෙක්ලා. ඡායාරූපයේ අප දකින විදියට සිස්ටර් මාරි ලෝගු සිස්ටර් කෙනෙක් වුනාට සිස්ටර් තෙක්ලා සාරි සිස්ටර් කෙනෙක්. අක්කට වැඩිය වයසින් බාල වුනාට වැඩ අතින් හරිම ඉහළයි. 1966 ජූනි 18 වැනිදා නිකායීය වේද භාර දීමේ කඩුල්ල පසුකළ සිස්ටර් තෙක්ලා 1973 සැප්. 8 වැනිදා සදාකාලික පොරොන්දු දෙමින් ශුඬවූ පවුල නිකායේ ස්ථිර පැවදි සොහොයුරියක බවට පත්වුණා.

අධ්‍යපනය, පැවදි පුහුණුව හා පරිපාලනය වැනි ක්ෂේත්‍රවල දීර්ඝ කාලීනව නියැලුනු ගරු තෙක්ලා පැවැදි සොහොයුරිය කලා උපාධිධාරිණියකි. දේව කැඳවීම් කෙරෙහි වඩාත් සැලකිලිමත් වෙමින් ඇය ගෙන ගිය පැවදි පුහුණු වැඩ සටහන් හා එම ව්‍යාපෘතිය සාර්ථක ප්‍රතිඵල ලබා දුන් බවද කිව යුතුයි.

සොහොයුරියගේ සේවාවන් නිසා පෝෂණය වු ශුඬවු පවුලේ කන්‍යාරාම ලැයිස්තුවේ වෙන්නප්පුව, කුරුණෑගල, කොල්ලුපිටිය, බම්බලපිටිය, වාද්දුව, බෝලවලාන, හබරණ, රත්තොට සහ මාරවිල යන ස්ථාන විශේෂයෙන් සඳහන් වෙනවා. ඕනෑම තරුණියකට සිස්ටර් කෙනෙක් වෙන්න බාධාවක් නැහැ. මඩමකට කන්‍යාරාමයකට යන්නත් පුළුවන්. ඉගෙන ගෙන වේදභාර දෙන්නත් පුළුවන්. ඊට පස්සෙ ලෝගුවක් අඳින්නත් පුළුවන්. හැබැයි ඊට පස්සෙ හැමදාම ලෝගුවෙම ඉන්න ඕන. ඒ දවස්වල කේ. ප්‍රැන්සිස් මගේ මිත්‍රයා 'සිස්ටර් ලූසී ලෝගු ඇරිය' කියල පොතකුත් ලියල තිබුණා මතකයි. හැබැයි මේ අක්ක නගෝ දෙන්නා සිස්ටර් මාරි සහ තෙක්ලා 1963 ඉඳල අද මේ දක්වා අවුරුදු 49 ක්ම සිස්ටර් ලෝගුවෙම ඉඳලා තියෙනවා. විශ්‍රාමිකව සිටියත් දෙදෙනාම තවමත් පුළුවන් හැටියට සමිඳු සේවාවල නිරත වෙනවා. ඒකයි වටින්නෙ.

එනිසාම අපි හැමෝම මේ දෙසොහොයුරියනට දීර්ඝායුෂ පතමු. සමිඳු සරණ ප්‍රාර්ථනා කරමු.

**මොරිස් බොල්ලෑගල**

## කළුතර නාගොඩ සුරදූතික කන්‍යාරාමයේ

# ස්වර්ණ ජයන්ති උලෙළ




ශ්‍රී ලංකාවේ දේශීය පැවදි නිකායක් වන සුරදූතික නිකායික පැවදි සොයුරියෝ කළුතර නාගොඩ කන්‍යාරාමය අරඹා වසර 50 ක් සපිරීමේ සැමරුම් උලෙළ පවත්වති. කළුතර පදිංචි ධනවත් කාන්තාවක වූ ස්ටෙලා ඕර් මෙනවියට නාගොඩ, කටුකුරුන්ද 'ඕර් නෝන්' වතුයාය ඉතා විශාල වු ඉඩමක් සතුවු අතර එය කතෝලික සභාවට පරිත්‍යාග කිරීමට ඇය කටයුතු කළාය. කළුතර ප්‍රදේශය අවට නිවෙස් ඉදිකිරීමට බලාපොරොත්තුවෙන් සිටි ජනයාට එම ඉඩම් කොටස් කර සහනදායි මිලකට අලෙවි කිරීමට එවකට අගරදගුරු අතිඋතුම් තෝමස් කූරේ හිමිපාණෝ කටයුතු කළහ. තවද මිනිසුන්ට සේවාවක් සැපයීමේ අරමුණින් විශාල ඉඩ කොටසක් වෙන්කර තැබුණි. කතෝලික පාසල් රජයට පවරාගත් මේ සමය තුළ අධ්‍යාපන කටයුතු අත්හරින ලද, සම්පූර්ණකිරීමට නොහැකි වූ යෞවනියන් සඳහා පුහුණු මධ්‍යස්ථානයක් ආරම්භ කිරීම අගරදගුරු හිමිපාණන්ගේ සිතේ තිබුණු අදහසකි. සිහිනයකි. එය මල්ඵල ගන්වමින් එම සිහිනය යථාර්ථයක් බවට පත් වුනේ, එවකට අගරදගුරු පදවි භාණ්ඩාගාරික ගරු ජෝශප් ප්‍රනාන්දු පියතුමන්ට මේ කටයුතු පවරා සාර්ථකව නිමකිරීමෙනි.

මේ අපෝස්තලික සේවාව ආරම්භ කිරීම සඳහා කළුතර නාගොඩ ප්‍රදේශයට පැමිණීමට සුරදූතික නිකායික පැවදි සොයුරින්ට ඇරියුම් කරන ලද අතර එවකට සුරදූතික නිකායික ශ්‍රේෂ්ඨාධිපතිනි ගරු මාර්ටිනා පැවදි සොයුරිය එය පිළිගත්තාය. 1962 අගෝස්තු 15 කන්‍යාරාමයත්, පුහුණු ආයතනයත් ආසිරි ගන්වා සුරදූතික රාජේශ්වරියගේ අප ස්වාමි දූ නමින් කැපකරන ලදි. ගරු හයිසින්ත් ප්‍රනාන්දු ප්‍රධාන පැවදි සොයුරිය සමගින් සොයුරියන් කිහිප දෙනකුන් විසින් මෙහි සේවාවක් ආරම්භ කරන ලදී.

ගෙවුණු 50 වසරක සේවා කාලය පිළිබඳව කළුතර නාගොඩ සුරදූතික කන්‍යාරාමයේ ප්‍රධාන මව්තුමිය ගරු රෝසරි ගුණවර්ධන පැව්දි සොයුරියට ප්‍රදීපයට මෙසේ පැවසුවාය. 25 බැගින් වූ කණ්ඩායම් දෙකකින් සමන්විත දැරියන් පිරිසකට නේවාසික පහසුකම් සැපයීමට මෙම කාර්මික මධ්‍යස්ථානයේ ඉඩ ප්‍රමාණවත් වූ අතර ඔවුනට කෘෂිකර්මාන්තය, සත්ව පාලනය හා අත්කම් පිළිබඳව දෙවසරක පුහුණුවක් ලබා දෙන ලදි. මෙම දැරියන්ගේ මෙන්ම පැවදි සොයුරියන්ගේ ද නඩත්තුව සඳහා අවශ්‍ය වූ මූල්‍යමය ප්‍රතිපාදන සපයා ගැනීමට සිදුවූයේ අත්කම් හා ගොවිපල ආශ්‍රිත නිපයුම් අලෙවි කිරීමෙනි.

සාමාන්‍යයෙන් කන්‍යාරාමයක් තනනුයේ මීසමකට අනුයුක්ත දේවස්ථානයකට නුදුරුවය. එහෙත් ඉතා සැඟවුණු ප්‍රදේශයක දලු ලා වැඩුණු මෙම කන්‍යාරාමයේ විශේෂත්වය වනුයේ නව මීසමකට උපත දීමට උත්ප්‍රේරකයක් හා හේතු සාධකයක් වීමේ වාසනා මහිමය හිමි වීම ය. එක් නත්තලක දී පියතුමකු මධ්‍යම රාත්‍රි දේව මෙහෙය පැවැත්වීමට තීරණය කළ අතර ඒ සඳහා කාර්මික පුහුණු මධ්‍යස්ථානයේ ශාලාව ප්‍රමාණවත් විය. කන්‍යාරාමය සමීපයේ ජීවත් වූ පවුල් කිහිපයක් ද දිව්‍ය මෙහෙයට සහභාගි වූහ. මෙය නාගොඩට නව දෙව් මැඳුරක් බිහිවීමේ ආරම්භය ලෙස සැලකිය හැකිය. එතැන් පටන් සෑම ඉරු දින දිව්‍ය පූජාව සමරන ලද්දේ කන්‍යාරාමයේ පෙර සඳහන් කළ ශාලාවේදී ය. පැවදි සොයුරියන් විසින් දහම් පාසල් ඉගැන්වීම ඇරඹුමත් සමඟම ධර්මදූත ළමා සමාජය, වින්සන් ද පාවුලා සමිතිය, තරුණ සංගමය හා කුඩා යාච්ඤා කණ්ඩායම් ආදිය ද මෙහෙයවීම සිදුවිය. මෙමගින් නව දේවස්ථානයට අයත් මෙම කතෝලික පිරිසට සාමුහිකව එකිනෙකාට සම්බන්ධ වෙමින් ස්ව අනන්‍යතාව ගොඩනගා ගැනීමට සහය වීමට හැකි විය. සුරදූතික සොයුරියන් විසින් විසිපස් වසරක අඛණ්ඩව සිදු කළ මෙම සත්කාරක සේවාව අගයමින් එහි සලකුණක් ලෙස නිකා ආරක්ෂක ශු. මිඛායෙල් අග්‍රදූත තුමන් නමින් කැප වූ කළුතර නාගොඩ නව දෙව්මැඳුර ඉදිවිය. මේ කාලය තුළ ළදරු පාසල ද විවෘත කැරිණ. එලෙසම සිරි කුරුස විදුහලේ ගුරු පත්වීම් ලද පැවදි සොයුරියන් කිහිපදෙනකු ඉගැන්වීමේ කාර්යයේ නිරත වූයේ ද මෙම කන්‍යාරාමයේ සිටය.

කළුතර නාගොඩ මීසම් සේවක ගරු නිර්මාල් මාලක සිල්වා පියතුමා ස්වර්ණ ජයන්තිය සමරන කළුතර නාගොඩ සුරදූතික කන්‍යාරාමයේ සේවාව අගයමින් මෙසේ පැවසීය.

"ඇත්තටම මෙම පැවදි සොයුරියෝ කැපවීමෙන් යුතුව සේවාවක් මේ නාගොඩ දෙව්මැඳුරට සිදුකර තිබෙනවා. මීසමේ කටයුතු වලට ලොකු සහයෝගයක් ලබාදෙනවා. අද පල්ලියක් බිහිවන්න හේතු වූයේ මේ පැවදි සොයුරියන්ගේ ආගමනයයි. කළුතර නාගොඩ නව මීසමක් බවට පත්වූ පසු මොවුන්ගේ සේවාව තවත් පුළුල් වෙලා. නාගොඩට අයිති සපුගහවත්ත, කෙත්හේන, පල්ලේගොඩ දෙව්මැඳුරුවලටත් මොවුන්ගේ සේවාව ලබාදෙනවා. අවංකවම මට මෙය මහත් ශක්තියක් හා ධෛර්යයකි.

**සටහන - කුමර නයනජිත්**

# කිතුනු බවට සාක්ෂි දරන දක්ෂ චරිතාංග නළුවා

ප්‍රසුගිය පාස්කු උත්සවය නිමිත්තෙන් තඹකන්ද කල්වාරි භූමියේදී සිනමා නළු නිළියන් චරිත නිරූපනය කළ පාස්කු නාට්‍යයක් රඟ දැක්විණි. ආගම්භේදයකින් තොරව බෞද්ධ නළුවන් පවා චරිත නිරූපනය කළ මෙම නාට්‍යයේ දක්ෂ සිනමා නළුවෙක්, මෙන්ම සහාය අධ්‍යක්ෂවරයකු වූ බොනිෆස් ප්‍රනාන්දු නායක පූජක තුමකුගේ චරිතයක් නිරූපනය කළේය. සිනමා රංග ධරයෙක් වූ බොනිෆස් ප්‍රථම වරට රඟ පෑ ප්‍රසිද්ධ වේදිකා නාට්‍යය වූයේ මෙම පාස්කු නාට්‍යයය.

තමාට කොතරම් පාඩු සිදු වුනත් අසාධාරණය අයුක්තිය දුටු තැන ඊට එරෙහි වීමේ ශක්තියක් ඇති බොනිෆස් ඔහුගේ හිතවතකු වූ රංගන ශිල්පී 'ගාමිණී ෆොන්සේකා මැරුනා නොවේ. ඔහුව මරා ගත්තා' කියමින් චිත්‍රපට සංස්ථාවට ප්‍රසිද්ධියේ දොස් නැගූ එකම කලාකරුවා, කොන්ද කෙලින් තබාගෙන කථා කළ එකම සිනමා නළුවා බොනිෆස්ය.

කිතුනුවන් වශයෙන් එවන් කිතුනු නළුවකු ගැන අප ආඩම්බර විය යුතුය. එහෙත් O.C.I.C සම්මාන උලෙළ සඳහා ඔහුට ආරාධනා පත්‍රයක්වත් නොලැබෙන බව ඔහු කියයි. එසේම දක්ෂ චරිතාංග නළුවකු වූ ඔහුව ඇගැයුමකට පවා ලක් නොකළේය. එය විශාල වරදකැයි බොනිෆස් කියයි.

කලා කරුවන්ට ඔහු කෙතරම් ආදරේදැයි මාහොඳ හැටි දන්නේ රුක්මණීදේවි මිය ගිය අවස්ථාවේදි පවා ඔහු දිය හැකි උපරිම සහයෝගය දුන් බැවිනි. එසේම රුක්මණීදේවි අනුස්මරණ සංගමය 1989 ආරම්භ කළ අවස්ථාවේ එහි අධ්‍යක්ෂ මණ්ඩලයට පත් වූ ඔහු එහි හතර වසරක් ලබා ඇති රුක්මණීදේවි අනුස්මරණ සංගමයේ උත්සව වලට මේ වසර විසිහතරම සහභාගි වූ බැවිනි. 1934 මීගමුවේ උපත ලත් බොනිෆස් ප්‍රනාන්දු කලාවට ඇති ලැදියාව නිසාම 'බැලසන්ත' නාට්‍යයේ ඔහු රඟ පෑවේ ගැහැනු චරිතයකි. ගැහැනු චරිත පිරිමින් රඟපාන මුල් අවධිය එලෙසිනි. එඩී යාපා සමඟ එල්සි පෙරේරා රඟපෑ 'පිටිසර කෙල්ල' නාට්‍යයේ එඩී යාපා වෙනුවෙන් වේදිකාව පිටුපස සිට 'ලෝකයේ සැප නෑ මට,



එනු දයා' ගීතය ගායනා කළේ බොනිෆස් ප්‍රනාන්දුය.

මීගමුවේ දක්ෂ ගීත ප්‍රබන්ධකයෙක්, කථා සහ දෙබස් රචකයෙක් ලෙස සිනමාවට විශාල සේවයක් කළ බෙනදික් ප්‍රනාන්දු කලා ශිල්පියාගේ ඉල්ලීම මත මිතුරන් කිහිප දෙනෙකු සමඟින් කඳානේ එස්. පී. එම් චිත්‍රාගාරයට ගිය බොනිෆස් ඇතුළු පිරිස 'රම්‍යලතා' චිත්‍රපටයේ දර්ශණයකට පෙනී සිටියේය. බොනිෆස් පවසන අන්දමට සිනමා පිස්සුව වැළඳුනේ එම දර්ශනයට පෙනී සිටීමෙනි. ඉන්පසු එම චිත්‍රාග ාරයේම කැමරා ගත කෙරුණු 'සොහෝයුරෝ' චිත්‍රපටයේද පෙනී සිටීමේ අවස්ථාව ලැබිණි.

පාසලෙන් අස්වීමෙන් පසු මීරිගම සිනමා හලක බොනිෆස් සේවය කරමින් සිටියදී එහි කළමනාකරුවූ චාර්ලස් පෙරේරා මහතා ඔහුට ලිපියක් දී එය රොබින් තම්පෝට දෙන ලෙස කීවේය. එහි ප්‍රතිඵලය සාර්ථක විය. 1959 සැප්. 11 තිර ගත කරන ලද 'සිරිමලි' චිත්‍රපටයේ ප්‍රධාන චරිතය නිරූපනය කළේ බොනිෆස් ප්‍රනාන්දුය. ඒ දිනවල සිනමා නළුවකුට තිබිය යුතු රැලි කොණ්ඩය, උඩ රැවුළ ඔහුට නොඅඩුව තිබිණි. 'සිරිමලි' චිත්‍රපටයේ රඟ පෑමෙන් පසුව ඔහුට වෙනත් නිෂ්පාදකවරු, අධ්‍යක්ෂවරුන්ගෙන් රඟ පෑමට ආරාධනා ලැබුණද ඒවාට යෑමට ඔහුට නොහැකි විය. ඊට හේතුව ඔහු ස්ථිර වැටුපක් ලබන නළුවෙක් ලෙස එම සමාගමට බැඳී සිටීම නිසාය.

රොබින් තම්පෝගේ පියා ඩබ්ලිව්. එම්. එස්. තම්පෝය. මේ දෙදෙනාගේම චිත්‍රපටවල ප්‍රධාන නළුවා බොනිෆස්ය. සුවිනීත ලාලනි, සුහද දිවි පිදුම, සුදු සඳේ කළුවලා සුලලිත ශෝභනී, සැමියා බිරිඳගේ දෙවියාය, සමාජෙ අපි ඔක්කෝම සමානයි. සතුටු කඳුළු රඟ පෑමෙන් පසු ඔහුට අභියෝගාත්මක චරිත නිරූපණයක් ලැබුණි. (කේයස්) සාගර පලන්සූරියගේ 'සුදෝ සුදු' කථාවේ ටිකිරි අයියා චරිතයයි.

1968 ඔක්. 23 තිරගත කරන ලද 'දෙහදක දුක' සහ 1969 තිරගත කරන ලද 'පික්පොකට්' චිත්‍රපටයෙත් සහාය අධ්‍යක්ෂවරයා වූයේ බොනිෆස් ය. රොබින් තම්පෝගේ චිත්‍රපට කිහිපයකට දෙබස් රචනා කළේත් බොනිෆස්ය. සැඟවෙන සෙවනැල්ල, මහදැනමුත්තා, සැනසිලි සුවය, ළයට ළය. රුහුණු කුමාරි, සුළි සුළං අද මෙහෙමයි, සුරේකා ළසඳා. කලියුග කාලේ, ආදරෙයි මං ආදරෙයි, ටිකිරා, අප්සරා, ජීවන කඳුළු. ශිරානි රජෙක් වගේ පුතෙක්, විජයග්‍රහණය. වසන්තයේ දවසක් ඇතුළු චිත්‍රපට ගණනාවක ඔහු පෙම්වතෙක් ලෙසින් ආරම්භ කර දුෂ්ඨයා, වැඩිහිටියා දක්වා විවිධ චරිත නිරූපනය කරමින් තමා චරිතාංග නළුවෙක් බව ප්‍රකට කළේය.

විජිත මල්ලිකා, ක්ලැරිස් ද සිල්වා. සුජාතා විජේසේකර, සුවිනීතා විරසිංහ, ලීනා ද සිල්වා වැනි සිනමාවේ දක්ෂ ප්‍රසිද්ධ නිළියන් සමඟ රඟපෑමේ වාසනාව බොනිෆස්ට තිබිණි. රඟපාන චරිතය කුමක් වුවත් කැපවීමෙන් ඒ වෙනුවෙන්ම සාධාරණය දුටු කළ නළුවෙකි බොනිෆස්.

**හෙන්රි ප්‍රියශාන්ත මෙන්දිස්**

## සිරිලක දොළොස්වන... 1 පිටුවෙන්

එහිදී කතා කළ මඩකලපුව රදගුරු අති උතුම් පොන්නයියා ජෝශප් හිමිපාණෝ ආදරය, මෛත්‍රිය, කරුණාව, සහෝදරත්වය මුල් කරගනිමින් නව රදගුරු පදවිය ගොඩනගනට සැම සියලු දෙනා එකමුතුව අත්වැල් බැඳ ගනිමු යැයි ඇරියුම් කළහ.

මෙම උත්සවයේ මුලසුන හෙබවූ ශ්‍රී ලංකා අපෝස්තලික තානාපති අති උතුම් ජෝශප් ස්පිටෙරි අගරදගුරු හිමිපාණන් විසින් රදගුරු යෂ්ඨිය පිළිගැන්වීම, නව රදගුරු හිමි අසුන් ගැන්වීම හා අති උත්තම සොළොස්වන බෙනඩික්ට් ශුද්ධෝත්තම පියාණන්ගේ නිල ප්‍රකාශය කියවීම ද සිදු කරන ලදි.

මේ උත්සවයේ දී පුරා වසර 29 ක් මඩකලපුවට මහත් සේවාවක් කළ අති උතුම් කිංස්ලි ස්වාමිපිල්ලෙයි රදගුරු හිමිපාණන්ට ස්තුති කළ අතර එතුමාණන්ගේ ඉල්ලීම මත පදවිය බෙදීමේ තීරණය ශුද්ධෝත්තම පියතුමා ගත් බව ද ප්‍රකාශ විය. උළෙලට කතෝලික රදගුරු මඬුල්ල ද එක්වූ අතර නිකායන්හි පියතුමන්, ත්‍රිකුණාමලය හා මඩකලපුව පදවි පියතුමන්, ගිහි පැවදි විශාල පිරිසක් ද සහභාගි වූහ.

## දරුවන් බේරාගනිමු.... 3 පිටුවෙන්

ඇති නීති ලිහිල් කරමින් දැලේ හිල් ලොකු කර ඇති අවස්ථා අපි දකිමු.

පසුගිය වසර 6 තුළ මොනතරම් දරු දැරියන් මේ අගාධයේ වැටී ඇද්ද? එය වරෙක දුප්පත්කම නිසා වන්නට පුළුවන්. තවත් වරෙක දේශපාලනයෙන් හම්බකර ගත් ධනය තුළ තම මෝරා ඇති තෙල් මන්ද පිරිපහදු කර ගැනීම සඳහා වන්නට පුළුවන, එසේත් නැතිනම් පළිගැනීම සඳහා වන්නට පුළුවන්. මේ කොයි ආකාරයෙන් විමසා බැලුවත් දිනෙන් දින තත්ත්වය උග්‍ර අතට හැරී ඇත. මේ අප දකින්නේ ඉතාම සීමිත අපචාරයන් කිහිපයක් පමණි. සැඟවුණු දෑ බොහෝය. ඒ අනුව රටේ දරු පරපුරේ අනාගතය සුබ එකක් නොවනු ඇත. වහාම සියලු පාර්ශවයන්ගේ අවධානය දරුවන් වෙත යොමුකොට මේ සිදුවන කණගාටුදායක තත්ත්වය පාලනය කරන්නට පෙරමුණ ගත යුතුය. ළමා රක්ෂණ අධිකාරියේ පූර්ණ මැදිහත් වීමෙන් ග්‍රාම නිළධාරි වසම දක්වා විහිදි යන ළමා රක්ෂණ කමිටු සක්‍රිය කිරීම ඉතා වැදගත්ය. එලෙසම අවුරුදු 18 අඩු දරුවන් සඳහා රටේ පවත්නා නීතිරීති කාලීනව වෙනස් කරන්නට අවශ්‍යව ඇත. එසේ නව නීති පැනවීමේ දී විශේෂයෙන්ම ආගමික නායකයින් සිවිල් සංවිධාන, පාර්ලිමේන්තුව, පළාත් පාලන නියෝජිතයින් හා අදාල නිළධාරින්ගෙන් සමන්විත කමිටුවක උපදෙස් ලබා ගැනීම ඉතාම වැදගත්ය. එය එතැනට පමණක් නොව ග්‍රාම නිළධාරි වසම දක්වා ගමන් කරන ළමා ආරක්ෂන කමිටු වල අධීක්ෂණ මණ්ඩලයක්ද විය යුතුය.

ආයුධ සන්නද්ධ මැරයන් රටපුරා සැරිසරයි. ස්ත්‍රී, ළමා දූෂකයෝ අපරාධ කර දින කිහිපයකින් ඇප ලබා පැමිණ විවිධ බලපෑම් මත තම නිර්දෝෂී බව කියන්නට සැරසෙයි. දේශපාලන නායකයින් ඔවුන් ආරක්ෂා කරයි. ගංජා, අබිං, කසිප්පු, රා ඇතුළු විවිධ මත්පැන්, මත්ද්‍රව්‍ය අලෙවිකර කෝටි ගණන් මුදල් උපයාගත් මලපොතේ අකුරක් නොදත් සමාජ විරෝධීන් පොලිසියට බලපෑම් කරන්නේ කාගේ හයියෙන්ද? මේවා මෙසේ වන්නේ ඇයි? 17 වන සංශෝධනය ප්‍රකාර පොලිස්, අධිකරණ හා මැතිවරණ කොමිසන් කෝ? ඒවා නැතිව දක්ෂ පොලිස් නිළධාරීන් මහත් අසීරුතාවකට පත්ව ඇත. ජනතාව අන්ද මන්ද වී ඇත. මේ තත්ත්වය වහාම පාලනය නොකළොත් රටට වන විපත මහත්ය. එදා අප, ගැමි වහරේ තිබූ පරිදි 'රාලේ දත මැද ගෙට ගන්' යන්න මෙනෙහි කරන විට අපට කියන්නට ඇත්තේ 'අම්මාවරුනේ කෙල්ල අටුවටම ගන්' යන්නයි. වරද වරද ලෙස පිළිගන්නට අපේ රටේ වගකිව යුත්තන් අකමැතිය. මේ වන දේවල් වෙන රටක සිදු වූවානම් වගකිව යුත්තන් ඉල්ලා අස් වෙලාය.

සියල්ලම දේශපාලනය මත යැපෙන්නන් වන මේ රටේ සියලුම දේශපාලන පක්ෂවල නායකයින් වෙත ද වගකීමත් ඇත. එනම් විවිධ අකටයුතුකම් වල යෙදී ධනය උපයා ගත් අයට බලය ලබාගන්නට තම පක්ෂය තුළ ඉඩකඩ ලබානොදිය යුතුය. කොටින්ම සමාජ විරෝධීන්ට නාම යෝජනා නොදිය යුතුය. මෙවැනි දේ කළ වුන් පක්ෂයෙන් පමණක් නොව තනතුරු වලින්ද පලවා හරින බව ශ්‍රී. ලං. නි. ප මහ ලේකම් තුමා පවසා ඇත. නමුත් අතීතයේ එසේ වී නොමැත. එහෙත් එය ඔවුන්ට කරන්නට අවස්ථාව පැමිණ ඇත. අන් පක්ෂ වලද සියලුම නායකයින් මේ පිළිබඳව තම අවධානය යොමු කළ යුතුය. එපමණක්නොවඑම සමාජවිරෝධින්ට ආගමික නායකයින් ආශිර්වාද කරන්නේ නම් එය මේ රටේ දරු පරපුරට කරන අපරාධයකි. අවසාන වශයෙන් සඳහන් කළ යුත්තේ අප රටේ දරුවන්ගේ අනාගතය යහපත් කරන වැඩ පිළිවෙළකට යා යුතුය. මේ සඳහා සමස්ත දරු පරපුර ගැන අවධානය යොමුකර සියලු පාර්ශවයන්ට සුගතියක් වන සැලසුම් ගත වැඩපිළිවෙළකට නීතිය ශක්තිමත් කර ගමන් කරන්නට හැකි උත්තරීතර මණ්ඩලයක උපදේශන හා මඟපෙන්වීම ලබා ගන්නට අවැසි කාලයයි. ඒ තුළ අද සමාජය ගමන්කරන බොහෝ ප්‍රශ්න වලට විසඳුම් ඉදිරියේ ලැබෙනු ඇත. තමන්ගේ දරුවාට මෙන්ම අනුන්ගේ දරුවාට ද මුළු හදවතින් ආදරය කරන සමාජයක් ගොඩනගමු.




හපුගොඩ මීසමේ ජ්‍යෙෂ්ඨ පුරවැසි කමිටුව වාර්ෂිකව පවත්වන විනෝද චාරිකාව මෙවර නුවර අම්පිටියේ දෙව්සත්හල නැරඹීමටත් පේරාදෙණියේ උද්භිද උද්‍යානය නැරඹීමටත් ගියෝය. නුවර අම්පිටිය දෙව්සත්හලේ දී ගරු බොනිෆස් මැන්දිස් පියතුමා, ජ්‍යෙෂ්ඨ පුරවැසි කමිටුව සමඟින් සේයාරුවකට මුහුණ දුන් අයුරු. **(ක්‍රිස්ටෝපර් සිල්වා)**

# පැවදි දිවියේ 60 වන සංවත්සරය

රාගම දියගල ළමා නගර ව්‍යාපෘතියේ ආරම්භක සහෝදරතුමකු වන ගරු පිලිප් සහෝදරතුමාගේ පැවදි දිවියේ 60 වන සංවත්සර උත්සවය, පසුගියදා දියගල ළමා නගරයේ දී පැවැත්විණි.



එදින තුති පිදීමේ දිව්‍ය යාගය පැවැත්වීමට පෙර දියගල ළමා නගර සිසු දරුවන්, ආදි සිසුන් සහ සුභ පතන්නන් රැස්ව එතුමා පිළිගෙන දේවස්ථානය කරා කැඳවාගෙන යන අයුරු සේයාරුවෙන් දිස්වේ. මෙම උත්සවයට ගිහි පැවදි විශාල පිරිසක් සහභාගි වූ අතර පසුගියදා පැවදි දිවියේ වසර 50 ක් සනිටුහන් කළ කඳාන ද මැසිනොද් විදුහලේ උසස් පෙළ භාරව කටයුතු කරන ගරු ජෝර්ජ් ද සිල්වා සහෝදරතුමාගේ සේවය ද ඇගයීමකට ලක් කෙරිණි. මෙම තුති පිදීමේ දිව්‍ය යාගයට ගරු ස්ටේන්වෝල් පියතුමා ද සහභාගි විය.

**(සටහන - දියගල ළමා නගර වාර්තාකරු)**

# නාගොඩ නව මීසමේ පවුල් බැහැදැකීමක්!

නව මීසමක් බවට පත් වූ කළුතර නාගොඩ ශු. මිඛායෙල් අග්‍රදූත දෙව්මැඳුරට අයත් සැදැහැවතුන් සොයා යමින් නිවෙස් බැහැදැක, තොරතුරු රැස්කරමින් පවුල් පොත් සැකසීමේ වැඩපිළිවෙලක් දියත් කර ඇත.

මේ සඳහා අම්පිටිය ජාතික දෙව්සත්හලේ ගරු සහෝදරතුමන් පස්දෙනෙක් ඉතා කැපවීමෙන් එක්වූහ. මෙහිදී නාගොඩ මීසමට අයත් පිලමිනාවත්ත, හර්මන්වත්ත, පයාගල වත්ත, ක්‍රෝඩන් වත්ත, කුරුඳුවත්ත, පහන් වත්ත, පැපිලියාන වත්ත හා තුඩුගල වත්ත බැහැදැකීම සිදුකෙරිණි.

මීසම් සේවක ගරු නිර්මාල් මාලක සිල්වා පියතුමාගේ අනුශාසකත්වයෙන් මීසමේ සැදැහැවතුන්ගේ නොමසුරු උදව් උපකාරයෙන්, කළුතර, නාගොඩ, සුරදූතික කන්‍යාරාමයේ ගරු පැවදි සොයුරියන්ගේ සහයෝගයෙන් මෙම කටයුතු සාර්ථකව සංවිධානය කෙරිණි. **(කුමර නයනජිත්)**

# පූජකවරයේ රජත ජයන්තිය සමරන ගරු කැලිස්ටස් පෙරේරා පැ.තු.නි. පියතුමා



තෝප්පුව මීසමට අයත් බම්බුකුලියේ උපන් ගරු කැලිස්ටස් පෙරේරා පැ.තු.නි. පියතුමා, මග්ගොන ප්‍රැන්සිස්කන් පුහුණු ආයතනයෙන් පුහුණුව අරඹා වර්ෂ 1970 දී ප්‍රැන්සිස්කන්වරයකු ලෙස ප්‍රථම වේද භාර ගන්නා ලදි. වර්ෂ 1982 දී කැලණිය විශ්ව විද්‍යාලයෙන් ශාස්ත්‍රවේදී උපාධිය ලත් මෙතුමා මීගමුව සා. මරියා විද්‍යාලයේ මෙන් ම මොරටුව සා. සෙබස්තියන් විදුහලේ ද ගුරුතුමකු ලෙස සේවය කළේය. වර්ෂ 1986 දී අප පැ.තු.නි. ප්‍රන්සිස්කන් ප්‍රාදේශිකයේ දෙවන පියතුමා ලෙස පූජකවරය ලැබූ ගරු කැලිස්ටස් පෙරේරා පියතුමා තම පූජක දිවියේ රජත ජයන්තිය පවත්වන මේ මොහොතේ අපි සුබ පතමු.

එතුමා තම පැවදි දිවියේ 42 වන වසර හා පූජක දිවියේ 25 වන වසර පසු කරන මේ මොහොතේ එතුමාගෙන් ශු. සභාවට මෙන්ම අප පැවදි නිකායට ද සිදුවූ සේවය අනර්ඝය. ලංකා අප ස්වාමිදූ අප ප්‍රන්සිස්කන් පැ.තු.නි. ප්‍රාදේශිකයේ ප්‍රාදේශාධිපතිතුමා ලෙස ද, භාණ්ඩාගාරික, අනුශාසක, නවතාපසගුරු, පැවදි පුහුණුව ඇතුළු විවිධ නිලතල දරමින් ද ඇමරිකා එක්සත් ජනපදයේ මිනිය පොලිස්හි මීසම් සහයක, මීසම් සේවක පියතුමා මෙන්ම බෝලවලාන, වැලිහේන හා වැලිවේරිය මීසම්හි මීසම් සේවක පියතුමා ලෙසද කටයුතු කර ඇති මෙතුමා දක්ෂ දේශනාවාදී පියතුමෙකි.

නිරන්තරයෙන් ම නිහැඬි සේවය අගය කරන මෙතුමා කෘෂිකාර්මික කටයුතු වලට ඉමහත් ලැදියාවක් දක්වයි. දැනට හලාවත සා. අන්තෝනි ආරාමයේ ශ්‍රේෂ්ඨ පියතුමා ලෙස කටයුතු කරන මෙතුමා අවට මීසම් සේවා කටයුතු වලදී ලබා දෙන සේවය අපි ඉතා අගය කරමු.

# පැවදි දිවියේ ස්වර්ණ ජයන්තිය සමරයි



යහපත් එඬේරා නිකායේ ගරු මේරි ශීලා පෙරේරා පැවදි සොහොයුරිය 2012 සැප්තැම්බර් මස 29 වන දින සිය පැවදි දිවියේ ස්වර්ණ ජයන්තිය සැමරිණි.

මෝදර, ඇත්මඩලගේ තෝමස් පෙරේරා සහ අලුත්දුර ටිල්ඩා මේරි ප්‍රිසිලා දම්පතීන්ගේ කනිටු දියණිය ලෙස 1942 සැප්තැම්බර් මස 03 වන දින උපත ලද මෙතුමිය සහෝදරයන් තිදෙනෙකු සහ සහෝදරියන් දෙදෙනකුගෙන් යුතු පවුලේ සිව්වැනියා වූවාය. සිය මාමා වූ ස්වර්ගස්ථ ගරු ගේබ්‍රියෙල් ගුණසේකර (කාර්මෙල් නිකාය) පියතුමා සහ පුංචි අම්මා වූ ස්වර්ගස්ථ ගරු සෙවරීන් ය.එ. නිකායේ සොහොයුරිය ගරු මේරි ශීලා පෙරේරා සොහොයුරියගේ ඥානමව්පියන් වීම සුවිශේෂී කරුණකි.

නුවරඑළිය සහ කොටහේන යහපත් එඬේරා කන්‍යාරාම යන්හි මූලික අධ්‍යාපනය ලද මෙතුමිය වයස අවු. 16 දී නායකකන්ද යහපත් එඬේරා කන්‍යාරාමයට ඇතුළු වූවාය. එය එවකට මියගොස් සිටි සිය මෑණියන්ගේ ප්‍රාර්ථනය ඉටුවීමක් විය.

ඔන්ජේ විදේශීය විද්‍යාලයේ දී වැඩිදුර අධ්‍යාපනය ලද මෙතුමිය පිලිපීනයේ වසර කීපයක සේවයෙන් අනතුරුව වාලච්චේන, බෝලවලාන, ගම්පොළ, මහනුවර සහ කොටහේන යන යහපත් එඬේරා කන්‍යාරාමයන්ට අනුයුක්තව කැපවුණු සේවාවක නියැලුණාය. කොටහේන කන්‍යාරාමයේ ජ්‍යෙෂ්ඨ සිසුවියන්ට ඉංග්‍රීසි භාෂාව විෂය උගන්වමින් වසර ගණනාවක් ගත කළ ගරු සොහොයුරිය පසුගිය දා ඉන් ඉසිඹු ලැබුවාය.

දැනට තරමක අයහපත් සෞඛ්‍ය තත්ත්වය මත දයා සේවාවන්ට හැකි පමණින් දායක වෙමින් කොටහේන යහපත් එඬේරා කන්‍යාරාමයේ විශ්‍රාම සුවයෙන් පසුවන්නීය.

එතුමියට "ඥානාර්ථ ප්‍රදීපය" පාඨක සහෘදයන් සමඟ දීර්ඝායු සහ දේවාසිරි ප්‍රාර්ථනා කරමු. **(සි. ආර්. ඩික්සන් ඇන්ටනි)**



කොළඹ අගරදගුරු අති උතුම් මැල්කම් කාදිනල් රංජිත් හිමිපාණන් අතින් පූජක වරම් ලැබූ ගරු ඇන්ටන් ශිවන්ත වාස් පියතුමන් සිය කුළුඳුල් දිව්‍ය යාගය සිදුකිරීම සඳහා සිය උපන් ගම වන වෙන්නප්පුවට පැමිණි අවස්ථාවේ මීසම් සේවක ගරු ෆ්‍රැන්ක් තිසේරා පියතුමන් ඇතුළු මීසම් සැදැහැවතුන් විසින් පිළිගෙන දෙව්මැඳුර කරා කැඳවාගෙන ගිය අවස්ථාව

**(සේයා - ජේ. කේ. මයිකල්, සටහන - ප්‍රියන්ත පීටර්ස්)**



කහටවිල සා. විනිෆ්‍රීඩා දෙව්මැඳුරේ වාර්ෂික මංගල්‍යය සලාපුර රදගුරු අති උතුම් දෙව්ශ්‍රිත වැලන්ස් මෙන්ඩිස් හිමිපාණන් පවත්වන ලද අයුරු...මීසම් සේවක ගරු ප්‍රැන්සිස් ලාවුස්, සහයක ගරු කමල් ඩේමියන් , ගරු හැරල්ඩ් ප්‍රනාන්දු යන පියවරු මංගල උළෙලේ දී සහය දැක්වූහ. **(ටෙක්ලා කල්දේරා)**



හිටපු ජ්‍යෙෂ්ඨ ඇමැතිවරයකු වූ විජයපාල මෙන්ඩිස් මහතාගේ අවමංගල උලෙළේ දී කිතුනු ජනතාව නියෝජනය කරමින් උතුරු කොළඹ කලාපීය නාහිමි අතිගරු පැට්‍රික් පෙරේරා පියතුමා සභාව ඇමතූ අයුරු... **(සේයා - ක්‍රිස්ටි ඔස්මන් පෙරේරා)**



මීගමුව සා. මරියා දේවස්ථානයේ 138 වන වාර්ෂික මංගල්‍යය හා මීසම් පුතකු වන ගරු සික්ස්ටස් කුරුකුලසූරිය පියතුමාගේ පූජක දිවියේ 50 වන ස්වර්ණ ජයන්ති මංගල්‍ය සැමරීම සිදුකෙරිණි. මෙම දිව්‍ය යාගය සඳහා විශ්‍රාමික අගරදගුරු අති උතුම් නික්ලස් මාකස් හිමිපාණන් ද, පියතුමන් ඇතුළු පැවදි සොහොයුරියන් ද, මීසම් වාසී විශාල සැදැහැවත් ජනතාවක් ද සහභාගි වූහ. මීගමුව මහවීදිය මීසම් සේවක ගරු ශ්‍රියානන්ද ප්‍රනාන්දු පියතුමාගේ උපදෙස් මත මීසම් සභාව මංගල්‍ය දිව්‍ය පූජාව සංවිධානය කර තිබිණි. **(රේමන් අපොන්සු)**